

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
சிறு தேயிலைத் தோட்ட அபிவிருத்தி அதிகார சபை
Tea Small Holdings Development Authority

වාර්ෂික වාර්තාව
வருடாந்த அறிக்கை
ANNUAL REPORT

2019

අංක 70, පාර්ලිමේන්තු පාර,පැලවත්ත,බත්තරමුල්ල
இலக்கம் 70, பாராளுமன்ற வீதி, பலவத்த, பத்தரமுல்ல
No: 70, Parliament Road, Pelawatte, Battaramulla
දුරකථන අංක தொலைபேசி இலTele : 7909020/21 ෆැක්ස් பெக்ஸ் : 2784925/28
ඊ මේල් ஈ-மெயில Email : gmtshda@gmail.com /aetshda1@gmail.com

දැක්ම

ආර්ථික හා සමාජීය වශයෙන් තිරසාර කුඩා තේ වතු ප්‍රජාවක් බිහිවීම

මෙහෙවර

විශිෂ්ඨතම උපකාරක සේවා සැපයීම

තුලින් කුඩා තේ ඉඩම් අංශයේ

ඵලදායිතාව සහ ගුණාත්මය වර්ධනය කිරීම

සභාපතිතුමාගේ පණිවිඩය

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මුහුණ දී ඇති 2019 පාලන වර්ෂය තදාසන්න වසර කිහිපයක සීට විවිධ අයුරින් අවපාතයට ලක්වූ කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය ප්‍රවර්ධනය සහ ප්‍රබෝධයට අදාලව කණගාටුදායක අවපාතයක් පෙන්වූ වර්ෂයක් ලෙස එකී වර්ෂයට අදාල වාර්ෂික වාර්තාවේ දත්ත මගින් පැහැදිලි වේ. අධිකාරිය සතු භෞතික හා මානව සම්පත් වල ඵලදායිතාවය මෙන්ම අධිකාරිය විසින් ස්වකිය යුතුකම් හා වගකීම් භාරය සෘජුවම හා අප්‍රමාදව ඉටුකළ යුතු කුඩා තේ වතු හිමියා සහ තේ ඉඩම පිළිබඳව වේදනාකාරී අත්දැකීම් රැසකට මුහුණ දුන් වර්ෂයක් ලෙසද මෙම වර්ෂය පිළිබඳව නිර්වචනය කළ යුතුව ඇත.

එමෙන්ම ආයතනික අභ්‍යන්තර පාලනය තුල මූල්‍ය, ආයතන, සංවර්ධන, ව්‍යාප්ති, භෞතික සම්පත් මෙන්ම සැලසුම් හා නියමුකරණ ක්‍රියාවලියද විධිමත් ඵලදායී ප්‍රතිපත්ති රාමුවකින් තොරව ක්‍රියාත්මක කිරීමේ අනිසි ප්‍රතිඵල රාශියක් 2020 මුල් කාර්තුවේදී හඳුනාගැනීමට හැකිවූ අතර ඒ තුළින් දැඩි අවපාතයකට ලක්වූ සේවක පක්ෂයේ වැඩ පරිසරය, ආකල්ප, අධ්‍යාපන හා පුහුණු කටයුතු භාවිතය, මූල්‍ය හා ආයතනික විනය වැඩි සාධනීය මට්ටමකට ගෙන ඒම සඳහා 2020 වර්ෂය තුල වැඩි ප්‍රමුඛතාවයක් ලබා දීමේ අවශ්‍යතාවය මැනවින් පැහැදිලි වේ.

තේ නැවත වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 639 දක්වාද, අලුත් වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 296 දක්වාද, තේ නැවත වගා ප්‍රතිශතය 0.63% දක්වාද , කණ්ඩායම් වැඩසටහන් සංඛ්‍යාව 4575 දක්වාද මෙහෙයුම් පිරිවැය (ප්‍රාග්ධන රුපියලක් සඳහා) ශත 65ක් දක්වාද වාර්තා වීමේ තදාසන්න වර්ෂ තුල වැඩිම අවපාත ලක්ෂණයන් පෙන්වූ වර්ෂයක් ලෙසද මෙම වර්ෂය සඳහන් කළ හැක.

රජය මගින් ක්‍රියාත්මක අතිගරු ජනාධිපතිතුමාගේ සෞභාග්‍යයේ දැක්ම ප්‍රතිපත්ති ප්‍රකාශනයේ වැවිලි අමාත්‍යාංශය සහ කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විෂයානුබද්ධව භාර රාජ්‍ය අමාත්‍යාංශය සහ සහබද්ධ රාජ්‍ය ආයතනයන් හා එක්ව වසර 05 ක් තුල ශ්‍රී ලංකාවේ තේ භූමිකාව උසස් ස්ථානයක ප්‍රතිනිර්මාණය කිරීම සඳහා එතෙක් පැවති මෙම භානිකර ලක්ෂණයන් බැහැර කරගනිමින් යහපත් පරිවර්තනයකට දැඩි කැපවීමෙන් උත්සහ දැරිය යුතුව ඇත. තේ කර්මාන්තයට අදාල රජයේ ජාතික ඉලක්ක වලට සමගාමීව අප අධිකාරිය තුල "යළි පිබිදෙන තේ - තේ පුනර්ජීවන අර්ධ දශකය 2021-2025" ලෙස ප්‍රකාශයට පත් කරමින් තේ ඉඩමේ ඵලදායිතාවය වර්ධනය කර එතුළින් කුඩා තේ ඉඩම් හිමි පවුල් ඒකකයද ග්‍රාමීය ආර්ථිකයද බලගන්වමින් ජාතික ආර්ථිකයේ ප්‍රබලතම කොටස්කරුවෙකු ලෙස කුඩා තේ වතු අංශය ප්‍රතිසංවිධානගත ක්‍රියාවලියකට ප්‍රවේශ වී සිටියි.

ඒ සඳහා දැක්මක්, මෙහෙවරක් හා ඉලක්කයක්තුල සියලු ආධාරක පාර්ශ්වයන් සාමූහික හැඟීමෙන් අප්‍රමාදව ගමන් කළයුතු වන්නෙමු. එය සාක්ෂාත් කරගැනීමට අවශ්‍ය ඵලදායීවූද, නව නිර්මාණශීලිවූද පරමාදර්ශී වූ වැඩි පිළිවෙලක් සඳහා අප අධිකාරියේ සමස්ථ නිළධාරී මණ්ඩලය මෙන්ම සහබද්ධ කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානයද සමස්ථ කුඩා තේ ඉඩම් හිමි ප්‍රජාවද එක්ව අත්වැල් බැඳගන්නෙමු.

මහින්ද විද්‍යාපතිරණ
සභාපති

කුඩා තේ ඉඩම් අංශයේ කාර්යඵල දර්ශකය - 2019

	2017	2018	2019
1. කුඩා තේ වතු බිම් ප්‍රමාණය (හෙක්ටයාර)	122,169	122,604	122,900
2. කුඩා තේ වතු ඉඩම් හිමියන් සංඛ්‍යාව	395,414	399,313	400,987
3. කුඩා තේ වතු අංශයේ නිමි තේ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් මිලියන)	232.417	228.049	225.728
4. ජාතික නිෂ්පාදනයට කුඩා තේ වතු අංශය දක්වන දායකත්ව ප්‍රතිශතය	75.5	75.0	75.2
5. සාමාන්‍ය ඵලදායීතාවය (නිමි තේ/(කිලෝ ග්‍රෑම්/හෙක්ටයාරයට)	1,995	1,958	1,938
6. තේ නැවත වගා බිම් ප්‍රමාණය / හෙක්ටයාර (ඳිරිඳිමනා යටතේ)	748	1027	639
7. තේ අළුත් වගා බිම් ප්‍රමාණය /හෙක්ටයාර (ඳිරිඳිමනා යටතේ)	202	435	296
8. තේ නැවත වගා ප්‍රතිශතය (%)	0.75	1.03	0.63
9. භෝග පුනරුත්ථාපනය-පැළ සංඛ්‍යාව (මිලියන)	0.564	0.798	1.921
10. කුඩා තේ වතු සංවර්ධන සමිති			
සමිති සංඛ්‍යාව	1,435	1,460	1,475
සාමාජික සංඛ්‍යාව	329,778	347,425	329,963
11. ව්‍යාප්ති සහ උපදෙස් සේවා			
ඒකපුද්ගල ව්‍යාප්ති සේවා සංඛ්‍යාව	33,373	37,750	12,955
කණ්ඩායම් වැඩසටහන් සංඛ්‍යාව	6,680	6,679	4,575
සහභාගිත්ව ගොවි සංඛ්‍යාව	188,085	175,722	119,506
12. ආයතනයේ මෙහෙයුම් පිරිවැය (සංවර්ධන රුපියලක් සඳහා)	0.52	0.66	0.65
13. තේ පරීක්ෂක ව්‍යාප්ති නිළධාරී: තේ ගොවි අනුපාතිකය	1:2751	1:2958	1:2784
14. අමු දළු කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය දළ මිල රුපියල්	90.69	85.48	80.15

▪ පටුන

- සංවිධාන ව්‍යුහය
  ප්‍රධාන කාර්යාලය සහ හන්තාන පුහුණු මධ්‍යස්ථානය viii
  ප්‍රාදේශීය කාර්යාල ix
- අධ්‍යක්ෂ මණ්ඩලය x - xi
- විගණන හා කළමනාකරණ කමිටුව xii
- විධායක කාර්යමණ්ඩලය සහ පරිපාලන දිස්ත්‍රික්ක කාර්යාලයන් xiii- xvii

ප්‍රධාන සාරාංශය 1-3

1. **වන පරිච්ඡේදය : හැඳින්වීම** 4

1.1. ආයතනය හා කාර්යභාරය 5
1.2. විගණන හා කළමනාකරණ කමිටු කටයුතු 6
1.3. පරිපාලනමය කටයුතු 6-9

2. **වන පරිච්ඡේදය : ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් අංශය** 10

2.1. කුඩා තේ ඉඩම් 11
2.2. කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය 11
2.3. කුඩා තේ ඉඩම් හිමියෝ 11
2.4. කුඩා තේ ඉඩම් සංඛ්‍යාව 11-12
2.5. භූමි වර්ගීකරණය 12-13
2.6. කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය 14-15
2.7. කුඩා තේ ඉඩම් නිෂ්පාදන සංයුතිය 16
2.8. කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය 17
2.9. කුඩා තේ අංශයේ ආයෝජනයන් හා මෙහෙයුම් සමාලෝචනය 18

3. **වන පරිච්ඡේදය : ව්‍යවස්ථාපිත අරමුණු හා සංවර්ධන කාර්යයන්** 19
3.1 ව්‍යවස්ථාපිත අරමුණු හා සංවර්ධන කාර්යයන් 20-21
3.2. මධ්‍යකාලීන ප්‍රතිඵල පාදක ඉලක්ක හා කාර්යඵලය 22-40
3.3. කුඩා තේ ඉඩම්වල ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘති කටයුතු 40-42
3.4 සංවර්ධනාත්මක ප්‍රතිඵල සඳහා ප්‍රධාන කාර්යපාදක දර්ශක 43

4. **වන පරිච්ඡේදය : කුඩා තේ ඉඩම් අංශයේ වගා පිරිවැය හා දළු මිල** 44
4.1. ශ්‍රම පිරිවැය 45
4.2. අමු තේ දළු කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය 45-46
4.3. නිෂ්පාදන ආන්තිකය හා මිල 46
4.4. තේ නැවත වගා කිරීමේ පිරිවැය 47
4.5. දිරිදීමනා අනුපාතිකය හා වගා පිරිවැය (හෙක්ටයාරයකට) 48
  උප ලේඛණ අංක 01-12 49-70
  වාර්ෂික ගිණුම් ප්‍රකාශ හා ශේෂ පත්‍රය 71-82
  විගණකාධිපතිගේ වාර්තාව 83-96

උපලේඛන

අංක		
1	ආයතනයේ අනුමත කාර්ය මණ්ඩලය - 2019	**49-50**
2	ආයතනයේ සේවක සංඛ්‍යා තොරතුරු- 2019	51
3	විධායක නිලධාරී ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම් අනුව කාණ්ඩගත කිරීම	52-56
4	කුඩා තේ වතු අංශයේ තේ නිෂ්පාදනය	57
5	තේ නැවත වගා ආධාර ක්‍රමය පිළිබඳ ක්‍රියාකාරිත්වය	58
6	භෝග පුනරුත්ථාපනය (පාළු සැපයීමේ) ආධාර ක්‍රමය පිළිබඳ ක්‍රියාකාරිත්වය	59
7	තේ අලුත් වගා ආධාර ක්‍රමය පිළිබඳ ක්‍රියාකාරිත්වය	60
8	8-A මවි වගා මගින් නව ප්‍රභේද ටිකිලි හා අතු නිකුත් කිරීම	61
	8-B ආයතනික තේ තවාන් ක්‍රියාකාරිත්වය	62
	8-C_1 වාණිජ තේ තවාන් ක්‍රියාකාරිත්වය - 2018/2019	63
	8-C_2 වාණිජ තේ තවාන් ක්‍රියාකාරිත්වය - 2019/2020	64
9	9-A පිහිටීම මත කොළඹ තේ වෙන්දේසියේ තේ සඳහා මිල	65
	9-B අමු දළු කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය ඇස්තමේන්තුව- 2019	66
10	10-A වගා පිරිවැය ඇස්තමේන්තුව - උස් / මැදි බිම් තේ නැවත වගා හෙක්ටයාරයකට - 2019	67
	10-B වගා පිරිවැය ඇස්තමේන්තුව - පහත් බිම් තේ නැවත වගා හෙක්ටයාරයකට - 2019	68
11	තේ අපනයනය හා විදේශ විනිමය ඉපයීම්	69
12	කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය - 2019/12/31 දිනට ප්‍රගතිය	70

රූප සටහන්

රූප සටහන් අංකය

1	සාමාන්‍ය වැලඳායිතාවයේ වාර්ෂික ප්‍රවණතාවය	8
2	මුළු තේ ඉඩමි ප්‍රමාණයට කුඩා තේ ඉඩමිහි දායකත්වය	11
3	භූමි ප්‍රමාණයමත කුඩා තේ ඉඩමි ව්‍යාප්තිය	13
4	කළමනාකරණ ආයතන අනුව ජාතික තේ නිෂ්පාදන -2019	14
5	කුඩා තේ වතු අංශයේ මාසික තේ නිෂ්පාදනය	15
6	කුඩා තේ වතු අංශයේ වාර්ෂික තේ නිෂ්පාදන ප්‍රවණතාවන්	15
7	7-A තේ නැවත වගා සහනාධාර මුදල වැඩි කිරීම	22
	7-B තේ නැවත වගා සහනාධාර මුදල වැඩිකිරීමට සමගාමීව උඳුරා දැමීම සහ තේ වගාවේ ප්‍රවණතාවය	23
8	නැවත වගා ආධාර සඳහා වාර්ෂිකව අයදුම් කිරීම	23
9	තේ නැවත වගා ආධාර ගෙවීම්හි වාර්ෂික ප්‍රගතිය	26
10	තේ අළුත් වගා සහනාධාර මුදල වැඩි කිරීම	27
11	තේ අළුත් වගා ආධාර ගෙවීම්හි වාර්ෂික ප්‍රගතිය	29
12	භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමයේ ගෙවීම්හි ප්‍රගතිය	32
13	ප්‍රාදේශීය වශයෙන් සමිති ව්‍යාප්තිය	38
14	නිෂ්පාදන ආන්තිකය	45

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

සංවිධාන ව්‍යුහය - ප්‍රධාන කාර්යාලය සහ හන්තාන පුහුණු මධ්‍යස්ථානය



කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක **DMS /1714 V -11** හා **2017.06.22** දිනැති අනුමත කාර්ය මණ්ඩලයට අනුව සකස් කර ඇත.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

සංවිධාන ව්‍යුහය – ප්‍රාදේශීය කාර්යාල



කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS /1714 V -11 හා 2017.06.22 දිනැති අනුමත කාර්ය මණ්ඩලයට අනුව සකස් කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලය

1	සභාපති		දේශබන්දු විජේරත්න දෙවගෙදර මහතා	
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්				
	නම	**තනතුර**	**නියෝජනය**	**දුරකථන අංකය**
2	ඩබ්.එල්.පී. විජේවර්ධන මහතා	සභාපති	ශ්‍රී ලංකා තේ මණ්ඩලය	011-2587814 0112590968
3	ආචාර්ය මොහාන් අබේරත්න මහතා	සභාපති	ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය	052-2258201
4	එම්.පේ.එස්. රවිසිංහ මහතා	අධ්‍යක්ෂ (සංවර්ධන)	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය	011-2186160
5	ටී.වී. විරසේන මහතා (2019 අගෝස්තු දක්වා)	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	
6	කුමුදු මිගහගේ මහතා (2019.09.19 සිට)	අධ්‍යක්ෂ	මුදල් අමාත්‍යාංශය	011-2484648 071-8246920
7	ජ.ඒ.පේ.කේ. එදිරිසිංහ මහතා	තේ කොමසාරිස්	ශ්‍රී ලංකා තේ මණ්ඩලය	071-4491618 011-2580182
8	ආචාර්ය අයි.එස්.බී. අබේසිංහ මහතා (2019 ජූනි දක්වා)	අධ්‍යක්ෂ	තේ පර්යේෂනායතනය	
9	ආචාර්ය එල්.එස්.කේ. හෙට්ටිආරච්චි මහතා (2019.07.01 සිට)	අධ්‍යක්ෂ	තේ පර්යේෂණායතනය	052-2258201 071-2746483
10	අමර දිසානායක මහතා	තේ කම්හල් හිමියන්ගේ සංගමයේ නියෝජිත	තේ කම්හල් හිමියන්ගේ සංගමය	071-4175592
11	කේ.එල්. ගුණරත්න මහතා	ගරු සභාපති	සමස්ත ලංකා සමිති සංවිධානය	077-7707623
12	රොෂාන් රාජදුරෙයි මහතා	කළමනාකාර අධ්‍යක්ෂ	කැලණිවැලි ප්ලාන්ටේෂන් සමාගම	077-7743457 011-2627700
13	ඩබ්.එම්.එන්. විජේසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂක/සාමාජික		

14	ඩබ්.ටී.කේ. සමරතුංග මහතා	අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂක/සාමාජික	2019 පෙබරවාරි දක්වා	
15	ඩබ්.ටී.ආර්.පී. විමලරත්න මහතා (2019.03.21 සිට)	වෘත්තිය සමිති නියෝජිත	වෘත්තිය සමිති නියෝජිත	077-7006417
16	ජගත් සෙනරත් පතිරණ මහතා	ගරු ලේකම්	සමස්ත ලංකා සමිති සංවිධානය	070-3750550
17	නුවන් විජේසිංහ මහතා	අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂක/සාමාජික		077-7154816
18	වීරතුංග හේරත් මහතා	වෘත්තිය සමිති නියෝජිත	වෘත්තිය සමිති නියෝජිත	071-1926978
19	ඒ.ඒ. ධර්මබන්දු, මහතා	අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂක/සාමාජික		077-7274574
20	ආර්.එස්. ජයරත්න මහතා	අධ්‍යක්ෂ මණ්ඩලයේ නිරීක්ෂක/සාමාජික		071-9281182

2019 වර්ෂයේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වාර 10ක් පවත්වා ඇත.

විගණන හා කළමණාකරණ කමිටුව

	නම	තනතුර	නියෝජනය	දුරකථන අංකය
1	එම්.ජේ.එස්. රවිසිංහ මහතා	අධ්‍යක්ෂ (සංවර්ධන)	වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය	011-2186160
2	ටී.වී. වීරසේන මහතා (2019 අගෝස්තු දක්වා)	අතිරේක අධ්‍යක්ෂ ජනරාල්	මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය	
3	කුමුදු මිගහගේ මහතා (2019.09.19 සිට)	අධ්‍යක්ෂ	මුදල් අමාත්‍යාංශය	011-2484648 071-8246920
4	කේ.එල්. ගුණරත්න මහතා	ගරු සභාපති	සමස්ත ලංකා සමිති සංවිධානය	077-7707623
5	නුවන් විජේසිංහ මහතා	සමිති සංවිධානයේ නියෝජිත		077-7154816
6	එස්.ඩී. කටුවාවලගේ මහත්මිය	විගණක අධිකාරි	විගණකාධිපති දෙපාර්තමේන්තුව (ශ්‍රී ලංකා තේ මණ්ඩලය)	011-2583687

2019 වර්ෂයේ විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් වාර 05 ක් පවත්වා ඇත.

විධායක කාර්ය මණ්ඩලය සහ පරිපාලන දිස්ත්‍රික්ක කාර්යාල

ප්‍රධාන කාර්යාලය
අංක 70, පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල
දුරකථන අංක:- 011-7909020/21

විධායක කාර්ය මණ්ඩලය - ප්‍රධාන කාර්යාලය

සභාපති : දේශබන්දු විජේරත්න දෙවගෙදර මහතා (2019.11.20 දින දක්වා)

සාමාන්‍යාධිකාරී : ඩී.පී. මහිපාල මහතා

ව්‍යාජ්ති අංශය

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාජ්ති) : සි.ජේ.අයි.ටී. ප්‍රනාන්දු මහතා (2019.04.11 දින දක්වා)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (ව්‍යාජ්ති) (වැඩ බලන) : ඩබ්.ටී.ආර්.පී. විමලරත්න මහතා (2019.04.11 දින සිට)

සහකාර කළමනාකරු (ව්‍යාජ්ති) : ප්‍රබුද්ධ පැතුම් විජේසූරිය මහතා

සංවර්ධන අංශය :

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන) : ජේ.එම්.පී. ජයසිංහ මහතා (2019.04.08 දින දක්වා)

නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (සංවර්ධන) : සි.ජේ.අයි.ටී. ප්‍රනාන්දු මහතා (2019.04.11 දින සිට)

කළමනාකරු (සංවර්ධන) : ආර්.ඒ. වෛද්‍යරත්න මහතා

සහකාර කළමනාකරු (සංවර්ධන) : ඒ.ඒ.ඩී.පී. අබේතිලක මහතා

සහකාර ප්‍රාදේශීය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන): ජ.කේ.පි.ඒ. ප්‍රියදර්ශනි මහත්මිය (2019.07.08 දින දක්වා)

සැලසුම් හා නියමුකරණ අංශය

කළමනාකරු (සැලසුම් හා නියමුකරණ) (රාජකාරී ආවරණය). : ආර්.ඒ. වෛද්‍යරත්න මහතා (2019.04.24 දින දක්වා)

කළමනාකරු (සැලසුම් හා නියමුකරණ) : එම්.ඒ. පියසිලි මහත්මිය (2019.04.25 දින සිට)

සහකාර කළමනාකරු (සැලසුම් හා නියමුකරණ)(රාජකාරී ආවරණය) : ජ.කේ.පි.ඒ. ප්‍රියදර්ශනි මහත්මිය (2019.07.07 දින දක්වා)

සහකාර කළමනාකරු (සැලසුම් හා නියමුකරණ) : ඩබ්.ඩී.සී. ක්‍රිෂාන්ති මහත්මිය (2019.08.01 දින සිට)

පද්ධති නිලධාරී (වැඩ බලන) : ජේ.එම්.වී.එන්. මදුරාවෙල මහතා

මුදල් අංශය

කළමනාකරු (මුදල්) : පී.ආර්. ඉන්දික පෙරේරා මහතා

සහකාර කළමනාකරු (මුදල්) : ආර්.ඒ.සී.ඩී.ඩී. ජයතුංග මහත්මිය

සහකාර කළමනාකරු (මුදල්) : ආර්.ආර්.ඩබ්.ඩී. රත්නායක මහත්මිය (2019.05.22 දින සිට)

මානව සම්පත් හා පාලන අංශය

කළමනාකරු (මානව සම්පත් හා පාලන) : හර්ෂාන් ද සිල්වා මහතා

සහකාර සාමාන්‍යාධිකාරී (සේවා) : අමිත පැස්කුවල් මහතා

සහකාර කළමනාකරු (මානව සම්පත් හා පාලන) : ජේ.එම්.එච්.කේ. ජයසුන්දර මහත්මිය. (2019.05.31 දින දක්වා)

සහකාර කළමනාකරු (මානව සම්පත් හා පාලන) (වැඩ බලන) : පී.ජී.අයි. සුරංගිකා මෙනවිය (2019.06.03 දින සිට)

පරිපාලන නිලධාරී	:	සරත්චන්ද්‍ර මුරමුදලිගේ මහතා (2019.03.01 දින සිට)
පරිපාලන නිලධාරී	:	දිපානි අමුණුගම මිය (2019.01.01 දින සිට 2019.08.23 දින දක්වා)
තාක්ෂණික නිලධාරී(කොන්ත්‍රාත්)	:	අශාන් මධුසංඛ මහතා (2019.01.31 දින දක්වා)
තාක්ෂණික නිලධාරී (කොන්ත්‍රාත්)	:	එන්.එම්.පී.පී.එස්. නිශ්ශංක මහතා (2019.04.25 දින සිට)

අභ්‍යන්තර විගණන අංශය

අභ්‍යන්තර විගණක	:	ඩබ්.ඩබ්.ජේ.එල්. ප්‍රනාන්දු මහතා (2019.04.25 දින සිට)
අභ්‍යන්තර විගණක (රජකාරී ඉටුකිරීම)	:	පී.ජී.අයි. සුරංගිකා මෙනවිය (2019.04.24 දක්වා)
අභ්‍යන්තර විගණන නිලධාරී)(රාජකාරී ආවරණය)	:	පී.ජී.අයි. සුරංගිකා මෙනවිය (2019.04.24 දින සිට 2019.06.02 දක්වා)

<u>ගාල්ල ප්‍රාදේශිය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්කය : ගාල්ල</u>
අංක 291, කළුවැල්ල, ගාල්ල
දුරකථන අංක:- 091-7201126/28
ෆැක්ස් :- 091- 2244382 / ඊ මේල් - tshdaga@gmail.com

ප්‍රාදේශිය කළමනාකරු	:	ඊ.ආර්.එස්.ගුණවර්ධන මහතා (2019.04.25 දින සිට)
සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාප්ති)	:	අයි.යූ.එච්. මොහොට්ටි මහතා
සහකාර ප්‍රාදේශිය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන) (රාජකාරී ඉටු කිරීම)	:	ඩී.එල්.සී. සූරියආරච්චි මහතා (2019.07.07 දින දක්වා)
සහකාර ප්‍රාදේශිය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන)	:	ඊ.කේ.පී.ඒ. ප්‍රියදර්ශනි මහත්මිය (2019.07.08 දින සිට)
කලාප තේ සංර්ධන ව්‍යාප්ති නිලධාරී	:	ඩී.එල්.සී. සූරියආරච්චි මහතා
	:	එම්.ටී. අමරරුවන් මහතා
	:	මහින්ද බටගොඩ මහතා (2019.05.02 දින සිට 2019.10.09 දින දක්වා)
	:	එච්.එම්.කේ.පී.බී. හේරත් මහතා (2019.10.10 දින සිට)
කලාප තේ සංර්ධන ව්‍යාප්ති නිලධාරී (වැඩ බලන)	:	කේ.එස්.එස්. දහනායක මහතා
	:	අයි.ඩී.ඩී. කුමාර මහතා
පරිපාලන නිලධාරී	:	එම්.ජී.ඩී.ඒ. පුෂ්පකුමාරී මහත්මිය (2019.01.01 දින සිට)
ගිණුම් නිලධාරී (රජකාරී ඉටුකිරීම)	:	ඩී.ඩී. ප්‍රියන්පිත් මහතා (2018.06.01 දින සිට 2019.05.23)
ගිණුම් නිලධාරී	:	කේ.ඩබ්.ඩබ්. පෙරේරා මහත්මිය (2019.05.24 දින සිට)

<u>මාතර ප්‍රාදේශිය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්ක : මාතර ,හම්බන්තොට</u>
අංක 31, කාලිදාස පාර, මාතර
දුරකථන අංක:- 041-7200799 - 041-7200394/96
ෆැක්ස් :- 041- 2226487 / **ඊ මේල් -** tshdamt@gmail.com

ප්‍රාදේශිය කළමනාකරු	:	ජී.ජී. බන්දුල මහතා
සහකාර ප්‍රාදේශිය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන)	:	සාලිය නාරංගස්පිටිය මහතා
සහකාර ප්‍රාදේශිය කළමනාකරු(ව්‍යාජ්ති) (වැඩ බලන)	:	සාලිය නාරංගස්පිටිය මහතා (2019.10.14 දින දක්වා)
සහකාර ප්‍රාදේශිය කළමනාකරු(ව්‍යාජ්ති)	:	කේ.එච්.එල්. සංජීව මහතා (2019.10.15 දින සිට)
කලාප තේ සංර්ධන ව්‍යාජ්ති නිලධාරී	:	ජේ.එල්. එදිරිසූරිය මහතා
	:	එච්.එම්.කේ.පී.බී. හේරත් මහතා (2019.05.02 දින සිට 2019.10.09 දින දක්වා)
	:	මහින්ද බටගොඩ මහතා (2019.10.10 දින සිට)
	:	එන්. එම්. විජේසිංහ මහතා
පරිපාලන නිලධාරී	:	එන්.වී.පී. පුෂ්පකුමාරි මහත්මිය
ගිණුම් නිලධාරී	:	එච්.එම්.එල්. පුෂ්පකුමාරි මහත්මිය

<u>රත්නපුර ප්‍රාදේශිය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්කය : රත්නපුර</u>
අංක 1/28, නව නගරය, රත්නපුර
දුරකථන අංක:- 045-7201243 - 045-7201904
ෆැක්ස් :- 045- 2228647 / **ඊ මේල් -** tshdarat@gmail.com

ප්‍රාදේශිය කළමනාකරු	:	කේ.ඒ.බී. පත්මරාජා මහතා
සහකාර ප්‍රාදේශිය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන):		එච්.කේ. ලලිත් කුමාර මහතා
සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාජ්ති)	:	පී.එන්. යගමුනි මහතා
කලාප තේ සංර්ධන ව්‍යාජ්ති නිලධාරී	:	පී.ඩී.කේ. බාලචන්ද්‍ර මහතා
	:	එම්.ඒ.අයි. අබේසේන මහතා
කලාප තේ සංර්ධන ව්‍යාජ්ති නිලධාරී (වැඩ බලන)	:	පී.එස්.කේ. පෙරේරා මහතා
පරිපාලන නිලධාරී	:	ආර්.ඩී.සී.කේ. රණතුංග මහත්මිය (2018.05.09 සිට 2019.10.09)
පරිපාලන නිලධාරී	:	ධම්මිකා වෙත්තසිංහ මහත්මිය (2019.10.15 සිට)
ගිණුම් නිලධාරී	:	එම්.ඒ. පියසිලි මහත්මිය (2019.04.24 දක්වා)
ගිණුම් නිලධාරී (වැඩ බලන)		:ඒ.පී.ටී.එන්. සේරසිංහ මහතා (2019.09.09 දක්වා)
ගිණුම් නිලධාරී	:	ඒ.පී.ටී.එන්. සේරසිංහ මහතා (2019.09.10 සිට)

<u>මහනුවර ප්‍රාදේශිය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්ක : මහනුවර, මාතලේ, කුරුණෑගල</u>
අංක 2/7/1, ගන්නොරුව පාර,පේරාදෙණිය, මහනුවර
දුරකථන අංක:- 081-7200827 - 081-7200821
ෆැක්ස් :- 081- 2389011 / **ඊ මේල් -** tshdakan@gmail.com

ප්‍රාදේශිය කළමනාකරු	:	ආර්.ඒ.පී.පී. රණසිංහ මහතා
සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාජ්ති)	:	එම්.ආර්.එන්. ධම්මික මහතා
සහකාර ප්‍රාදේශිය කළමනාකරු (සැලසුම් හා සංවර්ධන): (රජකාරී ඉටුකිරීම)		ඩී.එම්.ආර්.කේ.බී. දසනායක මහතා
කලාප තේ සංර්ධන ව්‍යාජ්ති නිලධාරී	:	ඩී.එම්.ආර්.කේ.බී. දසනායක මහතා
	:	ඩබ්.ජේ.එම්. අරඹේපොල මහතා
	:	පී.පී.පී.සී. විජේසිංහ මහතා
	:	ටී. අමරසේකර මහතා

පරිපාලන නිලධාරී	:	චමිල බණ්ඩාර දිද්දෙනිය මහතා
ගිණුම් නිලධාරී	:	එම්.යූඑල්.ශ්‍යාමලි ප්‍රේමසුන්දර මහත්මිය

නුවරඑළිය ප්‍රාදේශිය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්කය : නුවරඑළිය
නව නගරය , කොත්මලේ
දුරකථන අංක:-052-4930265/ 052-4930247
ෆැක්ස් :-052-2259060 / ප මේල් - tshdane@gmail.com

ප්‍රාදේශිය කළමනාකරු	:	ඩබ්.ටී.ආර්.පී. විමලරත්න මහතා
සහකාර ප්‍රාදේශිය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන)	:	පී.ඒ.එන්. පුෂ්පකුමාර මහතා
සහකාර ප්‍රාදේශිය කළමනාකරු(ව්‍යාප්ති) (රජකාරී ඉටුකිරීම)	:	ඩී.වී.කේ. නන්දසිරි මහතා (2019.03.31 දක්වා)
සහකාර ප්‍රාදේශිය කළමනාකරු(ව්‍යාප්ති)	:	ආර්.ඒ.එස්.රණතුංග මහතා (2019.10.15 සිට)
කලාප තේ සංර්ධන ව්‍යාප්ති නිලධාරී (රාජකාරී ආවරණය)	:	ආර්.ඒ.එස්.එස්. රණතුංග මහතා
කලාප තේ සංර්ධන ව්‍යාප්ති නිලධාරී	:	ඒ.ටී.ඒ. ගුණවර්ධන මහතා
	:	එස්.අයි.යූ.සේනාධිර මහතා
පරිපාලන නිලධාරී	:	එම්.යූ.එස්. වික්‍රමසිංහ මෙනවිය (2019.07.02 දක්වා)
ගිණුම් නිලධාරී	:	එම්. එල්. නාවලගේ මහත්මිය

ඌව ප්‍රාදේශිය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්ක : බදුල්ල, මොණරාගල
නව බදුල්ල පාර, බණ්ඩාරවෙල
දුරකථන අංක:- 057-7200241/ 057-7200081
ෆැක්ස් :- 057- 2232237 / ප මේල් - uvatshda@gmail.com

ප්‍රාදේශිය කළමනාකරු	:	එච්.ආර්. අරුණ ශාන්ත මහතා (2019.04.05 දක්වා)
ප්‍රාදේශිය කළමනාකරු.(වැඩ බලන)	:	පී.පී.එන්. පුෂ්පකුමාර මහතා
	:	(2019.04.08 සිට)
සහකාර ප්‍රාදේශිය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන):		කේ.එම්.ආර්.එල්. බණ්ඩාර මහතා
සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාප්ති).(වැඩ බලන)	:	එච්.එම්. ප්‍රේමකුමාර මහතා (2019.10.14 දක්වා)
සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාප්ති)	:	එච්. තරංග ද සොයිසා මහතා (2019.10.15 සිට)
කලාප තේ සංර්ධන ව්‍යාප්ති නිලධාරී	:	එච්.එම්. ප්‍රේමකුමාර මහතා
	:	එම්.එම්. කුමාරසිංහ මහතා
	:	ආර්.එම්.ඒ.ඩී. රත්නායක මහතා
	:	ඒ.කේ. විජේසේකර මහතා
පරිපාලන නිලධාරී	:	එච්.පී.එල්.එස්. පුෂ්පකුමාර මහතා (2019.01.01 සිට 2019.06.30 දක්වා)
පරිපාලන නිලධාරී	:	ආර්.ඩී.සී.කේ.රණතුංග මහත්මිය (2019.07.01සිට)
ගිණුම් නිලධාරී)(රාජකාරී ආවරණය)	:	එම්.ඒ. පියසිලි මහත්මිය (2019.04.24 දින දක්වා)
ගිණුම් නිලධාරී	:	ඩබ්.ඩී.එම්.එම්. අමරසිංහ මහත්මිය (2019.06.30 දින සිට)

කෑගල්ල ප්‍රාදේශිය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්ක : කෑගල්ල, ගම්පහ
කෘෂිකර්ම ගොඩනැගිල්ල, කච්චේරිය පාර, කෑගල්ල
දුරකථන අංක:- 035- 7201254/ 035-7201243
ෆැක්ස් :- 035- 2230163 / **ඊ මේල් -** tshdake@gmail.com

ප්‍රාදේශිය කළමනාකරු(වැ.බ.)	:	ඩබ්.එච්.පී.එස්. විජේතුංග මහතා
සහකාර ප්‍රාදේශිය කළමනාකරු(සැලසුම් හා සංවර්ධන)	:	ඩබ්.එච්.පී.එස්. විජේතුංග මහතා
සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාප්ති)	:	ඩී.එම්.පී.එස්. ඒකනායක මහතා
කලාප තේ සංර්ධන ව්‍යාප්ති නිලධාරී	:	ආර්.එම්.පී.ආර්. බණ්ඩාර මහතා
	:	එච්.එම්.පී.පී. නිල්මිණී කුමාරි මහත්මිය
පරිපාලන නිලධාරී	:	එච්.එම්.ආර්.ජේ.බී. හේරත් මහතා
ගිණුම් නිලධාරී	:	ආර්.ආර්.එම්.ජේ.බී. රත්නායක මහතා

කළුතර ප්‍රාදේශිය කාර්යාලය - පරිපාලන දිස්ත්‍රික්ක - කළුතර, කොළඹ
දඩුගොඩයාවත්ත පාර, ඉද්දගොඩ, මතුගම
දුරකථන අංක:- 034- 7200183/ 034-7201630
ෆැක්ස් :- 034- 2249690 / **ඊ මේල් -**tshdakalu@gmail.com

ප්‍රාදේශිය කළමනාකරු (වැඩ බලන)	:	ඩී.එම්.ජේ. නාකන්දල මහතා (2019.04.25 දින දක්වා)
ප්‍රාදේශිය කළමනාකරු	:	ඩී.එම්.ජේ. නාකන්දල මහතා (2019.04.25 දින සිට 2019.06.12 දක්වා)
ප්‍රාදේශිය කළමනාකරු (වැඩ බලන)	:	ආර්.ඒ. වෛද්‍යරත්න මහතා (2019.06.13 දින සිට)
සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාප්ති)	:	එස්.සී. මුදන්නායක මහතා
කලාප තේ සංර්ධන ව්‍යාප්ති නිලධාරී	:	ටී.එම්.එස්.එල්. ප්‍රියදර්ශක මහතා
කලාප තේ සංර්ධන ව්‍යාප්ති නිලධාරී(වැඩ බලන)	:	එච්.පී. පුෂ්පකුමාරී මහත්මිය
පරිපාලන නිලධාරී	:	සරත්චන්ද්‍ර මුරමුදලිගේ මහතා (2018.03.26 සිට 2019.02.28 දක්වා)
පරිපාලන නිලධාරී	:	එච්.පී.එල්.එස්. පුෂ්පකුමාර මහතා (2019.07.01 සිට)
ගිණුම් නිලධාරී(වැඩ බලන)	:	කේ.ඩබ්.ඩබ්. පෙරේරා මහත්මිය
ගිණුම් නිලධාරී(රජකාරි ඉටුකිරීම)	:	ඩී.ඩී. ප්‍රියන්පිත් මහතා (2019.05.24 සිට 2019.12.29 දක්වා)

රත්නසිරි වික්‍රමනායක ජාතික පුහුණු මධ්‍යස්ථානය
5 කණුව, මැද කොටස, උඩවෙල, හන්තාන
දුරකථන අංක:-081-7201760/081-7201973
ෆැක්ස් :-081-3800679/ **ඊ මේල් -** tshdant@gmail.com

කළමනාකරු (පුහුණු)(වැඩ බලන)	:	ඩබ්.ටී.ආර්.පී. විමලරත්න මහතා (2019.04.1 දින දක්වා)
සහකාර කළමනාකරු (පුහුණු) (වැඩ බලන).	:	බී.පී.ඩබ්.එම්.කේ.ඒ. බණ්ඩාර මහතා (2019.03.01 දින දක්වා)
සහකාර කළමනාකරු (පුහුණු)	:	එච්.කේ.පී.අයි.එස්.බී. හපුහින්න මහතා (2019.04.25 සිට)
පුහුණු කිරීමේ නිලධාරී (කොන්ත්‍රාත්)	:	එච්.ඩී.එස්. රූපසිංහ මහතා (2018.10.22 සිට 2019.12.04 දක්වා)

වාර්ෂික වාර්තාව 2019

ප්‍රධාන සාරාංශය

කුඩා තේ බිම් ප්‍රමාණය

2012 වසර සිට පනතෙහි පවතින ප්‍රතිපාදන පරිදි අක්කර 10ට අඩු කුඩා තේ ඉඩම් සඳහා පමණක් ඒවායේ සංවර්ධනයට සහ ඊට අදාල සහායක සේවා සැපයීම ආයතනය විසින් සිදු කෙරේ.

2016 වසර අවසානයේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය සමඟ අධිකාරිය ඒකාබද්ධව ආරම්භ කරනු ලැබූ කුඩා තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන පරිදි කුඩා තේ ඉඩම් පිළිබඳ ලියාපදිංචිකල භෞතික තොරතුරු ප්‍රකාශ කර පසුව යාවත්කාලීන කිරීමට නියමිතව ඇත.

කුඩා තේ වතු අංශයට 2019 වසරේදී තේ ගොවීන් 2,887 දෙනෙකු අලුතින් හඳුනාගෙන එයින් 1,674 ක් තේ වගාවට එකතු වී ඇත. 2019 වසරේ අලුතින් වගාකල හෙක්ටයාර 296 ද එකතු වී 2019 අවසානය වන විට සමස්ත කුඩා තේ වතු භූමි ප්‍රමාණය හෙක්ටයාර 122,900 කි.

කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය සහ ජාතික නිෂ්පාදන දායකත්වය

2019 වර්ෂයේ ජාතික තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 300.134 ක් වූ අතර කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 225.728 කි. එනම් සමස්ථ තේ නිෂ්පාදනයෙන් 75.2% ක් කුඩා තේ වතු අංශයෙන් නිපදවා තිබුණි. කුඩා තේ ඉඩම් අංශයෙන් මෙතෙක් වාර්තා වූ උපරිම නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 247.4 ක් 2014 වර්ෂයේදී ද, ජාතික තේ නිෂ්පාදනයේ උපරිමය වූ කිලෝ ග්‍රෑම් මිලියන 340.22 ක් 2013 වර්ෂයේදී ද වාර්තා වී තිබුණි. 2019 වර්ෂයට සාපේක්ෂව ජාතික තේ නිෂ්පාදනය 1.01% කින් අඩු වූ අතර, කුඩා තේ වතු අංශයේ නිෂ්පාදනය ද 0.98% කින් අඩු වී තිබුණි. කුඩා තේ වතු අංශයෙන් උපරිම නිෂ්පාදනය වාර්තා වූ 2014 වර්ෂයට සාපේක්ෂව 9.6% කින් පමණ 2019 වසරේ නිෂ්පාදනය අඩු වී තිබුණි. කුඩා තේ වතු අංශයේ ජාතික නිෂ්පාදන දායකත්වය 2019 වසර වනවිට 75.2% ක් වී තිබුණි.

කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය

2019 වසරේ කුඩා තේ වතු අංශයේ සාමාන්‍ය ඵලදායිතාව පෙර වර්ෂයට සාපේක්ෂව 1%කින් අඩු වී තිබේ. ඒ අනුව 2019 වසරේ සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට සකස්කල තේ කිලෝ ග්‍රෑම් 1,938 ක් හා පහත් බිම් සඳහා ඵලදායිතාවය හෙක්ටයාරයකට සකස්කල තේ කිලෝ ග්‍රෑම් 2,051 කි. මැදිබිම් සඳහා එය සකස්කල කිලෝ ග්‍රෑම් 1,462 ක් වූ අතර, උස්බිම් සඳහා සකස්කල තේ කිලෝ ග්‍රෑම් 1,954 ක් විය. ඌව සඳහා ඵලදායිතාවය හෙක්ටයාරයකට සකස්කල තේ කිලෝ ග්‍රෑම් 1,300 ක් වී ඇත.

තේ නැවත වගා බිම් ප්‍රමාණය සහ නැවත වගා ප්‍රතිශතය

උපරිම ඵලදාවක් ලබමින් තේ වගා භූමි ප්‍රමාණය ස්ථායීව පවත්වා ගැනීම සඳහා ජාතික ප්‍රතිපත්තිය වශයෙන් වසරකට 2% ක තේ භූමි ප්‍රමාණයක් නැවත වගාව කල යුතුව ඇත. ඒ අනුව කුඩා තේ ඉඩම් අංශයෙන් වාර්ෂිකව තේ නැවත වගා කල යුතු භූමි ප්‍රමාණය හෙක්ටයාර 2,300 ක් පමණ වේ.

2012 වසර සිට ආයතනය විසින් ඉඩම් සංවර්ධන සේවා සහ ව්‍යාප්ති සේවා සැපයීම අක්කර 10ට අඩු බිම් සඳහා සීමා කිරීම මත වාර්ෂිකව හෙක්ටයාර 2,000 බිම් ප්‍රමාණයක් තේ නැවත වගාව පිණිස උදුරා දැමීමට යොමු කල යුතුය. වාර්ෂික ප්‍රතිපාදන පරිදි 2019 වසරේ හෙක්ටයාර 376 ක් උදුරා දැමීම සඳහා ඉලක්ක කරනු ලැබිණි. කුඩා තේ හා රබර් වතු පුනර්පිවන ව්‍යාපෘතිය යටතේ හෙක්ටයාර 1,730 ඉලක්ක කරනු ලැබිණි. කුඩා තේ හා රබර් වතු පුනර්පිවන ව්‍යාපෘතිය යටතේ මේ දක්වා හෙක්ටයාර 4,752 ක් සඳහා අවසරපත්‍ර නිකුත්කර හෙක්ටයාර 1,448 ක් බිම් සකස් කිරීම සිදුකර ඇත. 2019 වසර දක්වා පස සාරවත් කිරීම I හෙක්ටයාර 1,154 ක් ද පස සාරවත් කිරීම II හෙක්ටයාර 588 ක් ද වගාව හෙක්ටයාර 148 ක් ද සිදු කර ඇත.

ගතවූ දශකයේ දත්ත පරිදි ආයතනයෙහි සහනාධාර සහිතව වාර්ෂිකව සාමාන්‍යයෙන් හෙක්ටයාර 991 ක පමණ භූමි ප්‍රමාණයක් තේ නැවත වගාව සඳහා උඳුරා දැමීමත්, හෙක්ටයාර 839 ක පමණ සාමාන්‍ය ප්‍රමාණයක් වාර්ෂිකව තේ නැවත වගාවත් සිදුකර තිබේ. ගතවූ වසර 03ක ප්‍රවණතාව අනුව වාර්ෂිකව හෙක්ටයාර 855 ක පමණ ප්‍රමාණයක් නැවත වගා කිරීමද සිදුවී තිබේ.

2019 වසරේ තේ නැවත වගා කිරීම පිණිස ඉලක්ක කරනු ලැබූ භූමි ප්‍රමාණය හෙක්ටයාර 621 ක් වුවද, හෙක්ටයාර 639 ක් නැවත වගාව නිමකිරීමට හැකි විය. එම ඉලක්කයට සාපේක්ෂව 2019 වසරේ තේ නැවත වගාව 102% ක ප්‍රගති ප්‍රතිශතයක වර්ධනයක් පෙන්වයි.

තේ අලුත් වගාව

2019 වසරේ තේ අලුත් වගාව සඳහා පස සැකසීම හෙක්ටයාර 299 ක් ඉලක්ක කරනු ලැබූ අතර එහි ප්‍රගතිය හෙක්ටයාර 299 කි. 2019 වසරේ හෙක්ටයාර 296 ක භූමි ප්‍රමාණයක් තේ අලුත් වගාව නිමකර තිබුණි.

හෝග පුනරුත්ථාපනය

නිර්දේශිත පරිදි කප්පාදුව, පාංශු සංරක්ෂණ ක්‍රම භාවිතය සහ සෙවන පාලනය සමඟ ඒකාබද්ධව තේ ඉඩම්වල පාළු සිටුවීම මෙමගින් සිදුකෙරේ. ඒ අනුව 2019 වසර සඳහා පැළ 2,460,000 ක් පාළු සැපයීම සඳහා ඉලක්ක කරනු ලැබුණු අතර, එයින් පාළු පැළ 1,921,568 ක් වගාකර තිබුණි.

ව්‍යාප්ති හා උපදේශක සේවා

කුඩා තේ ඉඩම්වල ඵලදායිතාවය වර්ධනය කිරීම (වගු අංක 13-i), දළු ගුණාත්මය වර්ධනය කිරීම (වගු අංක 14) හා තේ පාදක ගොවිපල කළමනාකරණය (වගු අංක 16) අරමුණු කොට ගෙන ව්‍යාප්ති හා උපදෙස් සේවා සැපයීම සඳහා කණ්ඩායම් ව්‍යාප්ති වැඩසටහන් 6,358 ක් ඉලක්ක කර තිබූ අතර එයින් 4,575 ක් එනම් 72% ක් ක්‍රියාත්මක කර ඇත.

මෙම වැඩසටහන් සඳහා ගොවි සහභාගිත්වය 166,264 ක් ඉලක්ක කරනු ලැබූ අතර, සහභාගිවූ ගොවීන් සංඛ්‍යාව 119,506 කි. එනම් ප්‍රගතියේ ප්‍රතිශතය 72% කි. ඒක පුද්ගල ව්‍යාප්ති වැඩසටහන් 51,840 ක් 2019 වසරට ඉලක්ක කර තිබූ අතර, එහි ප්‍රගතියේ ප්‍රතිශතය 25% කි.

සෑම සේවා කොට්ඨාශයකම වගා ආදර්ශන 03 බැගින් ක්ෂේත්‍ර ගොවි පුහුණු පාසැල් ලෙස සංවර්ධනය කිරීම සඳහා වගා ආදර්ශන 432 ක් හදුනාගෙන ඒවායේ පුහුණු වැඩසටහන් ආරම්භ කර ඇත.

ආයතනික තේ තවාන් හා මව් වගා

ගුණාත්මක තේ පැළයක් ගොවීන්ට ලබා දීම සඳහා හන්තාන පුහුණු මධ්‍යස්ථානයේ හා ප්‍රාදේශිය කාර්යාල හතක් ආවරණය වන පරිදි තේ පැළ තවාන් දහයක් පවත්වාගෙන ගොස් තේ පැළ 1,265,127 ක් වසර තුල නිෂ්පාදනය කරන ලදි.

තේ නිෂ්පාදනය සහ ඵලදායිතාව වර්ධනය කර ගැනීම සඳහා ගුණාත්මක රෝපණ ද්‍රව්‍ය ගොවීන් වෙත සැපයීම සඳහා ගාල්ල, මහ-නුවර, කළුතර, මාතර, නුවරඑළිය, කෑගල්ල, රත්නපුර හා ඌව යන ප්‍රාදේශිය කාර්යාලවලට අයත් ප්‍රදේශවල මව් වගා ස්ථාපිත කර ඇත.

කුඩා තේ වතු සංවර්ධන සමිති

ප්‍රාදේශිය සංවිධාන 8 ක් සහ සමස්ත ලංකා සමිති සංවිධානයකින් යුතු කුඩා තේ වතු සංවර්ධන සමිති 1989 වර්ෂයේ ආරම්භ කර නිතිගත සංවිධාන බවට පත් කර තිබිණි. 2019 වසර අවසානය වන විට ලියාපදිංචි වූ කුඩා තේ වතු සංවර්ධන සමිති සංඛ්‍යාව 1,475 කි. සාමාජික සංඛ්‍යාව 329,963 කි. පෙර වර්ෂයට සාපේක්ෂව සමිති සංඛ්‍යාව 1% කින් වර්ධනය වී තිබුණි.

ආයතනයේ මෙහෙයුම් පිරිවැය

2019 වසරේ ආයතනයේ සංවර්ධන පිරිවැය රුපියල් මිලියන 628.8 කි. පුනරාවර්තන පිරිවැය රුපියල් මිලියන 410 කි. පසුගිය වසර හා සසඳන කල සංවර්ධන පිරිවැය රුපියල් මිලියන 3.26 කින් අඩු වී ඇති අතර හා පුනරාවර්තන පිරිවැය මිලියන 8.78 කින් වැඩි වී ඇත. ඒ අනුව මෙහෙයුම් පිරිවැය හා සංවර්ධන පිරිවැය අතර අනුපාතය 0.65 කි.

තේ ගොවි හා තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී අනුපාතිකය

වලදායී ව්‍යාප්ති සේවාවන් සඳහා තිබිය යුතු ව්‍යාප්ති කාරක සහ ගොවි සංඛ්‍යාවේ අනුපාතිකය 1:1000 ක් පමණ වුවද, කුඩා තේ වතු අංශයේ ක්ෂේත්‍ර නිලධාරී හා තේ ගොවි අනුපාතිකය 1:2784 කි. මේ අනුව ආවරණ ගොවි සංඛ්‍යාව පහත හෙළිම සඳහා නිලධාරී සංඛ්‍යාව වැඩි කල යුතු මුත් ආයතනයේ ප්‍රතිපාදන හා පිරිවැය සීමා තත්ත්වයන් සැලකිල්ලට ගෙන එසේ වැඩි කිරීම අසිරු වේ. එබැවින් සේවා සැපයීම් කටයුතුවලදී කුඩා තේ වතු සංවර්ධන සමිති සංවිධානවල සහාය ලබා ගැනීමට ආයතනය විසින් කටයුතු කරන ලදී.

අමු දළු සඳහා මිල

2019 වසරේ ජාතික උච්චත්ව සාමාන්‍ය අගයන් පරීදි ශ්‍රී ලංකා තේ වෙළඳපල මිල ගණන් අනුව උඩරට අමු දළු තේ කිලෝ ග්‍රෑමයක් සඳහා ගෙවනු ලැබූ මිල රුපියල් 75.80 කි. මැදරට අමු දළු කිලෝ ග්‍රෑමයක් සඳහා රුපියල් 69.19 ක් ද, පහතරට ප්‍රදේශ සඳහා රුපියල 84.47 ක් ද සියලු බිම් සඳහා ජාතික උච්චත්ව සාමාන්‍ය අගය රුපියල් 80.15 ක් ද විය. 2019 වසරේ පහතරට සඳහා නිෂ්පාදන ආන්තිකය රුපියල් 28.19 ක් වූ අතර සියලුම ප්‍රදේශ සාමාන්‍ය සඳහා නිෂ්පාදන ආන්තිකය රුපියල් 23.87 අගයක් ගෙන තිබුණි.

01. හැඳින්වීම

1.1. ආයතනය හා කාර්යභාරය

1.2. විගණන හා කළමනාකරණ කමිටු කටයුතු

1.3. පරිපාලනමය කටයුතු

හැඳින්වීම

1.1 ආයතනය හා කාර්යභාරය

ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරණ කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ, 1977 පෙබරවාරි මස 01 වන දින කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය පිහිටුවන ලදී.

අනතුරුව ප්‍රධාන ප්‍රඥප්තියට සංශෝධන එකතු කර 1991 අංක 36 දරණ පනත, 1997 අංක 21 දරණ පනත, 2003 අංක 34 දරන පනත සහ 2006 අංක 42 දරණ පනත සම්මතකර තිබේ.

පරමාර්ථ

කුඩා තේ ඉඩම් සංවර්ධනය කිරීම, නිෂ්පාදනය වැඩි කිරීම, ඵලදායීතාවය වර්ධනය කිරීම, දළු අලෙවි කටයුතු සහ කුඩා තේ ඉඩම් හිමියන්ගේ සුභ සිද්ධිය පිණිස කටයුතු කිරීම ආයතනයේ පරමාර්ථය වේ.

අධිකාරියේ කාර්යභාරය

1. කුඩා තේ වතුවල සහ තමන්ගේම නිෂ්පාදන මාර්ග නොමැති වෙනත් තේ වතුවල ද සංවර්ධනයට අනුබල දීම හෝ සංවර්ධනය කිරීමට භාර ගැනීම.

2. එම තේ ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය තේ කර්මාන්තශාලා සහ වෙනත් පහසුකම් අත්කර ගැනීම හෝ සංවර්ධනය කිරීම.

3. මෙම තේ ඉඩම්වල හෝ එකී කර්මාන්තශාලා වල කෙරෙන නිෂ්පාදන අලෙවිය දියුණු කිරීම හෝ අලෙවි කිරීම භාර ගැනීම.

4. එකී ඉඩම් හා කර්මාන්තශාලා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වියහැකි පහසුකම් සහ සේවාවන් සපයා දීම හෝ ලබා දීම සඳහා නැතහොත් එම පහසුකම් සහ සේවාවන් ලබා දීම පහසු කිරීම සඳහා ද, එම ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීමෙහි හෝ ඒවා ඇසුරුම් කිරීමෙහි යෙදී සිටින්නන්ට ව්‍යවස්ථාපිත හිමිකම් සහ පාරිශ්‍රමික ගෙවීමද ඇතුළුව ඔවුන්ගේ සුභ සිද්ධිය සඳහා අවශ්‍ය සියළු පියවර ගැනීම.

5. කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම හා පාලනය කිරීමට සහ අධිකාරිය වෙත ලියාපදිංචි කර ඇති එවැනි සමිතිවල සාමාජිකයන්ට ආධාර ලබා දීම සහ ඒ හා සම්බන්ධ කාරණා සඳහා රීති සැදීමට විධිවිධාන සැලසීම.

6. කුඩා තේ වතුවල ආයෝජනය ප්‍රවර්ධනය කිරීම.

7. දත්ත එකතු කිරීමට හා බෙදාහැරීමට භාර ගැනීම සහ කුඩා තේ වතුවල සංවර්ධන හැකියාව දැන ගැනීම.

8. උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යාංශයට උපදෙස් දීම සහ වෙනත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

ඉහත සඳහන් අංක 2,3,4 හි කාර්යභාරයන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ පනතින් ඉවත් කිරීමට සහ වෙනත් කාර්යයන් ආදේශ කිරීමට අවශ්‍ය කටයුතු කෙරෙමින් පැවතුණි.

මීට අමතරව 1978 ජනවාරි 01 වන දින සිට ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් වරින් වර පවරන ලද කාර්යයන් සහ අනෙකුත් අදාල පහත සඳහන් සෙසු කාර්යයන් ද ඇතුලත් වන පරිදි අධිකාරිය විසින් කටයුතු කරගෙන යන ලදී.

1. පෞද්ගලික අංශයේ කළමනාකාරිත්වය යටතේ පවත්නා ඉඩම් සංවර්ධනය කිරීම සඳහා පහත සඳහන් ආධාර ක්‍රමයන් ක්‍රියාත්මක කිරීම.

   I. තේ නැවත වගාව
   II. අළුත් වගාව
   III. පාළු සැපයීම

2. තේ පොහොර බෙදා හැරීම, වැවිලි ද්‍රව්‍ය, උපකරණ හා ප්‍රවාහන පහසුකම් ලබාදීම වැනි උපකාරක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

3. ව්‍යාප්ති හා උපදේශක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

1.2 විගණන හා කළමනාකරණ කමිටු කටයුතු

2019 වසර සඳහා ආයතනික විගණන සැලැස්ම 2019.02.20 වන දින අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කර ඇත. සමාලෝචිත වර්ෂය තුල විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් 05 ක් පවත්වා ඇත.

එම විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලදි පහත සඳහන් ප්‍රධාන තීරණ ගෙන තිබුණි.

1. අභ්‍යන්තර විගණන අංශය මගින් නිකුත් කර ඇති විගණන වාර්තා අතරින් ඉදිරි ක්‍රියාමාර්ග ගෙන නොමැති විගණන වාර්තාවන්හි ප්‍රගතිය සම්බන්ධ තීරණයන්

2. ක්‍රියාත්මක කර නොමැති අධ්‍යක්ෂ මණ්ඩල තීරණ ක්‍රියාත්මක කරවීමට අදාල තීරණයන්

විගණන හා කළමනාකරණ කමිටුව විසින් අදාල වසර තුළ පහත දැක්වෙන විෂය ක්ෂේත්‍රයන් සම්බන්ධව විමර්ශනයන් මූලිකව සිදු කරන ලදි.

1. වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම විමසුමට භාජනය කිරීම.

2. අභ්‍යන්තර විගණන වාර්තා මගින් අනාවරණය කර තිබූ කරුණු සමාලෝචනයට භාජනය කිරීම හා යෝජනා ක්‍රියාත්මක කිරීම කඩිනම් කිරීමට කටයුතු කිරීම.

3. විගණකාධිපති වාර්තා සමාලෝචනය කිරීම හා එමගින් දක්වා ඇති ඌනතාවයන් නැවත ඇතිවීම වැලැක්වීම සඳහා අවශ්‍ය වූ නිවැරදි කිරීම් සිදු කිරීමට පියවර ගැනීම.

4. විගණන විමසුම් පිළිබඳ පිළිතුරු ඉදිරිපත් කිරීමේ ප්‍රගතිය පරීක්ෂාව.

5. පවත්නා චක්‍රලේඛණ හා රෙගුලාසි අනුව කටයුතු කරන්නේ ද යන්න පිළිබඳව විමර්ශනය කිරීම හා අඩුපාඩු නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම

6. අධ්‍යක්ෂ මණ්ඩලය වෙත විනය තීරණ ගැනීම සඳහා මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කිරීම ප්‍රමාද වීමත්, විධිමත් විනය පරීක්ෂණ හා මූලික විමර්ශන සඳහා නිලධාරීන් පත් කිරීම ප්‍රමාදවීමත් පිළිබඳව විමසිමි කිරීම.

විනය ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පරිපාලන අංශය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳ තොරතුරු කාලිනව විගණන හා කළමනාකරණ කමිටුව වෙත සහ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීමට කටයුතු කර ඇත.

1.3 පරිපාලනමය කටයුතු

1.3.1 සංවිධාන ව්‍යුහය සහ බඳවා ගැනීමේ පරිපාටිය

කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අංක DMS/1714 V-III(oth) හා 2018.11.29 දිනැති ලිපියේ කාර්යභාර නිලධාරීන්ගේ තනතුරු නාමය කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරී ලෙස සංශෝධනය වී ඇත.

තවද අංක CR/Writ/13/2018 නඩුවේ තීන්දුවට අනුව කළමනාකරණ සහකාර සේවා ගණයට අයත් තනතුරක්වන තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී තනතුර සඳහා බඳවා ගැනීමේ ක්‍රමය 5,4 ජේදය සංශෝධනය කිරීමට කටයුතු කර ඇත.

1.3.2 වර්ෂය තුළ සිදුකරන ලද පත්කිරීම්

අධිකාරියේ පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සහ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ අනුමැතිය පරිදි අයදුම්පත් කැඳවීමෙන් අනතුරුව වර්ෂය තුල පහත සඳහන් තනතුරු සඳහා පත්කිරීම් සිදුකිරීමට කටයුතු කරන ලදි.

තනතුර	ශ්‍රේණිය	නව බඳවාගැනීම්	උසස්වීම්
අභ්‍යන්තර විගණක	MM 1-1	01	
ප්‍රාදේශිය කළමනාකරු	MM 1-1	-	02
කළමනාකරු (සැලසුම් හා නියමුකරණ)	MM 1-1-II	-	01
සහකාර කළමනාකරු (පුහුණු)	MM 1-1-II	01	-
සහකාර ප්‍රාදේශිය කළමනාකරු (ව්‍යාප්ති)	MM 1-1-II	02	01
සහකාර කළමනාකරු (මුදල්)	MM 1-1-II	01	-
සහකාර කළමනාකරු (සැලසුම් හා නියමුකරණ)	MM 1-1-II	01	-
කලාප තේ සංවර්ධන ව්‍යාප්ති නිලධාරී	JM 1-1	-	09
ගිණුම් නිලධාරී	JM 1-1	01	02
පරිපාලන නිලධාරී	JM 1-1	-	01
තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරී	MA 2-3-III	09	-
පොත් තබන්නා	MA 2-2-III	02	
කළමනාකරණ සහකාර	MA 1-2-III	10	
තවාන් සහායක	PL 1-III	04	
එකතුව		32	16

1.3.3 ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ ප්‍රතිඵල පාදක කළමනාකරණ උපායමාර්ග හා සංවර්ධනාත්මක ප්‍රතිඵල

ආයතනයේ අපේක්ෂිත දිගුකාලීන සංවර්ධන ප්‍රතිඵලය " කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්වය නංවාලීම " ලෙස හඳුනා ගෙන තිබේ. ව්‍යවස්ථාපිත අරමුණු ඉටුකිරීම පිණිස ප්‍රතිඵල පාදක කළමනාකරණ ප්‍රවේශය ආයතනික උපායමාර්ගය වේ. ඒ යටතේ 2010 වසර සිට 2019 වසර දක්වා හඳුනා ගත් මධ්‍යකාලීන ප්‍රතිඵල අරමුණු කරගෙන වාර්ෂික ක්‍රියාත්මක සැලසුම් තුලින් ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට ආයතනය කටයුතු කර ඇත.

ඒ සඳහා ප්‍රධාන මිණුම් දණ්ඩ ලෙස කුඩා තේ වතු අංශයේ හෙක්ටයාරයක (නිමි තේ කිලෝ ග්‍රෑම්) ඵලදායිතාවය ප්‍රධානතම කාර්යඵල දර්ශකය ලෙස සලකා තිබේ. ඒ අනුව උස් බිම්, මැදිබිම්, පහත් බිම් හා සාමාන්‍ය ඵලදායිතාවය සඳහා වාර්ෂික ඉලක්ක ක්ෂේත්‍ර කාර්ය මණ්ඩලයට හඳුන්වා දීමෙන් ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීමට ක්ෂේත්‍ර කටයුතු මෙහෙයවනු ලැබුණි. (2019 වසරට තේ භෝගය සඳහා හඳුනාගෙන ඇති ජාතික ඉලක්කය හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම් 2,307 කි.) 2018 සහ 2019 වර්ෂවල කාර්යඵල සාර්ථකත්වය මැනීම සඳහා වූ ප්‍රධානම සංවර්ධන ඉලක්ක හා කාර්යඵල සාර්ථකත්වය පහත දක්වා ඇත.

වගු අංක 01

ආයතනය අපේක්ෂිත ඵලදායිතා ඉලක්ක හා කාර්යසාධනය - 2018/2019
(වසරකට හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම්)

	2018			2019		
	ඉලක්කය	කාර්යඵලය	ප්‍රතිශතය	ඉලක්කය	කාර්යඵලය	ප්‍රතිශතය
පහතරට	2,500	2,075	83%	2,500	2,051	82%
මැදරට	1,700	1,449	85%	1,700	1,462	86%
උඟ	1,600	1,380	86%	1,600	1,300	81%
සාමාන්‍යය	2,307	1,958	84%	2,307	1,938	84%

රූප සටහන් අංක 01



සංවර්ධන ප්‍රතිඵල

දීඝකාලීන බලපෑම/ ප්‍රතිඵලය - කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්ත්වය නංවාලීම.

මධ්‍යකාලීන ප්‍රතිඵල

1. වසර 03 කදී වසරකට / හෙක්ටයාරයකට / සකස්කල තේ / කිලෝ ග්‍රෑම්
   පහත රට 2,500 දක්වා
   මැද රට 1,700 දක්වා
   ඌව 1,600 දක්වා වැඩි කිරීම

2. වසර 3 කදී කම්හල් මට්ටමින් අමු දළු ගුණාත්මය 65% දක්වා වර්ධනය කිරීම.

3. කුඩා තේ වතු සංවර්ධන සමිති 1,500 න් 25% ක් "A" ශ්‍රේණියේ සමිති ලෙස ප්‍රජා මූල සංවර්ධනය කිරීම.

4. සියලුම සේවක ක්‍රියාකාරකම් ආයතනයේ දිර්ඝ කාලීන සංවර්ධනයට දායකවන ලෙස ක්‍රියාවලියක් ඇති කිරීම.

5. වසර 05 ක් තුලදී තේ ඉඩම්වලින් 10% ක් අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමු කරවීම.

02. ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් අංශය

2.1. කුඩා තේ ඉඩම්

2.2. කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය

2.3. කුඩා තේ ඉඩම් හිමියෝ

2.4. කුඩා තේ ඉඩම් සංඛ්‍යාව

2.5. භූමි වර්ගීකරණය

2.6. කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය

2.7. කුඩා තේ ඉඩම් නිෂ්පාදන සංයුතිය

2.8. කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය

2.9. කුඩා තේ අංශයේ ආයෝජනයන් හා මෙහෙයුම් සමාලෝචනය

ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් අංශය

2.1. කුඩා තේ ඉඩම් :
තේ පාලන පනතට අනුව " අක්කර 10 ට අඩු තේ ඉඩම් කුඩා තේ ඉඩම් " ලෙස සැලකේ. එසේ වුවද ශ්‍රී ලංකා තේ මණ්ඩලය යටතේ පැවති අක්කර 10 - 50 දක්වා වූ තේ ඉඩම් සඳහා සංවර්ධන කටයුතු කිරීමේ බලතල 1978 ජනවාරි මස 01 දා සිට කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් පවරන ලදී. ඒ අනුව පුද්ගලික අයිතිය යටතේ ඇති අක්කර 50 ට අඩු සියළුම තේ ඉඩම්වල සංවර්ධනය සඳහා අදාල සහායක සේවාවන් ආයතනය විසින් මෙතෙක් සපයා තිබුණි.

2012 වසර වන විට අක්කර 10 සිට 50 දක්වා වූ බිම් ප්‍රමාණ සඳහා ඉඩම් සංවර්ධන සේවා සැපයීම ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙතත්, ව්‍යාප්ති සේවා සැපයීම ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය වෙතත් පවරා ඇත. ඒ අනුව 2012 වර්ෂයේ සිට පනතෙහි පවතින ප්‍රතිපාදන පරිදි අක්කර 10 ට අඩු තේ බිම් සඳහා පමණක් ඒවායේ සංවර්ධනයට සහ ඊට අදාල සහායක සේවාවන් ආයතනය විසින් සපයන ලදී.

2. 2 කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය :
2005 කුඩා තේ වතු සංගණනය පරිදි කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය වූ හෙක්ටයාර 132,329 ද ඇතුලුව (පර්චස් 20 අඩු භූමි සහිතව) ශ්‍රී ලංකාවේ සමස්ත තේ ඉඩම් භූමි ප්‍රමාණය හෙක්ටයාර 221,968 ක් පමණ වේ. මේ අනුව ශ්‍රී ලංකාවේ සමස්ත තේ භූමි ප්‍රමාණයෙන් 59% ක් කුඩා තේ ඉඩම් අංශයට අයත් වේ.
1994/95 කුඩා තේ ඉඩම් සංගණන තොරතුරු හා සසඳා බැලීමේ දී දශකයක කාලපරිවිජේදයක් තුල ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය හෙක්ටයාර 82,919 සිට හෙක්ටයාර 116,492 දක්වා (පර්චස් 20 ට වැඩි ඉඩම් පමණි) එනම් 40% කින් පමණ වැඩි වී ඇත.

2005 කුඩා තේ වතු සංගණනය පදනම්කර අලුතින් වගාකල හෙක්ටයාර 296 ක බිම් ප්‍රමාණයද සහිතව 2019 වර්ෂය අවසානය වන විට කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය හෙක්ටයාර 122,900 ක් වී ඇත.

රූප සටහන් අංක 02



මූලාශ්‍ර -
* කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණනය 2005
ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව

2. 3 කුඩා තේ ඉඩම් හිමියෝ
2005 සංගණන පරිදි කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව 370,842 කි. (පර්චස් 20 වඩා අඩු වගාකරුවන්ද ඇතුළුව)මොවුන්ගෙන් 82% ක් තනි අයිතිය යටතේ වූ ඉඩම් හිමි කුඩා තේ වතු හිමියන් වන අතර, මෙම පිරිස සඳහා තේ වගා භූමි ප්‍රමාණයෙන් 76% ක් පමණ අයත් වේ. තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ පාදකව 2005 සිට 2019 දක්වා අළුතින් තේ වගාවට එක්වූ තේ ගොවීන් සංඛ්‍යාව එකතු කල පසු 2019 වසර අවසානය වන විට කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව 400,987 කි.

2. 4 කුඩා තේ ඉඩම් සංඛ්‍යාව :
1994 සිට 2005 වසර දක්වා කාලය තුල සමස්ත කුඩා තේ ඉඩම් සංඛ්‍යාව 206,652 සිට 350,982 (පර්චස් 20 වැඩි) දක්වා එනම් 70% කින් වැඩි වී ඇත. පර්චස් 20 ට වැඩි ඉඩම් කැබලි සංඛ්‍යාව 370,842 කි. පර්චස් 20 ට අඩු ඉඩම් කැබලි සංඛ්‍යාව සහිතව මුළු ඉඩම් කැබලි සංඛ්‍යාව 417,607 කි.

2005 වසරේ සංගණන පරිදි සමස්ත කුඩා තේ ඉඩම් කැබලි සංඛ්‍යාව 397,223 සහ බිම් ප්‍රමාණය හෙක්ටයාර 132,329 ක් වේ. මෙම ප්‍රමාණය ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 123 ක් යටතේ ග්‍රාම නිලධාරී වසම් 3,692 ක කුඩා තේ ඉඩම් ව්‍යාප්ත වී තිබේ.

කුඩා තේ ඉඩම් අංශයේ තේ ඉඩම් වර්ධනය සඳහා විශේෂයෙන් අමු දළු සඳහා ලැබෙන මිල ඉහල යාම, තේ වගාව සඳහා දිරිදීමනා

මුදල වැඩි කිරීම, ශ්‍රම හිඟය, විශාල ඉඩම් කැබලිකිරීම සහ විකල්ප වගා නොමැති ඉඩම් තේ වගාවට යොමුවීම යන කරුණු බලපා තිබේ.

වගු අංක 2

ශ්‍රී ලංකාවේ දිස්ත්‍රික් අනුව කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව , ඉඩම් සංඛ්‍යාව හා බිම් ප්‍රමාණය

දිස්ත්‍රික්කය	කුඩා තේ ඉඩම් හිමියන් සංඛ්‍යාව	කුඩා තේ ඉඩම් සංඛ්‍යාව	හෙක්ටයාර ගණන
කොළඹ	478	491	246
ගම්පහ	9	9	2
කළුතර	35,908	38,263	7,823
මහනුවර	29,224	30,747	16,058
මාතලේ	1,387	1,408	1,672
නුවරඑළිය	16,875	17,547	7,205
ගාල්ල	81,491	90,524	27,427
මාතර	63,273	67,613	25,417
හම්බන්තොට	2,386	2,533	546
කුරුණෑගල	145	151	180
බදුල්ල	28,101	29,679	9,020
මොණරාගල	634	637	199
රත්නපුර	92,038	97,984	30,441
කෑගල්ල	18,893	19,637	6,093
එකතුව	**370,842**	**397,223**	**132,329**

මූලාශ්‍රය - ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණනය -2005

2. 5 භූමි වර්ගීකරණය :

2016 වසරේ ශ්‍රී ලංකා තේ මණ්ඩලය හා ඒකාබද්ධව සිදුකළ තේ ඉඩම් ලියාපදිංචි කිරීමේ වැඩසටහන මගින් ලබා දෙන ලද දත්ත හා තොරතුරු ප්‍රකාශයට පත් කල පසු යාවත්කාලීන කිරීමට ඉදිරියේදී කටයුතු කරනු ඇත. මෙතෙක් 2005 වසරේ සංගණන තොරතුරු 2019 ආයතනික සංවර්ධන කටයුතු සඳහා උපයෝගී කර ගන්නා ලදී.

කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණයෙන් අක්කර 113,190 (34.6%) අක්කර එකකට වඩා අඩු තේ ඉඩම් වන අතර, අක්කර 198,707 (60.8%) අක්කර දෙකකට වඩා අඩු තේ ඉඩම් වේ. අක්කර 10 ට වැඩි තේ ඉඩම් ප්‍රමාණය අක්කර 59,731 කි. (18.3%) පහත වගුව පරිදි අක්කර 267,253 (හෙක්ටයාර 108,200) අක්කර 10 ට අඩු තේ ඉඩම් වේ.

වගු අංක 03

ශ්‍රී ලංකාවේ කුඩා තේ ඉඩම් භූමි ප්‍රමාණය සහ කැබලි සංඛ්‍යාව අනුව වර්ගීකරණය - 2005

උක්කර	භූමි ප්‍රමාණය අක්කර	ප්‍රතිශතය %	ඉඩම් කැබලි සංඛ්‍යාව	ප්‍රතිශතය %
1 ට අඩු	113,190	34.6	297,342	75
1 - 2 ට අඩු	85,517	26.2	74,314	18.7
2 - 3 ට අඩු	31,882	9.8	15,101	3.8
3 - 5 ට අඩු	18,413	5.6	5,299	1.3
5 - 10 ට අඩු	18,251	5.5	2,936	0.7
10 සහ වැඩි	59,731	18.3	2,231	0.5
	326,984		**397,223**	

රූප සටහන් අංක 03



මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තා.

2. 6 කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනය

2019 වසරේ ජාතික තේ නිෂ්පාදනය කිලෝ ග්‍රෑම් මිලියන 300.134 කි. මෙය පෙර වර්ෂය සමඟ සැසඳීමේදී කිලෝ ග්‍රෑම් මිලියන 3.81 කින් හෙවත් 1.25% කින් ජාතික නිෂ්පාදනය අඩු වීමක් වී තිබේ.
එසේම කුඩා තේ වතු අංශයේ සමස්ත තේ නිෂ්පාදනය ද කිලෝ ග්‍රෑම් මිලියන 2.321 කින් හෙවත් 1% කින් නිෂ්පාදනය අඩු වී තිබේ.

වසර 1991 ජාතික තේ නිෂ්පාදනයෙන් 50% ක් නිෂ්පාදනය කරනු ලැබූ කුඩා තේ ඉඩම් අංශය සමාලෝචිත වර්ෂය තුල 75 % ක නිෂ්පාදන දායකත්වයක් දරා ඇත.

වගු අංක 4

ශ්‍රී ලංකාවේ ජාතික තේ නිෂ්පාදනය - 2018 / 2019
කළමනාකාරිත්ව ආයතන අනුව දායකත්වය

කළමනාකාරිත්ව ආයතන		තේ නිෂ්පාදනය මෙට්ට්‍රික් ටොන්			
		2018	%	2019	%
01	පෞද්ගලික අංශය(කුඩා තේ අංශය)	228,049	75.0	225,728	75.21
02	ප්‍රාදේශිය වැවිලි සමාගම්	73,540	24.2	72,176	24.05
03	ජනතා වතු සංවර්ධන මණ්ඩලය ශ්‍රී ලංකා රාජ්‍ය වැවිලි සංස්ථාව	1,699	0.56	1,449	0.48
04	අනෙකුත්	656	0.22	780	0.26
	මුළු එකතුව	**303,944**	100	**300,133**	100

(අනෙකුත් = තේ ශක්ති , ටී ස්මොල් හොල්ඩර් ෆැක්ටරීස් ලිමිටඩ් ,ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය, සමුපකාර, ඇල්කඩුව වැවිලි සමාගම , කළුබෝවිටියන තේ කම්හල් සමාගම)

රූප සටහන් අංක 04



මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

(ආයතන වර්ගීකරණයේ මිලදී ගත් දළු සියල්ලම කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනයට ඇතුළත් කර ඇත. මෙහිදී පෞද්ගලික අංශය යන්න කුඩා තේ ඉඩම් අංශය ලෙස සලකා ඇත.)

රූප සටහන් අංක 05



මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය

රූප සටහන් අංක 06



මූලාශ්‍රය :- ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ දත්ත

2. 7 කුඩා තේ ඉඩම් නිෂ්පාදන සංයුතිය

2019 වර්ෂයේ ජාතික තේ නිෂ්පාදනයෙහි සමස්ත පහතරට තේ නිෂ්පාදනයෙන් 96.3% ක්ද, මැදරට සමස්ත නිෂ්පාදනයෙන් 66%

ක්ද, උඩරට සමස්ත නිෂ්පාදනයෙන් 18% ක්ද කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනයෙන් සමන්විත වී තිබුණි. (වගු අංක 05) තවද 2018 වසරේදි ද පුද්ගලික අංශයේ සමස්ත තේ නිෂ්පාදනයෙන් 81% ක්ම පහතරට තේ නිෂ්පාදනයට අයත් වූ අතර එය 2019 වර්ෂයේ 84% දක්වා වැඩි වී ඇත.

2018 වර්ෂය හා සසඳන කල 2019 වර්ෂයේදි කුඩා තේ ඉඩම් අංශයේ උඩරට තේ නිෂ්පාදනය 3.6% කින්ද පහතරට 1.1% කින්ද අඩුවී ඇති අතර මැදරට තේ නිෂ්පාදනය 1.1% කින් වැඩි වී තිබේ.

වගු අංක 05

කුඩා තේ ඉඩම් අංශයේ භෞතික හා නිෂ්පාදන දායකත්වය (පිහිටීම මත)

2018/ 2019

		වර්ෂය	උඩරට	මැදරට	පහත රට	එකතුව
කුඩා තේ බිම් ප්‍රමාණය	(හෙක්ටයාර)		5913	21403	89176	116492
දායක ප්‍රතිශතය			5%	18%	77%	
ජාතික නිෂ්පාදනය	මෙට්‍රික් ටොන්	2018	64,970	47,131	191,843	303,944
	%		21%	16%	63%	
	මෙට්‍රික් ටොන්	2019	63,046	47,172	189,915	300,134
	%		21%	16%	63%	
කුඩා තේ නිෂ්පාදනය	මෙට්‍රික් ටොන්	2018	11,996	31,018	185,036	228,049
	%		5%	14%	81%	
	මෙට්‍රික් ටොන්	2019	11,553	31,300	182,874	225728
	%		5%	14%	81%	
ජාතික නිෂ්පාදනයට දායකත්වය	%	2019	3.8%	10.4%	60.9%	75.0%
		2018	3.9%	10.2%	60.9%	75.0%
ඵලදායිතාවය	වසරකට / හෙක්ටයාරයකට සකස්කල තේ	2018	2,029	1,449	2,075	1,958
		2019	1,954	1,462	2,051	1,938

මූලාශ්‍රය

1. කුඩා තේ ඉඩම් පිළිබඳ සංගණන වාර්තාව 2005 - ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
2. මාසික සංඛ්‍යා සාරාංශය - ශ්‍රී ලංකා තේ මණ්ඩලය 2019

2. 8 කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය

2018/2019 වසර දෙකෙහිද ජාතික තේ නිෂ්පාදනයේ වර්ධනය සඳහා ප්‍රධාන වශයෙන් බලපා ඇත්තේ කුඩා තේ ඉඩම් අංශයේ නිෂ්පාදනයයි.

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ තේ නිෂ්පාදනය පිළිබඳ දත්ත පරිදි 2018 වසරේ කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම් 1,958 කි.

2019 වසරේ කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම් 1,938 ක් වූ බැවින් ඵලදායිතාවය 1.0% කින් අඩුවී තිබේ.

වගු අංක 06

කුඩා තේ ඉඩම් අංශයේ ඵලදායිතාවය 2019 (නිමි තේ / කිලෝ ග්‍රෑම්)
පරිපාලන දිස්ත්‍රික් පදනමින්

පරිපාලන දිස්ත්‍රික්කය	කුඩා තේ බිම් ප්‍රමාණය (හෙක්ටයාර) **	උස් බිම්	මැදි බිම්	පහත් බිම්	එකතුව	ඵලදායිතාව (හෙක්ටයාරයකට නිමි තේ කිලෝ ග්‍රෑම්)*
බදුල්ල	7,863	4,922,544	5,304,066	-	10,226,610	1,300.60
ගාල්ල	25,325	-	-	42,999,913	42,999,913	1,697.92
හම්බන්තොට	492	-	-	290,323	290,323	590.09
කළුතර	7,588	-	-	20,613,904	20,613,904	2,716.65
කොළඹ	246	-	-	959,770	959,770	3,901.50
මහනුවර	12,486	329,565	17,991,699	11,441,795	29,763,059	2,383.71
කෑගල්ල	5,753	-	156,032	9,646,261	9,802,292	1,703.86
මාතලේ	1,190	-	907,811	409,580	1,317,391	1,107.05
මාතර	22,971	-	185,256	34,322,404	34,507,660	1,502.23
නුවරඑළිය	5,971	6,251,610	5,884,979	724,809	12,861,397	2,153.98
රත්නපුර	28,232	49739	870,245	61,466,181	62,386,165	2,209.77
එකතුව		**11,553,458**	**31,300,088**	**182,874,939**	**225,728,485**	
2005 සංගණනය පාදකව බිම් ප්‍රමාණය	-	**5,913**	**21,403**	**89,176**	**116,492**	
ඇස්තමේන්තු ගත සාමාන්‍ය ඵලදායිතාව/ හෙක්ටයාරයකට	2018	2,029	1,449	2,075	1,958	-
	2019	1,954	1,462	2,051	1,938	-

** පර්චස් 20ට අඩු භූමි ප්‍රමාණයද සහිතව දක්වා ඇත.

* පරිපාලන දිස්ත්‍රික් පදනමට පරිබාහිරව කම්හල්වලට අමු දළු මිලදි ගැනීම මත සමහර දිස්ත්‍රික්කවල නිෂ්පාදන දත්ත යථාරූපී නොවේ.

2.9 කුඩා තේ අංශයේ ආයෝජනයන් හා මෙහෙයුම් සමාලෝචනය

2019 වර්ෂයේ සංවර්ධන හා ආයතනික ප්‍රාග්ධන පිරිවැය ලෙස රුපියල් මිලියන 800.00 ක්ද, පුනරාවර්තන වියදම් ලෙස රුපියල් මිලියන 420.00 ක්ද වශයෙන් රුපියල් මිලියන 1,220.00 ක් සඳහා ක්‍රියාත්මක සැලැස්ම පිළියෙල කරන ලදී.

2019 වසර සඳහා ලද ප්‍රාග්ධන වියදම් මුදල රුපියල් මිලියන 685.00 ක් හා පුනරාවර්තන රුපියල් මිලියන 411.1 ක් වනසේ සමස්ත ලැබීම් රුපියල් මිලියන 10,96.10 ක් විය.

වගු අංක 07

පුද්ගලික අංශයේ තේ නිෂ්පාදනය සහ භාණ්ඩාගාර අරමුදල් ලැබීම් -2008 - 2019

වර්ෂය	සමස්ත තේ නිෂ්පාදනය (කිලෝ ග්‍රෑම් මිලියන)	සමස්ත නිෂ්පාදන දායකත්වය%		පුද්ගලික අංශය (කුඩා තේ ඉඩම් අංශය) සඳහා ප්‍රතිපාදිත මුදල (රුපියල් මිලියන)
		පුද්ගලික අංශය	අනෙකුත් අංශ	
2008	318.46	67.4	25.9	405.30
2009	291.13	69.3	24.8	367.80
2010	331.42	69.4	23.8	394.93
2011	327.53	69.9	30.1	391.59
2012	326.27	71.4	28.6	418.83
2013	340.02	72.2	27.8	520.14
2014	338.03	73.1	26.9	742.94
2015	328.96	72.9	27.1	969.72
2016	292.57	74.5	25.5	1,009.45
2017	307.72	75.5	24.5	784.45
2018	303.94	75.0	25.0	850.02
2019	300.134	75.21	24.05	800.00

මෙහෙයුම් සමාලෝචනය

2019 වසරේ මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 410.03 කි. 2018 වර්ෂයට සා-පේක්ෂව 2019 වසරේ මෙහෙයුම් පිරිවැය රුපියල් මිලියන 29.97 කින් වැඩි වී තිබේ.

වගු අංක 8

මෙහෙයුම් සමාලෝචනය

(2008 සිට 2019 දක්වා)

වර්ෂය	සංවර්ධන පිරිවැය රු.000	මෙහෙයුම් පිරිවැය රු.000	සංවර්ධන රුපියලක් සඳහා මෙහෙයුම් පිරිවැය
2008	208,255	188,725	0.91
2009	185,660	202,146	1.08
2010	189,194	205,385	1.08
2011	208,407	218,527	1.04
2012	276,324	233,738	0.85
2013	440,060	238,823	0.54
2014	345,104	252,774	0.73
2015	561,490	303,435	0.54
2016	561,868	314,547	0.56
2017	643,092	337,053	0.52
2018	632,165	380,054	0.66
2019	628,899	410,034	0.65

03. ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ සංවර්ධන කාර්යයන්

3.1. මධ්‍යකාලීන ප්‍රතිඵල පාදක ඉලක්ක හා කාර්යඵලය

3.2. කුඩා තේ ඉඩම්වල ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘති කටයුතු

3.3. ප්‍රධාන කාර්යපාදක දර්ශකය

3.1 *ව්‍යවස්ථාපිත අරමුණු උදෙසා වූ සංවර්ධන කාර්යයන්*

ආයතනය ස්ථාපිත කිරීම සඳහා වූ පනතට පදනම්ව පැවති ප්‍රධාන ව්‍යාවස්ථාපිත අරමුණු 4ට අනතුරුව වර්ෂ 1997 , 2003 හා 2006 යන වර්ෂවලදී පනතට එකතු කරන ලද සංශෝධන පරිදි ආයතනයෙහි ව්‍යවස්ථාපිත අරමුණු හා ඊට අදාල සංවර්ධන කාර්යයන් පහත සඳහන් පරිදි වේ. මෙයින් අංක 02 , 03 හා අංක 04 හි සඳහන් කාර්යයන් පනතෙන් ඉවත් කිරීමට සහ වෙනත් කාර්යයන් ආදේශ කිරීමට අවශ්‍ය කටයුතු ද ක්‍රියාත්මක වෙමින් පැවතුනි.

ව්‍යවස්ථාපිත අරමුණු :-

01. කුඩා තේ වතුවල සහ තමන්ගේම නිෂ්පාදන මාර්ග නොමැති වෙනත් තේ වතුවලද සංවර්ධනයට අනුබල දීම හෝ සංවර්ධනය කිරීමට භාර ගැනීම

සංවර්ධන කාර්යයන් :-

i තේ නැවත වගා දිරි දීමනා ක්‍රමය
ii. තේ අළුත් වගා දිරි දීමනා ක්‍රමය
iii. භෝග පුනරුත්ථාපන දිරි දීමනා ක්‍රමය

02. එම තේ ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීම සඳහා අවශ්‍ය තේ කර්මාන්තශාලා සඳහා වෙනත් පහසුකම් අත්කර ගැනීම

සංවර්ධන කාර්යයන් :-

අධිකාරිය විසින් 1997 වසරේදී " තේ ශක්ති අරමුදල " පිහිටවනු ලැබූ අතර 2000 වසරේ සිට එය වෙනම ආයතනයක් වශයෙන් ඉහත අරමුණ වෙනුවෙන් අදාල කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ.

03. මෙම තේ ඉඩම්වල හෝ එකි කර්මාන්ත ශාලාවල කෙරෙන නිෂ්පාදන අලෙවිය දියුණු කිරීම හෝ අලෙවි කිරීම භාරගැනීම.

සංවර්ධන කාර්යයන් :-

I. කුඩා තේ වතු හිමියන් දළු සපයන කම්හල්හි අමු දළු ගුණාත්මය වර්ධනය කිරීම.
II. කුඩා තේ වතුවල නිෂ්පාදිත දළු අලෙවිය සඳහා කුඩා තේ වතු සංවර්ධන සමිති මෙහෙයවීම.

04. එකි ඉඩම් හා කර්මාන්තශාලා සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වියහැකි පහසුකම් සහ සේවාවන් සපයාදීම හෝ ලබා දීම නැතහොත් එම පහසුකම් හා සේවාවන් ලබාදීම පහසු කිරීම සඳහා ද තේ ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත් කිරීමෙහි හෝ ඇසුරුම් කිරීමෙහි යෙදී සිටින්නන්ගේ සුභසිද්ධිය සඳහා අවශ්‍ය පියවර ගැනීම.

සංවර්ධන කාර්යයන් :-

I. තේ පොහොර බෙදාහැරීම , වැවිලි ද්‍රව්‍ය , උපකරණ හා ප්‍රවාහන සේවා පහසුකම් ලබාදීම වැනි උපකාරක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

II. ව්‍යාප්ති හා උපදේශක සේවාවන් ක්‍රියාත්මක කිරීම.

III. තේ ඉඩම්වල ඵලදාව නිෂ්පාදන බවට පත්කිරීමෙහි යෙදී සිටින්නන්ගේ සුභ සිද්ධිය සඳහා පියවර ගැනීම සහ සහායක සේවා පුළුල් කිරීමේ අරමුණින් කුඩා තේ වතු සංවර්ධන සමිති නීතිගත සංවිධාන වශයෙන් පිලිගැනීම පිණිස සමිති ලියාපදිංචි කිරීම සහ ඒවායේ කටයුතු පිළිබඳ රෙගුලාසි පැනවීම.

IV. කුඩා තේ වතු සංවර්ධන සමිති ප්‍රජා මූලික සංවිධාන වශයෙන් ශක්තිමත් කිරීම සහ කුඩා තේ ඉඩම් හිමියන් තම ඉඩමේ අමතර ආදායම් ඉපයීමේ කටයුතු සඳහා යොමු කිරීම.

05. කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම හා පාලනය කිරීමට සහ අධිකාරිය වෙත ලියාපදිංචි කර ඇති එවැනි සමිතිවල සාමාජිකයින්ට ආධාර ලබා දීම සහ ඒ හා සම්බන්ධ කාරණා සඳහා රීති සැදීමට විධිවිධාන සැලසීම.

සංවර්ධන කාර්යයන් :-

I. කුඩා තේ වතු සංවර්ධන සමිති ආයතනය විසින් ලියාපදිංචි කිරීම.
II. කුඩා තේ වතු සංවර්ධන සමිති රීති සකස් කිරීම.
III. කුඩා තේ වතු සංවර්ධන සමිති සමස්ත ලංකා සංවිධානය පවත්වා ගෙනයාම සඳහා අවශ්‍ය මූල්‍ය ආධාර හා සේවා සහ සහයෝගිතාව ලබා දීම.

IV. කුඩා තේ වතු සංවර්ධන සමිති සමස්ත ලංකා සංවිධානය පවත්වාගෙනයාම සඳහා වාර්ෂික මූල්‍ය ප්‍රතිපාදන ලබාදීම.

V. කුඩා තේ වතු සංවර්ධන සමිති සඳහා අනෙකුත් ආධාර හා සේවා සහයෝගිතාව ලබා දීම.

06. කුඩා තේ වතුවල ආයෝජනය ප්‍රවර්ධනය කිරීම.

සංවර්ධන කාර්යයන් :-

I. ආයතනික සහනාධාරවලට පරිබාහිර විශේෂ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම. (කුඩා තේ හා රබර් වතු පුනර්පිහිටුවන වැඩසටහන වැනි)

II. විශේෂිත ණය ක්‍රම ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසා දීම. (තේ සංවර්ධන ව්‍යාපෘති වක්‍රීය ණය අරමුදල් ක්‍රමය , ලංකා බැංකු විශේෂ ණය යෝජනා ක්‍රමය)

III. ආයතනික තේ තවාන් පවත්වා ගෙන යාම.

IV. මවි වගා පවත්වාගෙනයාම.

V. වාණිජ තේ තවාන් ලියාපදිංචි කිරීම සහ දැනුම හා පුහුණුව ලබාදීම.
කාලීනව වැඩිවන ආයෝජන පිරිවැය අවම කිරීම සඳහා අවශ්‍ය පහසුකම් සලසා දීම.

VI. ජාතික ප්‍රතිපත්තිය වූ 2% තේ නැවත වගා අනුපාතිකය උපරිම මට්ටමින් රඳවා ගැනීම පිණිස අවශ්‍ය කටයුතු කිරීම.

07. දත්ත එකතු කිරීමට හා බෙදා හැරීමට බාර ගැනීම සහ කුඩා තේ වතුවල සංවර්ධන හැකියාව දැන ගැනීම.

සංවර්ධන කාර්යයන් :-

I. කුඩා තේ ඉඩම් අංශය සඳහා සංගණන ක්‍රියාත්මක කිරීම තුලින් දත්ත හා තොරතුරු ලබාගැනීම.

II. කාලීනව සමීක්ෂණ ක්‍රියාත්මක කිරීම.

III. කුඩා තේ ඉඩම් හිමියන් ලියාපදිංචි කිරීම.

IV. තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරී කොට්ඨාශ මට්ටමින් පිරිවැය දත්ත සහ අදාල අනෙකුත් තොරතුරු ලබා ගැනීම.

08. උචිත ප්‍රතිපත්ති පිළිබඳව අමාත්‍යාංශයට උපදෙස්දීම සහ වෙනත් අදාල නියෝජිත ආයතන සමඟ සම්බන්ධීකරණය කිරීම.

සංවර්ධන කාර්යයන් :-

I. ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය සමඟ පර්යේෂණ හා ව්‍යාප්ති සංසඳය හා අන්තර් ආයතන උපදේශක කමිටුව පවත්වා ගෙනයාම.

ක්‍රියාත්මක සැලැස්ම

කුඩා තේ වතු අංශය සඳහා ප්‍රතිඵල පාදක කළමනාකරණ ප්‍රවේශය තුලින් අරමුණු කරනු ලැබූ සංවර්ධන ප්‍රතිඵල සාක්ෂාත් කර ගැනීම පිණිස 2019 වසර සඳහා සැකසූ ක්‍රියාත්මක සැලැස්ම වෙනුවෙන් ඇස්තමේන්තුගත සංවර්ධන පිරිවැය රුපියල් මිලියන 710.19 කි.

ක්‍රියාත්මක සැලැස්මේ සංවර්ධන ප්‍රාග්ධන පිරිවැයෙන් 88.96% ක් ඉඩම් සංවර්ධන කටයුතු සඳහා වෙන් කරන ලදි. ව්‍යාප්ති කටයුතු සඳහා 4.15% ක්ද ප්‍රජාමූල සංවිධාන ශක්තිමත් කිරීම සඳහා 3.70% ක්ද ආයතනික කටයුතු ශක්තිමත් කිරීම සඳහා 3.19% ක්ද ඇස්තමේන්තුකර තිබුණි.

ජාතික අවශ්‍යතාවය පරිදි වාර්ෂික තේ නැවත වගා අනුපාතය 2% ක මට්ටමින් පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය මත 2019 වසර සඳහා වාර්ෂික ක්‍රියාත්මක සැලැස්මේ තේ නැවත වගාව යටතේ හෙක්ටයාර 376 තේ උදුරා දැමීමටද, හෙක්ටයාර 508 ක් පාංශු සංරක්ෂණය-I සඳහා ද ,හෙක්ටයාර 803 ක් පාංශු සංරක්ෂණය-II සඳහා ද, වගාව සඳහා හෙක්ටයාර 621 ක් ද, නඩත්තුව සඳහා හෙක්ටයාර 640 ක් ද ආවරණය වන ලෙස සංවර්ධන ප්‍රාග්ධන ප්‍රතිපාදන යටතේ රුපියල් මිලියන 303.72 ක් තේ නැවත වගා දිරිදීමනා සඳහා වෙන් කරන ලදි. වසර අවසානය වනවිට රුපියල් මිලියන 298.312 ක් තේ නැවත වගා සහනාධාර වශයෙන් සමස්ථ ප්‍රතිපාදන යටතේ ගෙවීමට හැකිව තිබුණි.

3.2 මධ්‍යකාලීන ප්‍රතිඵල පාදක ඉලක්ක හා කාර්යඵලය

මධ්‍යකාලීන ප්‍රතිඵල - 01

වසර 03 කදි වසරකට / හෙක්ටයාරයකට / සකස් කල තේ / කිලෝ ග්‍රෑම් පහත රට 2,500 දක්වා ද මැදරට 1,700 දක්වාද උඩ 1,600 දක්වාද වැඩි කිරීම

3.2.1 වාර්ෂිකව 2% මට්ටමින් තේ නැවත වගාව පවත්වා ගෙන යාම

කුඩා තේ ඉඩම්වල තේ නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි කිරීම පිණිස, අඩු අස්වනු සහිත පැරණි බිජ තේ ඉඩම්වල සහ වෙනත් හේතුමත නැවත වගා කිරීමට සිදුවන ඉඩම්වල අනුමත ටිකිලි තේ නැවත වගා කරවීමට අනුබල ලබා දීම සඳහා තේ නැවත වගා කිරීම ක්‍රියාත්මක කෙරේ.
නැවත වගාවේදී දැරීමට සිදුවන අධික පිරිවැය සඳහා සහන සැලසීම පිණිස තේ නැවත වගාව සඳහා ලබා දෙනු ලැබූ සහනාධාර මුදල 2015 වසරේ සිට හෙක්ටයාරයකට රු.500,000/- දක්වා වැඩි කර තිබේ.

2019 වසර සඳහා ආයතනයට ලද ප්‍රතිපාදනවලට අනුකූලව නැවත වගාවේ උඳුරා දැමීම අදියර පිණිස 6.8% ප්‍රමාණයක් ඉලක්ක කිරීමට හැකිවූ අතර එයින් සාක්ෂාත් කර ගත් ප්‍රතිශතය 6.8% කි. තේ නැවත වගාව අදියර සඳහා රු 6.1% ප්‍රතිශතයක් 2019 වසරේ ඉලක්ක කලද නැවත වගාවේ කාර්යවල ප්‍රතිශතය 6.3% ක් දක්වා වැඩි වී තිබුණි.

තවද 2010 වසරේ ආරම්භ කරනු ලැබූ ප්‍රතිඵල පාදක කළමනාකරණ ප්‍රවේශය අනුව 2019 වසර අවසානය වන විට කුඩා තේ ඉඩම්වල සාමාන්‍ය ඵලදායිතාවය හෙක්ටයාරයකට සකස් කල තේ කිලෝ ග්‍රෑම් 2,307 දක්වා වූ ඉලක්කය සකස් කල තේ කිලෝ ග්‍රෑම් 1,938 දක්වා අඩු වී තිබුණි. එසේ වුවද උපරිම නිෂ්පාදනය වාර්තා වූ 2014 වසරේ සාමාන්‍ය ඵලදායිතා අගය සකස් කල තේ කිලෝ ග්‍රෑම් 2,123 ක් වී තිබුණි.

රූප සටහන් අංක - 07 -A

තේ නැවත වගා සහනාධාර මුදල වැඩිකිරීම (හෙක්ටයාරයකට)



* නැවත වගා සහනාධාරය සංශෝධනය කර ඇත.
**උස් මැදි සහ පහත් බිම් සඳහා සහනාධාර මුදල සමාන වේ

රූප සටහන් අංක - 07 -B



නැවත වගාව සඳහා අයදුම් කිරීම

තේ නැවත වගාව කිරීම පිණිස ගොවීන් 8,033 දෙනෙකුගෙන් අයදුම්පත් ලබාගැනීම සඳහා 2019 ක්‍රියාත්මක සැලැස්ම මගින් ඉලක්ක කරනු ලැබීය.

ඒ අනුව ගොවීන් 3,308 දෙනෙකු නැවත වගාව සඳහා අයදුම් කර තිබුණි. එම සංඛ්‍යාවෙන් 2,289 ක් සඳහා අවසරපත්‍ර නිකුත් කරනු ලැබිණි. තේ නැවත වගා ආධාර ක්‍රමය සඳහා අයදුම් කිරීම 2018 වර්ෂයට සාපේක්ෂව 2019 වර්ෂයේදී 42% කින් අඩු වී තිබුණි.

රූප සටහන් අංක - 08



කාර්යඵලය

2019 වසරේ තේ නැවත වගාව සඳහා අවසරපත්‍ර නිකුත් කිරීම 46% කින් අඩු වී ඇති අතර අවසරපත්‍රලාභීන් පැරණි තේ උදුරා දැමීමට අයදුම්කල හෙක්ටයාර ප්‍රමාණය 55% කින් අඩු වී ඇත.

2019 වර්ෂය තුලදී තේ නැවත වගා කිරීම සඳහා තේ උදුරා දැමූ හෙක්ටයාර ප්‍රමාණය 376 කි. එම ප්‍රමාණය වාර්ෂික ඉලක්කගත භූමි ප්‍රමාණයෙන් එනම් හෙක්ටයාර 376 න් 100% ක ප්‍රගතියකි. පෙර වර්ෂයට සංසන්දනාත්මකව උදුරා දැමීමේ ප්‍රතිශතය 58% කින් අඩු වී බිම් ප්‍රමාණය හෙක්ටයාර 533 කින් ද අඩු වී ඇත. මෙම අඩු වීමට ප්‍රධාන හේතුව වී ඇත්තේ ප්‍රතිපාදන සීමා වීම හා කුඩා තේ හා රබර් වතු පුනර්පිළිවන ව්‍යාපෘතිය යටතේ උදුරා දැමීමේ ඉලක්කයක් පිහිටුවීම හේතුවෙන් ආයතනික නැවත වගා උදුරා දැමීමේ ඉලක්කය හෙක්ටයාර 376 දක්වා පහත වැටීමයි. 2018 වර්ෂයේ උදුරා දැමීමේ ආයතනික ඉලක්කය හෙක්ටයාර 850 ක් විය.

2019 වර්ෂයේ පස පුනරුත්ථාපනය නිම කරනු ලැබූ බිම් ප්‍රමාණය හෙක්ටයාර 742 කි. 2018 වර්ෂයේ මෙම බිම් ප්‍රමාණය හෙක්ටයාර 960 කි. ඒ අනුව මෙය 2018 වර්ෂයට සාපේක්ෂව 22.7% ක අඩු වීමකි.

වර්ෂයේ පස පුනරුත්ථාපනයට ඉලක්ක ගත බිම් ප්‍රමාණය හෙක්ටයාර 803 ක් වූ බැවින්, එහි කාර්යඵලය 92.4% ක ප්‍රගතියකි.

2019 වර්ෂයේ තේ නැවත වගා කල භූමි ප්‍රමාණය හෙක්ටයාර 639 ක් වූ අතර, ඉලක්ක ගත හෙක්ටයාර ප්‍රමාණය 621 කි. ඒ අනුව 103% ක ප්‍රගතියක් වර්ෂය තුලදී ලබාගෙන ඇත. 2018 වර්ෂයට සාපේක්ෂව වගා කල හෙක්ටයාර ප්‍රමාණය 37% කින් අඩු වී ඇත.

2018 වර්ෂයේ වගා කල බිම් ප්‍රමාණයට වඩා හෙක්ටයාර 388 කින් අඩු වී ඇත.

පස පුනරුත්ථාපනය - I වාරිකය



තේ වගා කිරීම



වසරකට පසු නඩත්තුව



වගු අංක 09

තේ නැවත වගා ආධාර ක්‍රමය
2018/2019 වර්ෂයේ භෞතික කාර්යසාධනය (හෙක්ටයාර)

කාර්යය	වර්ෂය	පහත් බිම්					උස් / මැද බිම්			ප්‍රගතියේ එකතුව	වාර්ෂික ඉලක්කය	පෙර වර්ෂය හා සැසඳීමේදී ප්‍රගතිය අඩු /වැඩි වීමේ ප්‍රතිශතය
		ගාල්ල	කළුතර	මාතර	රත්නපුර	කෑගල්ල	මහනුවර	නුවරඑළිය	ඌව			
1. ලැබුණු ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව	2018	1,070	529	650	1023	604	634	614	604	5,728	10,410	-63
	2019	300	368	327	567	461	585	324	376	3,308	8,033	-42
2. නිකුත් කල අවසර පත්‍ර සංඛ්‍යාව	2018	1,067	527	640	965	560	568	574	723	5,624	9,245	-57
	2019	299	363	313	554	426	477	266	416	3,114	6,869	-45
3. අවසර පත්‍ර ආවරණ බිම් ප්‍රමාණය	2018	272	163	180	282	157	150	140	136	1,480	1,181	-52
	2019	89	119	91	140	108	112	55	81	795	814	-46
4. බිම් සැකසීම	2018	163	104	118	198	102	77	75	72	909	850	1
	2019	64	62	39	56	72	30	21	32	376	376	-59
5. පස පුනරුත්ථාපනය - I වාරිකය	2018	151	101	145	173	95	87	50	48	850	868	-11
	2019	82	57	80	92	68	51	34	43	507	508	-40
6. පස පුනරුත්ථාපනය - II වාරිකය	2018	205	82	205	198	75	94	43	58	960	900	-8
	2019	144	95	110	137	81	88	46	42	743	803	-23
7. තේ නැවත වගා කිරීම	2018	226	96	223	207	82	92	36	65	1,027	1,060	37
	2019	137	71	99	116	64	77	24	51	639	621	-38
8. වසරකට පසු නඩත්තුව	2018	152	46	144	142	62	65	36	44	691	700	5
	2019	132	68	154	140	64	82	29	52	721	651	4
9. ගෙවන ලද වගා ආධාර මුදල (රුපියල් මිලියන)	2018	77.61	44.09	78.87	90.05	41.76	43.54	20.32	26.46	422.69	443.1	-8
	2019	54.83	32.11	44.51	57.25	37.32	30.08	18.89	23.32	298.31	303.72	-29

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

රූප සටහන් අංක - 09



තේ නැවත වගා සහනාධාර ලාභීන් සඳහා 2019 වසරේදී රුපියල් මිලියන 298.312 ක් ගෙවා තිබුණි. 2018 වර්ෂය හා සසඳනවිට ගෙවනු ලැබූ සහනාධාර මුදල රුපියල් මිලියන 124.38 කින් හෙවත් 29% කින් අඩු වී ඇත.

3.2.2 තේ අළුත් වගා ආධාර ක්‍රමය

ප්‍රතිපත්තිමය තීරණ මත 2003 වර්ෂයේ සිට අත්හිටවනු ලැබූ තේ අළුත් වගා ආධාර ක්‍රමය 2010 වර්ෂයේ සිට නැවත ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත. ඒ අනුව විකල්ප භෝග හා ආදායම් මාර්ග නොමැති ප්‍රදේශ සඳහා සීමිත ප්‍රතිපාදන යටතේ තේ අළුත් වගාව කිරීම සඳහා ප්‍රතිපාදන සැලසීමට කටයුතු කරන ලදි. තේ අළුත් වගාව සඳහා අවසර පත්‍ර නිකුත් කරනු ලැබූ උපරිම බිම් ප්‍රමාණය අක්කර 01කි. 2015.01.01 දින සිට අළුත් වගා සඳහා ගෙවනු ලබන සහනාධාර මුදල හෙක්ටයාර එකකට රුපියල් 400,000/- දක්වා වැඩිකර තිබේ.

බිම් සැකසීම



තේ වගා කිරීම



රූප සටහන් අංක - 10

තේ අළුත් වගා සහනාධාර මුදල වැඩි කිරීම/ හෙක්ටයාරයකට 1979 සිට 219 දක්වා



කාර්යඵලය

2019 වසරේදී තේ අළුත් වගාව සඳහා අයදුම්පත 3,281 ක් ලැබී තිබුණි. ඉලක්කගත ඉල්ලුම්පත සංඛ්‍යාව 4,906 කි. ප්‍රතිපාදන සීමාව සැලකිල්ලට ගෙන 2,887 දෙනෙකු සඳහා අවසරපත නිකුත් කරන ලදී.

වසර මුල අතුරු සම්මත ගිණුමෙන් ප්‍රතිපාදන වෙනකිරීම නිසා හා දෙවන කාර්තුව අවසානයේ අනුමත වූ ප්‍රතිපාදන මත ඉලක්කය හෙක්ටයාර 296 දක්වා අඩු කළද හෙක්ටයාර 295.5ක් වසරේ අළුත් වගාව සිදු කර 100% ක ප්‍රගතියක් අත් කර ගෙන තිබුණි.

හෙක්ටයාර 299 ක බිම් සැකසීම සඳහා වසරේ ඉලක්ක කල අතර හෙක්ටයාර 299 ක බිම් සැකසීම නිමකර තිබුණි. එනම් ඉලක්කයට අනුව 100% ප්‍රගතියකි.

2019 වසරේ තේ අළුත් වගාව වෙනුවෙන් ගෙවූ මුළු මුදල රුපියල් මිලියන 92 කි. 2018 වර්ෂයට සාපේක්ෂව ගෙවූ සහනාධාර මුදල රුපියල් මිලියන 29.3 කින් හෙවත් 24% කින් අඩු වී ඇත.

තේ අළුත් වගා ආධාර ක්‍රමය
2018/2019 වර්ෂයේ භෞතික කාර්යඵලය (හෙක්ටයාර)

වගු අංක 10

කාර්යය	වර්ෂය	පහත් බිම්					උස් / මැදි බිම්			එකතුව	ඉලක්ක	පෙර වර්ෂය හා සැසඳීමේදී අඩු/වැඩි වීමේ ප්‍රතිශතය
		ගාල්ල	කළුතර	මාතර	රත්නපුර	කෑගල්ල	මහනුවර	නුවරඑළිය	ඌව			
1. ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව	2018	579	836	627	370	985	260	284	151	4,092	4,893	63
	2019	339	782	338	200	1073	236	194	111	3,273	4,906	-20
2. නිකුත් කල අවසර පත්‍ර සංඛ්‍යාව	2018	560	837	615	341	870	240	261	175	3,899	3,999	68
	2019	331	782	326	175	842	163	136	131	2,886	4,553	-26
3. බිම් සැකසීම	2018	47.3	117.6	69.2	44.1	112	21.7	19.7	11.6	443.2	400	110
	2019	31.9	103.4	29.0	12	93.9	13.3	8.1	7.4	299	299	-32
4. වගාව	2018	48.5	117.9	69.6	42.5	111.7	21.6	16.8	6.8	435.4	400	116
	2019	29.4	103.1	29.7	14.8	91.6	13.5	6	7.9	296	295.5	-32
5. නඩත්තුව	2018	22.5	52	33.8	19	49.9	7.7	6.8	4.8	196.5	225	60
	2019	36.8	77.5	40.1	25.8	73.1	18.9	8.5	6.3	287	300	46
6. ගෙවන ලද ආධාර මුදල (රුපියල් මිලියන)	2018	9.6	34.67	20.05	13.04	31.99	6.09	3.34	2.86	121.64	117	91
	2019	8.2	31.84	10.13	4.27	27.78	4.68	2.72	2.67	92.29	92	-24

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

රූප සටහන් අංක - 11



• 2006 වර්ෂයේ සිට 2010 වර්ෂය දක්වා තේ අළුත් වගා සහනාධාර ක්‍රමය ක්‍රියාත්මක නොවුනි.

3.2.3 භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය

ඒකක වලදායිතාවය වර්ධනය කිරීම අරමුණු කර දළු නෙලන ටිකිලි තේ ඉඩම්වල නිර්දේශිත කප්පාදුව අනුගමනය කිරීමේදී පාළු සම්පූර්ණ කිරීම, පස සංරක්ෂණ ක්‍රම (කාණු පද්ධති/ගල් වැටි පිළිසකර කිරීම) හා සෙවන පාලනය කිරීම ඇතුළු අනෙකුත් වගා පිළිවෙත් ඒකාබද්ධව සිදු කිරීම (සෙවන, කප්පාදුව, වල්පැළ නෙලීම) වෙනුවෙන් භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය යටතේ දිරි දීමනා ගෙවනු ලැබේ.

ඉදිරි වර්ෂ 10ක කාලයක් තුළ සාර්ථක ලෙස තේ වගාව පවත්වාගෙන යාහැකි ඉඩම් මෙම ආධාර ක්‍රමය සඳහා නිර්දේශ කරනු ලබන අතර, තේ ඉඩම් දෙවන කප්පාදු අවස්ථාවට එළඹ තිබීම හෝ වගාවේ වයස අවුරුදු 07 ඉක්මවා තිබීම, ආධාර ලබා ගැනීම සඳහා සුදුසුකම් වේ.

මෙම ආධාර ක්‍රමය යටතේ, සමූහ වශයෙන් පිහිටි පාළු සපයා දළු නෙලන තේ වගාව පුනරුත්ථාපනය කිරීමේ පදනම මත අක්කරයකට පැළ 1,000ක් වාරික 2 කදී ආධාර ගෙවීම කරනු ලැබූහ.

2019.01.01 දිනට පසුව නිකුත් කරන අවසරපත්‍ර සඳහා පමණක් පාළු පැළයක් සඳහා පළමු වාරිකය රුපියල් 75.00 ක් දක්වා වැඩි කර සියළුම කළාප සඳහා බලපාන පරිදි තේ ඉඩම් හිමියෙකුට වසරකට දැනට දෙන උපරිම බිම් ප්‍රමාණය අක්කර 01 (හෙක්ටයාර 0.4041) සිට අක්කර 02 (හෙක්ටයාර් 0.8094) දක්වා වැඩි කර ඇත.

මෙම ආධාර ක්‍රමය යටතේ ආධාර ලබා ගැනීමට පාළු පැළ සිටුවන ස්ථානයේ මානා තෘණ අවම වශයෙන් වසර 1 1/2 ක් නඩත්තු කර තිබීම හෝ පැළ සිටුවන අවස්ථාවේදී එක් වලකට කොම්පෝස්ට් කිලෝ ග්‍රෑම් 2 ක් යෙදීම නිර්දේශ කර ඇත.මෙම ආධාර ලබා ගැනීමෙන් පසු ඉදිරි වසර දහයකට ආධාර ඉල්ලුම් කළ නොහැකිය.

කාර්යවිලය

2019 වර්ෂයේ භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය සඳහා 10,359 දෙනෙකු අයදුම්කර තිබුණි. මෙම ප්‍රමාණයෙන් 9,297 දෙනෙකු සඳහා අවසර පත්‍ර නිකුත් කරන ලදී. මෙය ඉලක්කගත අවසර පත්‍ර සංඛ්‍යාවෙන් 89.78% ක ප්‍රගතියකි. 2018 වසරට සාපේක්ෂව ඉල්ලුම්පත්‍ර සංඛ්‍යාව 210.9% කින් වැඩි වී ඇති අතර නිකුත් කරනු ලැබූ අවසර පත්‍ර සංඛ්‍යාව 197% කින්ද වැඩි වී තිබුණි.

පළමු වාරිකය ගෙවනු ලැබූ පැළ සංඛ්‍යාව 1,921,568 කි. මෙය ඉලක්කගත පැළ සංඛ්‍යාව වූ පැළ 2,400,000 න් 78% ක ප්‍රගතියකි. පෙර වර්ෂයට සාපේක්ෂව පළමු වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව 141% කින් වැඩි වී තිබේ.

දෙවන වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව 465,084 කි. මෙය ඉලක්කගත පැළ සංඛ්‍යාව වූ 640,000 න් 72% ක ප්‍රගතියකි. පෙර වර්ෂයට සාපේක්ෂව දෙවන වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව 4.9% කින් වැඩි වී තිබේ.

2019 වර්ෂයේදී භෝග පුනරුත්ථාපනය සඳහා සහනාධාර ලෙස රුපියල් මිලියන 138.99 ක් ගෙවා ඇත. මෙය පෙර වර්ෂයට සාපේක්ෂව රුපියල් මිලියන 123.29 ක වැඩි වීමකි.

වගාවෙන් වසරකට පසු නඩත්තුව



තේ වගා කිරීම



වගු අංක 11

භෝග පුනරුත්තාපන ආධාර ක්‍රමය
2018/2019 වර්ෂයේ භෞතික කාර්යඵලය (හෙක්ටයාර)

කාර්යය	වර්ෂය	පහත් බිම්					උස් / මැද බිම්			එකතුව	ඉලක්ක	පෙර වර්ෂය හා සැසඳීමේදී අඩු/වැඩි වීමේ ප්‍රතිශතය
		ගාල්ල	කළුතර	මාතර	රත්නපුර	කෑගල්ල	මහනුවර	නුවරඑළිය	ඌව			
1.ලැබුණු ඉල්ලුම් පත්‍ර සංඛ්‍යාව	2018	417	291	545	376	469	574	342	317	3,331	3755	20
	2019	2,568	632	1,531	1,213	724	1,642	1,035	1,014	10,359	11136	211
2.නිකුත් කල අවසර පත්‍ර සංඛ්‍යාව	2018	407	290	534	318	384	522	287	384	3,126	3132	25
	2019	2,532	631	1,482	976	518	1,342	796	1,020	9,297	10355	197
3.ඉලක්කගත පැළ සංඛ්‍යාව	2018	139,665	139,665	139,665	139,665	111,732	134,078	11,1731	83,799	1,000,000	1,000,000	10
	2019	489,938	128,930	412,578	371,320	77,358	335,220	361,006	283,650	2,460,000	2,460,000	146
4.පළමු වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව	2018	81,936	83,902	147,105	86,030	131,890	120,310	83,888	62,469	797,530	1,000,000	41
	2019	354,877	157,872	282,480	197,855	170,427	393,865	176,626	187,566	1,921,568	2,460,000	141
5.දෙවන වාරිකය ගෙවූ පැළ සංඛ්‍යාව	2018	45,216	39,919	65,674	36,872	87,167	101,572	31,480	34,396	442,296	500,000	49
	2019	47,476	56,616	87,424	51,185	66,135	90,040	27,049	38,659	465,084	640,000	5
6.ගෙවන ලද ආධාර මුදල (රුපියල් මිලියන)	2018	1.682	1.661	2.685	1.697	2.844	2.778	1.259	1.085	15.691	20	34
	2019	23.55	10.05	20.12	15.33	13.24	30.064	13.06	13.58	138.99	148.77	785

මූලාශ්‍රය :කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

රූප සටහන් අංක -12



ගුණාත්මක තේ පැළ සැපයීම

වැඩි දියුණු කල නව තේ ප්‍රභේද සහිත මව් වගා

තේ නිෂ්පාදනය හා ඵලදායිතාව වර්ධනය කර ගැනීම සඳහා ගුණාත්මක බවින් යුත් රෝපණ ද්‍රව්‍ය කුඩා තේ වතු හිමියන්ට ලබා ගැනීමට පහසුකම් සලසාලීම මව් තවාන් පවත්වාගෙන යාමේ අරමුණ වේ.

ඒ අනුව වැඩි දියුණු කල ප්‍රභේද සහිත ගුණාත්මක බැවින් යුත් මව් වගාවන් ආයතනය විසින් පවත්වා ගනිමින් කුඩා තේ වතු හිමියන්ට, වාණිජ තේ තවාන්කරුවන්ට සහ ආයතනයේ තේ තවාන් සඳහා අතු 217,123 සැපයීමට කටයුතු කරන ලදි. මින් කුඩා තේ වතු හිමියන්ට රිකිලි අතු 26% ක්, වාණිජ තේ තවාන් කරුවන්ට 3.4% ක්, ආයතනික තේ තවාන් සඳහා 69.8% ක් හා සමිති සහ වෙනත් 0.8% ලෙස නිකුත් කර ඇත. මෙම ප්‍රමාණය පෙර වර්ෂයට සාපේක්ෂව 23% කින් අඩු වී තිබේ. මව් වගා මගින් රිකිලි අතු නිෂ්පාදනයේ වාර්ෂික ඉලක්කය 624,500 ක් විය. ඒ අනුව 35% ක ප්‍රගතියකි. මව් වගා මගින් වැඩි දියුණු කල රිකිලි අතු නිකුතුව පිළිබඳ සවිස්තර තොරතුරු උපලේඛන අංක 8-A හි දක්වා ඇත.

වාණිජ තේ තවාන්

තේ නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි කිරීම අරමුණු කර ගුණාත්මක පැළ කුඩා තේ වතු හිමියන් වෙත ලබාගැනීමට පහසු කරවීම සඳහා ගුණාත්මක බවින් යුත් වාණිජ තේ තවාන් ආයතනයේ ලියාපදිංචි තේ තවාන් වශයෙන් පවත්වාගෙන යාම හා අධීක්ෂණය කිරීම අරමුණ වේ.

ඒ අනුව වසර 2018/2019 සඳහා ප්‍රාදේශිය කාර්යාල මගින් වාණිජ තේ තවාන් 870 ක් ලියාපදිංචි කරන ලදි. එම තවාන්හි පැළ ධාරිතාවය පැළ මිලියන 38.76 කි. මෙයින් තවාන් 682 ක පළමු පරීක්ෂණය මගින් පැළ මිලියන 17.43 ක් ද, තවාන් 457 ක පැළ මිලියන 11.56 ක් සඳහා දෙවන පරීක්ෂණයද, තවාන් 236 ක පැළ මිලියන 3.68 ක් සඳහා තෙවන පරීක්ෂණය මගින් ද නිර්දේශ ලබාදී තිබුණි.
2019/2020 වර්ෂය සඳහා වාණිජ තේ තවාන් 828 ක් වසර අවසානය වන විට ලියාපදිංචි කර තිබුණි. අපේක්ෂිත පැළ ධාරිතාවය මිලියන 37.55 කි. තවාන් 366 ක පළමු පරීක්ෂණය අවසන් කර තිබුණි.
එම තවාන්වල සහතික කරනු ලැබූ පැළ සංඛ්‍යාවන්හි සවිස්තර තොරතුරු උපලේඛන අංක $8\text{-}C_1$ හා $8\text{-}C_2$ මගින් දැක්වේ.

වගු අංක 12 **වාණිජ තේ තවාන්**

අවසරපත් නිකුතුව සහ පැළ **ධාරිතාවය**

(2018 / 19) සහ (2019 / 20)

දිස්ත්‍රික්කය	නිකුත් කල අවසරපත් ගණන		පැළ ධාරිතාවය	
	2018/19	2019/20	2018/19	2019/20
ගාල්ල	154	127	6,798,400	5,313,250
මාතර	210	254	6,801,000	8,183,000
කළුතර	61	6	2,960,000	375,000
රත්නපුර	52	131	5,947,000	12,355,500
කෑගල්ල	90	71	4,855,000	3,602,000
මහනුවර	165	59	7,011,000	2,894,000
නුවරඑළිය	24	32	1,103,000	1,132,000
ඌව	114	148	3,285,945	3,698,844
එකතුව	**870**	**828**	**38,761,345**	**37,553,594**

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

ආයතනික තේ තවාන්

කුඩා තේ වතු හිමියන්ට අවශ්‍ය තේ පැළ මිලදි ගැනීමේදී වෙළඳපල මිල ගණන් පාලනය කර ගැනීම හා ගුණාත්මක පැළ නිෂ්පාදනය පවත්වාගෙන යාම ආදර්ශයක් ලෙස පැවතිය යුතුවීම ආයතනික තේ තවාන් හි අරමුණු වේ.
ඒ අනුව 2018 /2019 නිරිත දිග හා ඊසාන දිග වගා කන්න සඳහා තවාන් 10 මගින් රිකිලි තේ පැළ 1,265,127 ක් නිෂ්පාදනය කරන ලදි. අළෙවි කරනු ලැබූ සමස්ත පැළ සංඛ්‍යාව 853,268 කි. තවාන් මට්ටමින් පැළයක අලෙවි මිල උපලේඛණ අංක 8 -B හි දක්වා ඇත.

පැළයක ඇස්තමේන්තුගත සාමාන්‍ය පිරිවැය රුපියල් 23.86 ක් වුවද පැළයක සැබෑ සාමාන්‍ය පිරිවැය රුපියල් 16.84 කි. ඇතැම් තවාන්වල ඇස්තමේන්තුගත පිරිවැයට වඩා සත්‍ය පිරිවැය අඩුවීමිද, ඇතැම් තවාන්වල එම පිරිවැය වැඩිවීද තිබුණි.

වගා ආදර්ශන

සෑම සේවා කොට්ඨාශයකම වගා ආදර්ශන 03 බැගින් ආදර්ශන 432 ස්ථාපිතකර ක්ෂේත්‍ර පුහුණු පාසැල් ලෙස ඒවා සංවර්ධනය කිරීම සඳහා මූලික කටයුතු ලෙස උස් සෙවන ස්ථාපනය සහ යහපත් කෘෂිකාර්මික ක්‍රම අනුගමනය කිරීමට කටයුතු කරන ලදී





යාන්ත්‍රිකරණය

පවතින ශ්‍රම හිඟයට විසඳුමක් ලෙස කුඩා තේ ඉඩම් වල යන්ත්‍ර භාවිතයෙන් තම කටයුතු කරගැනීම සඳහා ප්‍රාදේශීය කාර්යාල මට්ටමින් යාන්ත්‍ර කට්ටල 02 බැගින් ලබා දී, යාන්ත්‍රිකරණයට පෙලඹවීමට ගොවියා නැඹුරු කර ඇත.



වගු අංක 13 - i
ව්‍යාප්ති හා උපදේශ සේවා - ඵලදායීතා වර්ධනය

පුහුණු වැඩසටහන් සංඛ්‍යාව-(1) සහ සහභාගී සංඛ්‍යාව-(2)

ප්‍රා.කාර්යාලය	ගාල්ල		මාතර		කළුතර		රත්නපුර		කෑගල්ල		මහනුවර		නුවරඑළිය		යාව		එකතුව		ඉලක්කය	
වැඩසටහන	1	2	1	2	1	2	1	2	1	2	1	2	1	2	1	2	**1**	**2**	**1**	**2**
අවසර පත්‍ර හිමියන් දැනුවත් කිරීමේ පුහුණුව	65	1829	80	2377	65	1761	52	1456	62	1809	118	3198	72	1879	72	1673	**586**	**15982**	**696**	**20692**
තවාන්කරුවන් සඳහා පුහුණුව	26	489	24	524	17	145	19	448	18	246	15	212	5	117	24	487	**148**	**2668**	**295**	**3974**
තේ වගාව පිළිබඳ පුහුණුව	56	1795	63	1412	31	779	28	798	22	522	57	1723	8	281	33	759	**298**	**8069**	**293**	**6179**
නිසි කෘෂිකර්ම පිලිවෙත් පිළිබඳ පුහුණුව	465	11831	321	7085	342	8748	472	10030	185	4714	334	7816	139	5485	313	7415	**2571**	**63124**	**3842**	**87276**
ශක්ත භාවිතය පිළිබඳ පුහුණුව	28	687	33	911	18	533	17	630	13	511	29	975	3	91	13	346	**154**	**4684**	**181**	**7190**
දළු නෙලීම පිළිබඳ පුහුණුව	47	1124	71	1176	42	1160	91	1783	29	555	27	812	31	1023	52	2009	**390**	**9642**	**476**	**9800**
දළු ගුණාත්මය පිළිබඳ පුහුණුව	52	1891	56	1821	31	962	49	1544	30	742	28	1244	14	1735	58	2498	**318**	**12437**	**434**	**28783**
තේ පාදක ගොවිපල පුහුණුව	26	553	17	444	14	718	8	105	5	117	15	312	3	53	7	224	**95**	**2526**	**133**	**1970**
ව්‍යාවසායකත්ව සංවර්ධන පුහුණුව	2	100	8	140	1	50	3	55	0	0	0	0	0	0	1	29	**15**	**374**	**8**	**400**
එකතුව	**767**	**20299**	**673**	**15890**	**561**	**14856**	**739**	**16849**	**364**	**9216**	**623**	**16292**	**275**	**10664**	**573**	**15440**	**4575**	**119506**	**6358**	**166264**

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

3.2.4 ව්‍යාප්ති හා උපදෙස් පුහුණු වැඩසටහන්

සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාප්ති හා පුහුණු උපදෙස් වැඩසටහන් 6,358 සැලසුම් කරන ලදී. එම වැඩසටහන් සඳහා ඉලක්කගත ගොවීන් සංඛ්‍යාව 166,264කි.

කුඩා තේ ඉඩම්වල නිෂ්පාදනය හා ඵලදායිතාවය වැඩි කිරීම පිණිස 2019 වසරට සැලසුම් කරන ලද පුහුණු වැඩසටහන් ගණන 6,358 ක් වූ අතර, වැඩසටහන් 4,575 ක් ක්‍රියාත්මක කිරීමට හැකි විය. ඒ අනුව ඉලක්කය පරිදි වැඩසටහන් ප්‍රගතිය 71.9% කි. ඉලක්ක කරන ලද ගොවි සහභාගිත්වය 166,264 කි. සහභාගි වූ ගොවි සංඛ්‍යාව 119,506 ක් වී තිබේ.ගොවි සහභාගිත්ව ප්‍රගතිය 72% ප්‍රතිශතයකි.

කුඩා තේ ඉඩම්වල නිෂ්පාදනය හා ඵලදායිතාවය වර්ධනය කර ගැනීමට අදාලව තේ ඉඩම්වල පාංශු ආම්ලිකතාව විධිමත් ආකාරයෙන් පවත්වා ගත යුතු බැවින්, ඒ සඳහා වාර්ෂිකව පාංශු ආම්ලිකතාව පරීක්ෂණය සඳහා පස් සාම්පල 49,230 පහත පරිදි පරීක්ෂා කිරීම සඳහා ඉලක්ක කර තිබූ අතර වර්ෂය තුල පස් සාම්පල 35,230 ක් (70.56%) පරීක්ෂා කර තිබුණි.

වගු අංක 13 –ii

ඒක පුද්ගල ව්‍යාප්ති කටයුතු හා පාංශු පරීක්ෂණ සංඛ්‍යාව

ප්‍රාදේශීය කාර්යාලය		ගාල්ල	මාතර	කළුතර	කෑගල්ල	මහනුවර	නුවරඑළිය	රත්නපුර	ඌව	එකතුව
පාංශු පරීක්ෂාව	ඉලක්කය	2,300	8,000	5,200	4,400	9,600	4,120	10,000	5,610	49,230
	ප්‍රගතිය	7,098	5,585	3,912	1,432	5,051	4,474	4,969	2,709	35,230
ඒක පුද්ගල ව්‍යාප්ති	ඉලක්කය	8,280	7,200	4,680	3,960	8,640	4,320	9,000	5,760	51,840
	ප්‍රගතිය	2,386	3,126	1,194	1,294	1,701	451	1,575	1,228	12,955

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව 2019

මධ්‍යකාලීන ප්‍රතිඵල - 02
වසර 3 කදී කම්හල් මට්ටමින් අමු දළු ගුණාත්මය 65% දක්වා වර්ධනය කිරීම

කුඩා තේ වතු හිමියන්ගේ ආදායම වර්ධනය කරවීමට නම් වැඩි ඵලදාවක් සමඟ අවම නිෂ්පාදන පිරිවැය හා ඉහළ වෙළඳපල මිල පවත්වා ගැනීම ඉතා වැදගත් සාධක වේ. නිෂ්පාදන පිරිවැය අවම කර ගැනීම සඳහා ජාතික පොහොර සහනාධාර ක්‍රමය මගින් අඩු මිලට පොහොර ලබා ගැනීමට ගොවීන්ට හැකිවී ඇති නමුදු , අමු දළු සඳහා ඉහල වෙළඳපල මිල ලබා ගැනීම සඳහා ගුණාත්මක බවින් යුතු අමු දළු නිෂ්පාදනය වර්ධනය විය යුතු වේ.

දළු ගුණාත්මය වර්ධනය කිරීම සඳහා දළු නෙලන්නන් 9,800 ක් පුහුණු කරවීමත්, ගුණාත්මක දළු පමණක් කම්හල් සඳහා භාර ගැනීම අනිවාර්ය කෙරෙන නිති රීති පද්ධතින් ප්‍රවර්ධනය කිරීමත්, දළු සපයන්නන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීමත්, සහ දළු ගුණාත්මය පිළිබඳ කුඩා තේ වතු හිමියන් දැනුවත් කිරීම යන කටයුතු මෙම ප්‍රතිඵලය ලබා ගැනීම සඳහා අපේක්ෂිත ක්‍රියාකාරකම් විය. ඒ අනුව 2019 වසරේදී දළු ගුණාත්මය වර්ධනය කිරීම පිණිස පුහුණු වැඩසටහන් 434 ක් සැලසුම් කරනු ලැබූ අතර වැඩසටහන් 318 ක් ක්‍රියාත්මක කර ඇත. (වගු අංක 14) සහභාගිවූ ගොවීන් සංඛ්‍යාව 12,437 වූ අතර වසර මුල සැලසුම් කල ඉලක්කගත ගොවීන් සංඛ්‍යාව 28,783 කි. මේ අනුව සහභාගිත්වයේ ප්‍රගතිය 43% කි.

වගු අංක 14

දළු ගුණාත්මය වර්ධන පුහුණු වැඩසටහන් සංඛ්‍යාව සහ සහභාගි ගොවි සංඛ්‍යාව-2019

ප්‍රාදේශීය කාර්යාලය	අයිතමය	දළු නෙලන්නන් පුහුණුව	දළු සපයන්නන් දැනුවත් කිරීම පිළිබඳ පුහුණුව	දළු ගුණාත්මය පිළිබඳ පුහුණුව	එකතුව
		(2.1.1)	(5.2.1)	(2.2.1)	
ගාල්ල	වැඩසටහන්	47	2	52	101
	සහභාගිත්වය	1,124	100	1,891	3,115
මාතර	වැඩසටහන්	71	8	56	135
	සහභාගිත්වය	1,176	140	1,821	3,137
කළුතර	වැඩසටහන්	42	1	31	74
	සහභාගිත්වය	1,160	50	962	2,172
කෑගල්ල	වැඩසටහන්	29	0	30	59
	සහභාගිත්වය	555	0	742	1,297
මහනුවර	වැඩසටහන්	27	0	28	55
	සහභාගිත්වය	812	0	1,244	2,056
නුවරඑළිය	වැඩසටහන්	31	0	14	45
	සහභාගිත්වය	1023	0	1,735	2,758
රත්නපුර	වැඩසටහන්	91	3	49	143
	සහභාගිත්වය	1,783	55	1,544	3,382
ඌව	වැඩසටහන්	52	1	58	111
	සහභාගිත්වය	2,009	29	2,498	4,536
එකතුව	**වැඩසටහන්**	**390**	**15**	**318**	**723**
	සහභාගිත්වය	**9,642**	**374**	**12,437**	**22,453**
ඉලක්කය	**වැඩසටහන්**	**476**	**8**	**434**	**918**
	සහභාගිත්වය	**9,800**	**400**	**28,783**	**38,983**

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

දළු නෙලන්නන් පුහුණුව





අපේක්ෂිත ප්‍රතිඵල මැනීම සඳහා කම්හල් මට්ටමින් හොඳ දළු ප්‍රතිශතය යන දර්ශකය යොදාගනු ලබන අතර, එම ප්‍රතිඵල සාර්ථකත්වය පිණිස අධිකාරිය මෙන්ම ශ්‍රී ලංකා තේ මණ්ඩලයෙහි, තේ කොමසාරිස් අංශය හා ශ්‍රී ලංකා තේ පර්යේෂණායතන සම ඒකාබද්ධ ප්‍රයත්නයක් යොදමින් කටයුතු කිරීම අත්‍යාවශ්‍ය වේ.

සමස්ත වශයෙන් ව්‍යාප්ති උපදෙස් හා පුහුණු වැඩසටහන් සඳහා රුපියල් මිලියන 19.32 ක්ද, පුහුණු ද්‍රව්‍ය සඳහා රුපියල් මිලියන 0.377 ක්ද ප්‍රදර්ශන/ත්‍යාග ප්‍රධානෝත්සවය සඳහා රුපියල් මිලියන 8.64 ක්ද වනසේ රුපියල් මිලියන 29.07 ක් වැය කර තිබුණි.

මධ්‍යකාලීන ප්‍රතිඵල - 03

වසර 03 ක් තුළ ප්‍රජා මූලික සංවිධාන 50% කින් ශක්තිමත් කිරීම

1989 වර්ෂයේ අග භාගයේදී ආරම්භ කරනු ලැබූ කුඩා තේ වතු සංවර්ධන සමිති ක්‍රමය නීතිගත සංවිධාන බවට පත් කිරීම සඳහා 1991 අංක 36 දරණ පනතින් සංශෝධිත, ජාතික රාජ්‍ය සභාවේ 1975 අංක 35 දරණ කුඩා තේ වතු සංවර්ධන පනතෙහි 15 වන වගන්තියේ 2 වන උප වගන්තියේ (ඔ ඕ) ඡේදය යටතේ පැවරී ඇති බලතල අනුව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් අංක 878/15 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් 1995 අංක 01 දරණ කුඩා තේ වතු සංවර්ධන සමිති රීති ප්‍රකාශයට පත්කර තිබේ.

2019 වසර අවසානය වන විට කුඩා තේ වතු සංවර්ධන සමිති 1,475 ක් ලියාපදිංචිව තිබූ අතර, එයට අයත් සාමාජිකයන් සංඛ්‍යාව 329,963 ක් විය. ඒ අනුව 2018 වසරට සාපේක්ෂව 2019 වර්ෂයේ සමිති සංඛ්‍යාව 1.02% කින් වර්ධනය වී තිබුණි.

දිස්ත්‍රික් සංවිධාන 08 කින් යුතුව සමස්ත ලංකා සමිති සංවිධානයකින් යුතුව සමිති පද්ධතිය ක්‍රියාත්මක වේ. 2018 වසරේ සියලු සමිති සංවිධානවල සහ සමස්ත ලංකා සංවිධානයේ නිලධරණයන්ද පවත්වන ලදි. 2018 සමිති ව්‍යාවස්ථා සංශෝධනයක් සිදුකර ඇත.

වගු අංක 15 - i

කුඩා තේ වතු සංවර්ධන සමිති ව්‍යාප්තිය
2018/2019

කාර්යාලීය බල ප්‍රදේශය	සමිති සංඛ්‍යාව		සාමාජික සංඛ්‍යාව	
	2018	**2019**	**2018**	**2019**
රත්නපුරය	289	291	97,599	107,693
ඌව (බදුල්ල සහ මොණරාගල)	163	165	29,916	25,913
නුවරඑළිය	123	127	13,984	14,610
මහනුවර සහ මාතලේ	223	225	21,429	21,832
ගාල්ල	215	216	61,441	53,602
මාතර සහ හම්බන්තොට	191	192	71,518	52,488
කෑගල්ල	141	144	26,811	28,519
කළුතර	115	115	24,727	+25,306
එකතුව	**1,460**	**1,475**	**347,425**	**329,963**

රූප සටහන් අංක - 13



මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

2018 වසරට සාපේක්ෂව 2019 වසරේදී අලුතෙන් ලියාපදිංචි සමිති සංඛ්‍යාව 15 කින් වර්ධනය වී ඇති අතර සමිති සාමාජිකත්වය ලබා ගැනීම 5% කින් (17,462) අඩු වී ඇත.

කුඩා තේ වතු සංවර්ධන සමිති වඩාත් සවලදායී ලෙස ක්‍රියාත්මක වීම ශක්තිමත් කිරීම සඳහා 2019 වසරේදී විවිධ වැඩසටහන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි පවත්වන ලදී. සමස්ත වශයෙන් ප්‍රජා මූලික සංවිධාන ශක්තිමත් කිරීම සඳහා ආයතනය විසින් රුපියල් මිලියන 7.522 ක් වැය කර තිබුණි.

සමිති ආශ්‍රිත ක්‍රියාකාරකම් 2019

- සමිති නායකයින් අතර දැනුම අවබෝධය හා අත්දැකීම් හුවමාරු කර ගැනීම අරමුණුකොට අන්තර් දිස්ත්‍රික් චාරිකා වැඩසටහන් 02 ක් පැවැත්වීම.
- සමිති පාදකව තෝරාගත් තරුණ කුඩා තේ වැවිලිකරුවන් සඳහා නායකත්ව හා ව්‍යවසායකත්වය පිළිබඳ දින 03 ක විශේෂ නේවාසික පුහුණු වැඩසටහන් 05ක් ප්‍රතිලාභීන් 175 දෙනෙකුට හන්තාන ජාතික පුහුණු මධ්‍යස්ථානයේදී පැවැත් වීම.
- අධිකාරියේ ලියාපදිංචි සියලු ප්‍රාථමික සමිති 1,475 ක් 2019 - 2020 දෙවර්ෂය සඳහා නිලවරණ පවත්වා අවසන් කිරීම.

වගු අංක 15 - ii

ප්‍රාදේශිය කාර්යාල මට්ටමින් සමිති තොරතුරු -2019

ප්‍රාදේශිය කාර්යාල බල ප්‍රදේශය	මුළු සමිති සංඛ්‍යාව	සාමාජික සංඛ්‍යාව	පොහොර බෙදන සමිති සංඛ්‍යාව	දළුරුස් කරන සමිති සංඛ්‍යාව	ලබා ගත් ශ්‍රේණිය		
					සතුටුදායක	සාමාන්‍ය	දුර්වල
කෑගල්ල	144	28,519	18	14	35	89	20
මහනුවර	225	21,832	9	4	40	119	44
රත්නපුර	291	107,693	0	1	22	226	45
ඌව	165	25,913	44	32	48	72	32
මාතර	192	52,488	4	4	11	82	94
ගාල්ල	216	53,602	16	4	70	111	28
කළුතර	115	25,306	4	7	15	76	17
නුවරඑළිය	127	14,610	9	6	29	75	14
එකතුව	1,475	329,963	104	72	270	850	294

තේ පරීක්ෂක කොට්ඨාශ පුරප්පාඩු හේතුවෙන් ශ්‍රේණි ගත කිරීමේදී සමිති 61 ක තොරතුරු ලබා දී නොමැත.

මධ්‍යකාලීන ප්‍රතිඵල 04
වසරක් තුල වඩාත් සවලදායී ලෙස ක්‍රියාත්මක වීම සඳහා ආයතනය ශක්තිමත් වීම

ආයතනයේ අභිමතාර්ථ පරිදි කුඩා තේ ඉඩම් සංවර්ධන කාර්යය ප්‍රමුඛතාව ගනු ලබන අතර එයින් වාර්ෂික තේ නැවත වගා ප්‍රතිශතය එක් විශේෂිත කාර්ය සාධන දර්ශකයක් වේ. 2019 වසරේ තේ නැවත වගා හෙක්ටයාර 621 ක් ඉලක්ක කල අතර, සාක්ෂාත් ප්‍රතිශතය 103 % කි. මුළු නැවත වගා සඳහා මූදල් රුපියල් මිලියන 303.72 ඉලක්ක කල අතර සාක්ෂාත් කරගත් ප්‍රගති ප්‍රතිශතය 98.2% කි.

කාර්යමණ්ඩල පුරප්පාඩු වාර්ෂිකව 5% කට වඩා අවම මට්ටමින් පවත්වාගෙන යාම කෙටිකාලීන ප්‍රතිඵලයක් ලෙස ආයතනයේ අපේක්ෂාව වුවද , 2019 වසර අවසානය වන විට කාර්යමණ්ඩල පුරප්පාඩු ප්‍රතිශතය 10% ක් විය.
ආයතනය අපේක්ෂිත විගණන මතය අනනුසිමිත වුවද 2019 වසරේ තත්ත්වාගණනය කළ විගණන මතය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මතය වේ.

රාජකාරී කටයුතු සඳහා ආයතනික කාර්යමණ්ඩලයේ ධනාත්මක ආකල්ප ඇතිකර ගැනීමට ආයතනයේ විවිධ ශ්‍රේණීන් නියෝජනය වන ලෙස 2019 වසරේ දේශීය පුහුණු වැඩසටහන් 15 ක් නිලධාරීන් 58 දෙනෙකු සහභාගි කර 2019 වසරේ සිදු කර ඇත. එයට සහකාර කළමනාකරුවන් දෙදෙනෙකු" අභ්‍යන්තර විගණක" ගිණුම් නිළධාරී" පරිපාලන නිලධාරී සහ කළමනාකරණ සහකාර මහත්ම මහත්මින් සහභාගි වී ඇත.

විදේශ පුහුණු වැඩසටහන් 5ක් සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී(වැ.බ)" ප්‍රාදේශිය කළමනාකරුවෙක්" සහකාර කළමනාකරුවෙක් හා තේ පරීක්ෂක/ව්‍යාප්ති නිලධාරීන් ඇතළු නිලධාරීන් 11ක් සහභාගි වී ඇත.

හන්තාන පුහුණු මධ්‍යස්ථානයේ කලාප තේ සංවර්ධන නිලධාරීන් හා තේ පරීක්ෂක / ව්‍යාප්ති නිලධාරීන් 115 ක් සඳහා වැඩසටහන් 04ක් සිදුකර ඇත. බාහිර ආයතනවල පුහුණු වැඩසටහන් සඳහාද කාර්යමණ්ඩලය සහභාගි කරවීමට වසර තුලදී කටයුතු කර ඇත.

කාර්යපාදක ඇගයීම් ක්‍රමය කේෂ්ත්‍ර කාර්යමණ්ඩලය සඳහා 2019 වසරේ ක්‍රියාත්මක විය.

මධ්‍යකාලීන ප්‍රතිඵල 05
වසර 03 ක් තුලදී ඉඩම්වලින් 10% ක් අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමු කරවීම.

කුඩා තේ ඉඩම් හිමියන්ගේ ජීවන තත්ත්වය වර්ධනය කිරීම සඳහා අමතර ආදායම් ඉපැයීමේ කටයුතු සඳහා යොමුකර වීම හඳුනා ගෙන තිබේ. මේ අනුව තේ පාදක ගොවිපල කළමනාකරණ ක්‍රමය වාර්ෂිකව තේ ඉඩම් 1,000 ක් සඳහා හඳුන්වාදීමත්, මේ යටතේ අදාල වර්ෂය තුලදී වැඩසටහන් 133 ක් සැලසුම් කරනු ලැබූ අතර වැඩසටහන් 95 ක් ක්‍රියාත්මක කර තිබේ. ඒ සඳහා ඉලක්කගත ගොවීන් සංඛ්‍යාව 1,970 ක් වූ අතර සහභාගි වූ ගොවීන් ගණන 2,526 කි. අදාල වර්ෂයේදී පහත පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

වගු අංක 16

තේ පාදක ගොවිපල පුහුණුව (5.1.3)

වැඩසටහන් සංඛ්‍යාව හා සහභාගි ගොවි සංඛ්‍යාව-2019

	ප්‍රාදේශිය කාර්යාලය								
	ගාල්ල	මාතර	කළුතර	කෑගල්ල	මහනුවර	නුවරඑළිය	රත්නපුර	ඌව	එකතුව
වැඩසටහන්									
ඉලක්කය	23	20	13	11	22	3	25	16	**133**
ප්‍රගතිය	26	17	14	5	15	3	8	7	**95**
සහභාගිත්වය									
ඉලක්කය	230	357	260	220	440	53	250	160	**1,970**
ප්‍රගතිය	553	444	718	117	312	53	105	224	**2,526**

මූලාශ්‍රය : කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ ප්‍රගති වාර්තාව

ඉහත සඳහන් ප්‍රතිඵල මැනීම පිණිස කුඩා තේ ඉඩම්වල අනෙකුත් භෝග පවත්නා ප්‍රතිශතය ප්‍රධාන කාර්යපාදක දර්ශකය වශයෙන් හඳුනා ගෙන තිබේ.

3. 3 කුඩා තේ ඉඩම්වල ආයෝජනය ප්‍රවර්ධනය කිරීමේ විශේෂ ව්‍යාපෘති කටයුතු

3.3.1 කුඩා තේ වතු හිමියන් සඳහා වන ලංකා බැංකු විශේෂ ණය යෝජනා ක්‍රමය

ලංකා බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ඉහත සඳහන් ණය යෝජනා ක්‍රමය සඳහා 2013 වර්ෂයේ ඔක්තෝම්බර් මස කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ණය ගිවිසුම අත්සන් කරනු ලැබීය.
තේ වගා කරන සියළු දිස්ත්‍රික්කයන් ආවරණය වන පරිදි ක්‍රියාත්මක කරනු ලබන මෙම ණය ව්‍යාපෘතිය මගින් අක්කර 01 ක උපරිම බිම් ප්‍රමාණයකට යටත්ව රුපියල් ලක්ෂ 05 ක උපරිමය දක්වා තේ නැවත වගාව , තේ අළුත් වගාව , තේ තවාන් පිහිටුවීම සහ අමතර ආදායම් උත්පාදන කටයුතු සඳහා ප්‍රධාන සංවර්ධන කාර්ය සඳහා කාලීන සහනදායී පොලි අනුපාතිකයක් යටතේ බැංකුව ණය මුදල් සපයනු ලැබේ.

2019 වර්ෂය අවසාන වන විට කුඩා තේ වතු හිමියන් 784 ක් සඳහා රුපියල් මිලියන 264.22 ප්‍රමාණයක් සඳහා ආයතනය විසින් ණය නිර්දේශ ලබාදී තිබුණි. මෙම ප්‍රමාණයෙන් තේ ගොවීන් 551 දෙනෙකු සඳහා රුපියල් මිලියන 186.26 ක් නැවත වගාව සඳහාද , රුපියල් මිලියන 45.34 ක් තේ ගොවීන් 125 දෙනෙකු සඳහා තේ තවාන් සංවර්ධනයටද , රුපියල් මිලියන 30.69 ක් ගොවීන් 98 දෙනෙකු සඳහා තේ අලුත් වගාව වෙනුවෙන්ද ණය නිර්දේශ ලබා දී තිබුණි.

විශේෂ තවාන් ඇති කිරීම.

1. බණ්ඩාරවෙල ප්‍රාදේශිය කාර්යාලය

වර්ල්ඩ් විෂන් ආයතනය සමඟ එක්ව පැළ 800,000ක් පමණ වූ තවාන් ඇති කිරීමේ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇති අතර ඒ යටතේ වැවතැන්න හා වටගොම්මන කුඩා තේ වතු සංවර්ධන සමිතිවල සාමාජිකයන් 37 දෙනෙක් තෝරාගෙන ඔවුන් සඳහා සෙවන දැල්, පොලිතින් තවාන් බඳුන්, හා දළු එකතු කිරීමේ මධ්‍යස්ථාන ඉදි කිරීම සඳහා නොමිලේ වහළ ආවරණ වර්ල්ඩ් විෂන් ආයතනය මගින් ලබා දී තිබේ. ප්‍රතිලාභීන් පුහුණු කිරීම සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ නිලධාරීන්ගේ දායකත්වය සපයන ලදී.

ලෝක ආහාර හා කෘෂිකර්මය සංවිධානයේ ආධාර යටතේ ක්‍රියාත්මක වන භායනයට පත් වූ කෘෂිකාර්මික ඉඩම් ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘතිය යටතේ මාලිගාතැන්න ග්‍රාම නිලධාරී වසමේ ඇත්තලගෙදර ග්‍රාමයේ තෝරාගත් තේ ඉඩම් 44ක් සඳහා කාණු/ගල්වැටි හා සැවැන්දරා වැටි යෙදීම සඳහා ආධාර ලබා දී ඇත.

2. මහනුවර ප්‍රාදේශිය කාර්යාලය

I. මාතලේ උප කාර්යාලය
උප කාර්යාලයට අයත් මාතලේ, රත්තොට සහ උකුවෙල සේවා කොට්ඨාශවල නකල්ස් රක්ෂිතයට මායිම්ව ඇති තේ ඉඩම් සඳහා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව මගින් තේ පැළ 20,000ක් පාළු සිටුවීම සඳහා ලබා දෙන ලදී.

3.3.2 කුඩා තේ හා රබර් වතු පුනර්ජීවන ව්‍යාපෘතිය : (2016 - 2021)
(Smallholders Tea & Rubber Revitalization (STaRR) Project)

රුපියල් මිලියන 8502 ක සමස්ථ ආයෝජනය සහිත මෙම ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය රුපියල් මිලියන 4259 ක්ද , IFAD ආයතනය රුපියල් මිලියන 3,349 ක්ද , ඇතුලු සංයුතියකින් සමන්විතව ක්‍රියාත්මක කරන මෙම ව්‍යාපෘතියේ කුඩා තේ වතු අංශය සඳහා වන ආයෝජන පිරිවැය රුපියල් මිලියන 5,777 කි. එනම් සමස්ථ ආයෝජනයෙන් 69% ක් කුඩා තේ වතු අංශය සඳහා වෙන්ව තිබේ.

ව්‍යාපෘතියේ සමස්ථ අරමුණ වනුයේ ව්‍යාපෘති දිස්ත්‍රික්කවල ආහාර සුරක්ෂිතතාව වැඩිදියුණු කිරීම හා ආදායම් වර්ධනය කර කුඩා වතු හිමියන් සවිබල ගැන්වීමයි. කුඩා තේ වතු අංශය සඳහා ගාල්ල, මාතර, මහනුවර, නුවරඑළිය, රත්නපුර, බදුල්ල යන දිස්ත්‍රික්ක 6ක් සඳහා මෙම ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කරනු ලැබේ. ඒ අනුව කුඩා තේ වතු අංශය පහත ප්‍රධාන අරමුණු ඔස්සේ සංවර්ධනය කිරීමට යෝජිතය.

එනම් , තේ දළු නිෂ්පාදනය හා අලෙවිය සම්බන්ධව කුඩා තේ වතු සංවර්ධන සමිති ශක්තිමත් කිරීම , තේ දළු වෙළඳපල මඟින් මෙහෙයවනු ලබන නිෂ්පාදන සහාය , සහ කුඩා තේ වතු හිමියන් සඳහා ආදායම් හා වෙළඳපළ විවිධාංගිකරණයයි. කුඩා තේ වතු හෙක්ටයාර 5,500 ක ප්‍රමාණයක් තේ නැවත වගාව කිරීමත් , එම තේ ඉඩම්වල 15% ප්‍රතිශතයක් දක්වා පාළු සැපයීමද ඉලක්ක කර තිබේ. මෙයට අමතරව කුඩා තේ වතු සංවර්ධන සමිති 200 ක් ආශ්‍රිතව කාන්තා සහභාගිත්වයද තහවුරු කරමින් සමිතිවල නිෂ්පාදන ධාරිතාව වර්ධනය කිරීම , කුඩා තේ වතු හිමියන් සඳහා තාක්ෂණ සහාය ලබාදීම, තේ තවාන් වගාකරුවන් සඳහා පුහුණුව, තේ වගා ප්‍රදේශවල කිලෝ මීටර 90ක ගොවිපල මාර්ග ප්‍රතිසංස්කරණය, කුඩා තේ වතු හිමියන්ට තම ආයෝජන සඳහා බැංකු ණය ලබා ගැනීමේ හැකියාව වර්ධනය කිරීම/ පහසුකම් සැලසීම , යන ව්‍යාපෘති කටයුතු මඟින් කුඩා තේ වතු අංශය සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරේ.

2019 වසරේ කුඩා තේ ඉඩම් හෙක්ටයාර 1,730 ක් තේ නැවත වගා කිරීම සඳහා උඳුරා දැමීමට ඉලක්ක කරන ලදී. (උපලේඛන අංක 12)

3.3.3 තේ ශක්ති රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය

තේ ශක්ති අරමුදල යටතේ ක්‍රියාත්මක කල කුඩා තේ ඉඩම් හිමියන්ගේ සමාජ සුභසාධනය උදෙසා වන තේ ශක්ති රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ වගකීම 2016/09/08 දිනැති කැබිනට් පත්‍රිකාව අනුව 2016/12/15 දින සිට වැවිලි කර්මාන්ත

අමාත්‍යාංශය විසින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත අනුයුක්ත කරන ලදී. ඒ අනුව රක්ෂණ ප්‍රතිලාභ ක්‍රමයට බැඳී ඇති කුඩා තේ ඉඩම් හිමියන් සඳහා පහත සඳහන් පරිදි ප්‍රතිලාභ ගෙවීම ක්‍රියාත්මකව පවති.

1. හදිසි අනතුරු පූර්ණ/අර්ධ අකර්මණ්‍යතාවය
2. අංශභාග රෝගී තත්වය නිසා ඇතිවන පූර්ණ/අර්ධ අකර්මණ්‍යතාවය
3. හදවත් සැත්කම්, මොළයේ සැත්කම්, වකුගඩු සැත්කම් සඳහා
4. හදිසි අනතුරු හා ස්වාභාවික මරණ සඳහා

2019 වර්ෂයේ ඉහත සඳහන් ප්‍රතිලාභ ක්‍රම යටතේ කුඩා තේ වතු හිමියන් විසින් යොමු කල ඉල්ලීම් අනුව රක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන සමාගම වෙතින් ප්‍රතිපාදන ලබාගෙන සාමාජිකයින් 582 දෙනෙකු සඳහා රුපියල් මිලියන 10.8 ක මුදලක් ගෙවා ඇත.

2000 අංක 47 දරණ පනතින් ආරම්භ වූ තේ ශක්ති අරමුදලේ සුභසාධන අංශය 2016.08.09 දින අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව 2016.10.01 සිට කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත අනුයුක්ත කරන ලදී.

2019 වසරේ සුභසාධන අංශය මගින් විපතට පත් කුඩා තේ වතු හිමියන් වෙත ගෙවන ලද රක්ෂණ ප්‍රතිලාභ

		රුපියල්
වයස අවු: 18-70 අතර ස්වාභාවික මරණ	122 ක් සඳහා ගෙවීම් මුදල	3,050,000.00
වයස අවු: 70 ට වැඩි ස්වාභාවික මරණ	254 ක් සඳහා ගෙවීම් මුදල	1,260,000.00
වයස අවු: 18-70 අතර හදිසි අනතුරු මරණ	11 ක් සඳහා ගෙවීම් මුදල	1,100,000.00
වයස අවු: 70 ට වැඩි හදිසි අනතුරු මරණ	4 ක් සඳහා ගෙවීම් මුදල	40,000.00
වයස අවු: 18-70 අතර හදවත් සැත්කම්	5 ක් සඳහා ගෙවීම් මුදල	720,000.00
වයස අවු: 18-70 අතර අංශභාග	1 ක් සඳහා ගෙවීම් මුදල	21,466.07
මුළු ගෙවීම් මුදල		6,191,466.07

අලියන්ස් ලංකා රක්ෂණ සමාගම වෙතින් ප්‍රතිලාභ සඳහා රු. 8,146,263.28 ක මුදලක් අයවිය යුතුය.

වගු අංක 17
3.4 සංවර්ධනාත්මක ප්‍රතිඵල සඳහා ප්‍රධාන කාර්යය පාදක දර්ශක

මධ්‍යකාලීන ප්‍රතිඵල		ප්‍රධාන කාර්යය සාධන දර්ශක	මූලික ප්‍රගතිය	පාදක වර්ෂය 2008	කාර්යය පාදක දර්ශක ඉලක්ක හා ප්‍රගතිය 2019		විශේෂිත කරුණු
					ඉලක්කය	ප්‍රගතිය	
	දිගුකාලීන ප්‍රතිඵලය	I කුටුම්භ ඒකක වත්කම් වර්ධනයවීමේ ප්‍රතිශතය					සමාජ ආර්ථික සමීක්ෂණ
	කුඩා තේ වතු හිමියන්ගේ ජීවන තත්වය නංවාලීම	II ළමුන්ගේ ද්විතිය අධ්‍යාපන ප්‍රතිශතය	628.899				
1	වසර 03 කදී වසරකට / හෙක්ටයාරයකට/	1.1.දිස්ත්‍රික් මට්ටමින් සහ උච්චත්ව මට්ටමින් ඒකක වලදායිතාව වර්ධනයවීම					ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ සංඛ්‍යාන දත්ත
	සකස්කල තේ කිලෝ ග්‍රෑම් ප්‍රමාණය වැඩි කිරීම,						
	පහත රට 2,500 දක්වා			2,085	2,500	2,051	
	මැද රට 1,700 දක්වා			1,050	1,700	1,462	
	උඩ 1,600 දක්වා			1,055	1,600	1,300	
		1.2කුඩා තේ ඉඩම්වල නිෂ්පාදනය වර්ධනය වීම(කිලෝ ග්‍රෑම් මිලියන)		215		225.72	
2	වසර 03 කදී කම්හල් මට්ටමින් අමු දළු ගුණාත්මය 60% දක්වා වර්ධනය කිරීම	2.1.කම්හල් මට්ටමින් හොඳ දළු ප්‍රතිශතය		35%			ශ්‍රී ලංකා තේ.මණ්ඩලයේ තේ කොමසාරිස් අංශයේ දත්ත
3	වසර 03 ක් තුල ප්‍රජා මූලික සංවිධානවලින් 50% ක් ශක්තිමත් කිරීම	3.1.වත්කම් වටිනාකම වර්ධනය වීම	15.4	NA			සමාජ ආර්ථික සමීක්ෂණ සංගණනය
		3.2.භඳුනාගත් කාර්යන් මෙහෙයවන සමිති සංඛ්‍යාව		100		1,475	
		3.3.සාවද්‍යතාවයන් සම්බන්ධයෙන් සාමාජික ආකල්ප		NA			
4	වසරක් තුල වඩාත් සවලදායි ලෙස ක්‍රියාත්මකවීම සඳහා ආයතනය ශක්තිමත් කිරීම	4.1.ඉලක්ක සපුරාලීමේ ප්‍රතිශතය					
		තේ නැවත වගා ආධාර ක්‍රමය					
		a. මූලික	298.312	102%	303.72		
		b. භෞතික(හෙක්ටයාර)		92%	621	639	
		4.2.විගණන මතය	තත්වා ගණනය කළ	සත්‍ය හා සාධාරණ			.
		4.3.අයවැයෙන් අපගමන ප්‍රතිශතය (සංවර්ධන ප්‍රාග්ධන)	.65	13%		.65	
		4.4.ආයතනයේ සාපල්‍යතාවය සම්බන්ධයෙන් කාර්යය මණ්ඩලයේ ආකල්ප		NA			
5	වසරක් 03 ක් තුලදී ඉඩම්වලින් 10% ක් අමතර ආදායම් ඉපයීමේ කටයුතු සඳහා යොමුකරවීම	5.1.අනෙකුත් භෝග ඇති ඉඩම් ප්‍රතිශතය		35%			සමාජ ආර්ථික සමීක්ෂණ සංගණන
		පශු පාලන ඇති ඉඩම් ප්‍රතිශතය		NA			
	මුළු එකතුව						

04. කුඩා තේ ඉඩම් අංශයේ වගා පිරිවැය හා දළු මිල

4.1. ශ්‍රම පිරිවැය

4.2. අමු දළු කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය

4.3. නිෂ්පාදන ආන්තිකය හා මිල

4.4. තේ නැවත වගා කිරීමේ පිරිවැය

4.5. හෙක්ටයාර එකක් සඳහා වූ දිරිදීමනා අනුපාතිකය සහ වගා පිරිවැය

කුඩා තේ ඉඩම් අංශයේ වගා පිරිවැය හා දළු මිල

4. 1 ශ්‍රම පිරිවැය

කුඩා තේ ඉඩම් අංශයෙහි තත්වයන් පිළිබඳ කේෂ්තු මට්ටමින් ලබා ගන්නා වාර්ෂික තොරතුරු අනුව කුඩා තේ ඉඩම් අංශයේ දළු නෙලීම , කප්පාදුව, වල්පැළ නෙලීම ආදිය සඳහා ශ්‍රමික හිඟයද දෛනික වේතන මට්ටම සලකා බැලීමේදී පඩි පාලක සභා ආඥා පනතට අනුව ගෙවීමට නියමිත වේතන මට්ටමට වඩා වැඩි මුදලක් ගෙවනු ලැබීම බව අනාවරණය වන කරුණු වේ. තවද ප්‍රාදේශිය වශයෙන්ද වේතන මට්ටමේ විෂමතාවයන් වාර්තා වන අවස්ථා බොහෝය. ඒ අනුව බොහෝවිට සංවිධානාත්මක නොවන කුඩා තේ ඉඩම් අංශයේ දෛනික කම්කරු වේතන මට්ටම , සංවිධානාත්මක කුඩා තේ ඉඩම් අංශයේ වේතන මට්ටමට වඩා වැඩි අගයක් ශ්‍රමයේ මිල වශයෙන් වාර්තා වී තිබුණි.

තවද දළු නෙලීම සඳහා ශ්‍රමිකයන්ට ගෙවීම් කිරීමේදී නෙලන ලද දළු කිලෝ ග්‍රෑම් ප්‍රමාණය මත කුලි ගෙවීම , දෛනිකව නෙලූ දළු ප්‍රමාණයේ සාමාන්‍යය ඉක්මවන විට කිලෝ ග්‍රෑමයකට අමතර මිලක් ගෙවීම වැනි අවස්ථාද , කප්පාදුව වැනි පුහුණු ශ්‍රමික කාර්යයන් සඳහා දළු නෙලීමේ දෛනික කුලියට වඩා ඉහල දෛනික කුලියක් ගෙවනු ලබන බවද වාර්තා වී තිබේ.

4. 2 අමු දළු කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ දත්ත පරීදි පහිටිම මත කොළඹ තේ වෙන්දේසියේ ලද මිළ (උපලේඛන අංක 09-A පිටු අංක 66) පරීදි ගණනය කරනු ලැබූ අමු දළු කිලෝ ග්‍රෑමයක ඇස්තමේන්තුගත නිෂ්පාදන පිරිවැය සහ දළු කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය මිල පහත වගුවේ සඳහන් වේ.

වගු අංක 18

අමු දළු කිලෝ ග්‍රෑමයකට ලැබුණු මිල හා නිෂ්පාදන පිරිවැය
2006 - 2019

වර්ෂය	සාමාන්‍ය මිල (කිලෝ ග්‍රෑම් 1 ට රුපියල්)	සාමාන්‍ය නිෂ්පාදන පිරිවැය (කිලෝ ග්‍රෑම් 1 ට රුපියල්)
2006	29.18	21.87
2007	40.88	30.64
2008	45.45	36.24
2009	52.71	37.24
2010	54.11	38.56
2011	52.63	44.43
2012	57.27	49.50
2013	64.99	51.40
2014	67.54	54.54
2015	58.80	55.08
2016	68.53	64.52
2017	90.69	71.65
2018	85.48	71.86
2019	80.15	56.28

රූප සටහන් අංක - 14



2019 වර්ෂයේදී දළු කිලෝ ග්‍රෑමයක නිෂ්පාදන පිරිවැය ගණනය කිරීම සඳහා වසරකට හෙක්ටයාර එකකට සාමාන්‍ය අස්වනු ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 9,537 ක් (පහතරට රිකිළි තේ) ලෙස සලකා ගණනය කර ඇත. (ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ නිෂ්පාදන දත්ත පරිදි) 2018 වර්ෂයේදී මෙම සාමාන්‍ය අස්වනු ප්‍රමාණය දළු කිලෝ ග්‍රෑම් 9,649 ක් විය.

2018 වර්ෂය හා සසඳන විට 2019 දී දළු කිලෝ ග්‍රෑමයක් සඳහා ගෙවා ඇති සාමාන්‍ය මිළ රුපියල් 5.33 කින් එනම් 6 % කින් පහළ ගොස් තිබුණි. නිෂ්පාදන පිරිවැය ඉහලට යාම නිසා පෙර වර්ෂ වල පිරිවැය පිළිබඳ දිර්ඝ අධ්‍යනයක් සිදු කිරීමේදී පොදු වියදම් ලෙස පරිපාලන වියදමක් කුඩා තේ වතු හිමියන්ට වැය නොවන බැවින් එම මුදල අඩු වීම නිසා හා පොහොර මිල අඩු වීම නිසා නිෂ්පාදන පිරිවැය පෙර වර්ෂයට වඩා අඩු වී ඇත.

2019 වර්ෂයේ පැවැති දළු මිල හා ඇස්තමේන්තුගත පිරිවැය

වගු අංක 19

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ දත්ත පරිදි (උපලේඛන අංක 9-A) සියළුම උච්චත්වයන් සඳහා නිමි තේ කිලෝ ග්‍රෑමයක සාමාන්‍ය මිල 2018 වර්ෂයට වඩා 2019 වසරේදී පහළ ගොස් තිබුණි.

2019 වර්ෂයේ උඩරට අමු තේ දළු කිලෝවකට ගෙවන ලද මිල රුපියල් 75.80ද මැදිබිම් සඳහා ගෙවනු ලැබූ මිල රුපියල් 69.19 දක්වාද පහළ ගොස් තිබුණි. පහත් බිම් සඳහා ගෙවනු ලැබූ මිල රුපියල් 88.04 2019 වර්ෂයේ සිට රුපියල් 84.47 දක්වා පහළ ගොස් සමස්ත සාමාන්‍ය මිල දළු කිලෝවකට රුපියල් 85.48 සිට රුපියල් 80.15 දක්වා අඩුවී තිබුණි.

4. 3 නිෂ්පාදන ආන්තිකය හා මිල

2019 වර්ෂයේ කුඩා තේ ඉඩම් අංශයේ සාමාන්‍ය නිෂ්පාදන ඵලදායිතාව, වර්ෂයේ පැවැති සාමාන්‍ය දළු මිල හා ඇස්තමේන්තු ගත පිරිවැය අනුව නිෂ්පාදන ආන්තිකයේ සාමාන්‍ය රුපියල් 23.87 කි. 2018 වර්ෂයේ මෙය 13.62 කි. ඒ අනුව 2018 වර්ෂයට සංසන්දනාත්මකව නිෂ්පාදන ආන්තිකය රුපියල් 10.25 කින් වැඩිවී තිබුණි.

වගු අංක 19

අමු තේ දළු කිලෝ ග්‍රෑමයකට ගෙවන ලද මිළ

	2018 වර්ෂය (රුපියල්)	2019 වර්ෂය (රුපියල්)	මිල වෙනස්වූ ප්‍රමාණය (රුපියල්)
උඩරට අමු තේ දළු	84.75	75.80	8.95
මැදිබිම් සඳහා	76.66	69.19	7.47
පහත් බිම්	88.04	84.47	3.57
සමස්ත සාමාන්‍ය මිල දළු කිලෝ ග්‍රෑමයකට	85.48	80.15	5.33

මූලාශ්‍රය : ශ්‍රී ලංකා තේ මණ්ඩලය.

4. 4 තේ නැවත වගා කිරීමේ පිරිවැය

ශ්‍රම ඒණතාවය මත තේ නැවත වගා කිරීම සඳහා දැරිය යුතුවන කම්කරු පිරිවැය ඉහල මට්ටමක පැවතීම , පොහොර සඳහා මූල්‍ය සහනාධාර ප්‍රමාණය ඉවත් කිරීම, වගා පිරිවැය කෙරෙහි විශේෂයෙන් බලපා ඇති සාධක වේ. මුළු පිරිවැයෙන් 83% ක ප්‍රමාණයක් ශ්‍රම පිරිවැය වශයෙන් දැරීමට සිදුව ඇති බව ඇස්තමේන්තු පරිදි අනාවරණය වේ.

වගු අංක 20

හෙක්ටයාර එකක තේ නැවත වගාකිරීමේ පිරිවැය ඇස්තමේන්තුව
2018/2019 (රුපියල්) - (උදුරා දැමීමේ සිට දළු නෙලීම අවධිය දක්වා)

කාර්යය	2018		2019	
සංවර්ධන ප්‍රග්ධනය			586,072		576,272
පුනරාවර්තන			411,101		373,480
වෙනත් ආදායම්			**997,173**		**949,752**
පොලී - ස්ථාවර තැන්පත්					
පොලී - සත්දිනකාලීන තැන්පතු	16	2,101		2,012	
සේවකයන්ට ලබා දුන් ණය පොලී		2,707		4,637	
විවිධ ආදායම්		3,354		3,443	
මෝටර් රථ අලෙවි ලාභ		4,730		3,581	
තේ ආදර්ශන වගා හා මව් පදුරු අතිරික්ත		-		4,512	
(ඌණතා)	17	(2,381)		(483)	
පැළ තවාන් අතිරික්ත (ඌණතා)	18	4,088		3,917	
හන්තාන වියදම් මත ආදායම	16A	2,157	16,755	2,847	24,466
			1,013,928		974,218
සංවර්ධන වියදම්					
සහනාධාර	13	(588,395)		(579,926)	
ව්‍යාප්ති	14	(29,072)		(32,360)	
සමාජ සංවර්ධනය	13	(7,522)		(15,144)	
ආයතනයේ සේවක සංවර්ධනය		(3,910)		(4,735)	
			(628,899)		(632,165)
මෙහෙයුම් වියදම්					
සේවක දීමනා					
වැටුප් දීමනා/ සේ.අ../සේ.නි.අ. අරමුල	12	(305,051)		(282,441)	
අතිකාල/ නිවාඩු දින දීමනා		(5,751)		(5,534)	
ප්‍රවාහන		(9,792)		(8,453)	
සැපයුම් හා පරිභෝගික භාණ්ඩ		(6,322)		(6,078)	
නඩත්තුව		(25,054)		(23,610)	
සන්නිවේදන		(8,437)		(8,515)	
කුලී, වරිපනම් හා විදුලිය		(9,645)		(8,943)	
වෙනත් මෙහෙයුම් වියදම්		(39,984)		(36,480)	
මුළු මෙහෙයුම් වියදම්			(410,034)		(380,054)
මෙහෙයුම් කටයුතු අතිරික්ත/(ඌණතා)			(25,005)		(38,001)
පාරිතෝෂික		(45,685)		(17,601)	
ක්ෂය වීම් හා ක්‍රමක්ෂය		(23,782)		(15,781)	
බොල් ණය ප්‍රතිපාදන/ ලියාහල ණයකරුවන්		(498)		(516)	
අවිනිශ්චිත තත්වයන් සඳහා ප්‍රතිපාදන		(190)	(70,156	(4,830)	(38,728)
දේපළ, යන්ත්‍ර හා පිරියත අලෙවියෙන් ලැබූ ලාභ			(95,161)		(76,729)
STaRR ව්‍යාපෘතිය -පුනරාවර්තන ප්‍රදාන				2,841	
පුනරාවර්තන වියදම්		-		(2,841)	
		-			
අතිවිශේෂ අයිතමයන්ට පෙර ශුද්ධ අතිරික්තය /(ඌණතාවය)					-
පෙර වසර ගැළපුම් විලම්භීත ආදායම්					
කාල සීමාව තුළ ශුද්ධ අතිරික්තය /(ඌණතාවය)			(95,161)		(76,729)
			16,361		13,981
			(78,799)		**(62,748)**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්

1. වාර්තාකරන ආයතනය

1.1 **ආයතනික තොරතුරු**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය (TSHDA) 1977 වසරේ දී 1975 අංක 35 වන කුඩා තේ වතු සංවර්ධන පනත යටතේ ස්ථාපිත කරන ලදී. රටේ කුඩා තේ වතු සංවර්ධනය සඳහා පවතින බලපත්‍රලාභී එකම ව්‍යවස්ථාපිත ආයතනය ලෙස නිපැයුම ඉහළ නැංවීම, අලෙවිකරණ කටයුතු, ඵලදායිතාවය වැඩි දියුණු කිරීම හා කුඩා තේ වතු හිමියන්ගේ සුභසාධනය උදෙසා කටයුතු කිරීම සංවිධානයේ අරමුණු වේ. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ප්‍රදේශීය කාර්යාල 8 කින් හා රත්නසිරි වික්‍රමනායක පුහුණු මධ්‍යස්ථානයෙන් සමන්විත වේ.

1.2 මූල්‍ය ප්‍රකාශන

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන සකස්කර ඇත.

2. ගිණුම්කරණ ප්‍රත්පත්ති

2.1 ගිණුම්කරණයේ මූලධර්ම

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සම්පාදිත ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව සකස්කරනු ලැබ ඇත. එම ගිණුම්වලට බලපෑම් කරනු ලබන උද්ධමනීය සාධක උදෙසා ගැලපුම් කිසිවක් කර නොමැත.

2.2 සංසන්දනාත්මක තොරතුරු

සංසන්දනාත්මක තොරතුරු සපයා ඇත්තේ වත්මන් වසරේ ඉදිරිපත් කිරීමට අනුකූල ව වත්මන් කාලසීමාව තුළ මූල්‍ය ප්‍රකාශන අවබෝධ කරගැනීම සඳහාත් අවශ්‍ය ස්ථානයන්හි දී නැවත වර්ගීකරණය සඳහාත් අදාළ වන්නේ නම් ය.

2.3 ශේෂ පත්‍රදිනට පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනට පසුව සිදුවන සෑම ද්‍රව්‍යාත්මක සිදුවීමක් ම සලකා බලා ඇති අතර අවශ්‍ය ස්ථානයන්හි දී ගැලපුම් හා හෙලිදරව් කිරීම් සිදුකරනු ලැබුණි.

2.4 වෙළඳ ණයකරුවන් හා ලැබීම්

වෙළඳ හා අනෙකුත් ලැබීම් ඒවායේ පොත් අගය අනුව දක්වා ඇති අතර අඩමාණ ලැබීම් සඳහා ප්‍රතිපාදන සකස් කර ඇත.

ණය ආයු කාලය	**ප්‍රතිපාදනය**
වසරකට අඩු	නැත
වසරකට වැඩි හා වසර දෙකක් දක්වා	10%
වසර දෙකකට වැඩි හා වසර තුනක් දක්වා	30%
වසර තුනකට වැඩි හා වසර පහක් දක්වා	50%
වසර පහකට වැඩි	100%

3. දේපල, අංගන හා පිරියත

3.1 හඳුනාගැනීම

දේපල, අංගන හා පිරියත හඳුනාගත හැක්කේ වත්කම් හා සම්බන්ධ අනාගත ආර්ථික ප්‍රතිලාභ අධිකාරිය වෙත ගලාඒමට ඉඩ තිබේ නම් සහ වත්කමේ පිරිවැය සත්‍ය ලෙස මැනිය හැකි නම් ය.

3.2 මිනුම්

වත්කම් අත්පත් කරගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි වැයකිරීම් දේපල, අංගන හා පිරියත පිරිවැයට ඇතුළත් වේ. දේපල, අංගන හා පිරියත අයිතමයන් මනිනු ලබන්නේ පිරිවැයෙන් සමුච්චිත ක්ෂයවීම් අඩු කොට ය. ප්‍රත්‍යාගණනය කරන දිනට, ප්‍රත්‍යාගණන අගයට ගෙන ගිය දේපලවල සාධාරණ වටිනාකම දක්වා ඇත්තේ සමුච්චිත ක්ෂයවීම් ද අඩු කොට ය.

වත්කමක ප්‍රත්‍යාගණනය මත පැන නගින ඕනෑම අතිරික්තයක් සමුච්චනය කරනුයේ හිමිකමේ ප්‍රත්‍යාගණන සංචිතය යටතේ වෙනත් විස්තීර්ණ ආදායම් මගිනි.
ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 ට අනුව, සම්පූර්ණයෙන් ම ක්ෂය වූ වත්කම් තවමත් භාවිතයේ පවතී. එබැවින්, 2018දෙසැම්බර් 31දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ සහාය ඇති ව ප්‍රත්‍යාගණනය සිදු කර ඇත. කෙසේ වෙතත්, 31 දෙසැම්බර් 2018 අවසන් දිනට අවසන් කිරීමට අසමත් වීම හේතුවෙන් කිසිදු ඇතුළත්කිරීමක් ගැලපීම්කර නොමැත. සියලුම ඇතුළත්කිරීම් ගැලපීම්කර ඇත්තේ 2019 දෙසැම්බර් 31දිනට ය. ප්‍රත්‍යාගණනය අතිරික්තය ලෙස මිලියන 20 ක් හඳුනාගෙන ඇත.

3.3 ක්ෂයවීම්

ලාභාලාභ ප්‍රකාශනයේ ක්ෂයවීම් හඳුනාගෙන ඇත්තේ වත්කමේ ඵලදායී ජීවකාලය පුරාවට සරල මාර්ග ක්‍රමයට අනුව ය. වත්මන් හා සංසන්ධනාත්මක කාලය සඳහා වත්කම්වල ඵලදායී ජීව කාලයන් පහත පරිදි වේ.

ගොඩනැගිලි	2.00%
මෝටර් රථ	20.0%
ගෘහ භාණ්ඩ, සවිකිරීම්	12.5%
කාර්යාල උපකරණ	12.5%
පරිගණක	20.0%
යන්ත්‍ර උපකරණ	20.0%

භූමිය ක්ෂය කරනු නොලැබේ. තව ද, ගොඩනැගිල්ල සඳහා වූ ව්‍යාප්ති හා ප්‍රධාන ප්‍රතිසංස්කරණ පිරිවැය මුල් ගොඩනැගිලිවල ශේෂ වූ ඵලදායී ජීව කාලය පුරාවට ක්ෂය වී ඇත.

4. ආයෝජන

ආයෝජන සඳහා පාරිතෝෂික අරමුදලේ ස්ථාවර තැන්පතුව ඇතුළත් වේ.

5. වෙනත් මූල්‍ය වත්කම්

ආයතනික පැළ තවාන් සඳහා යොදාගන්නා ලද අමුද්‍රව්‍ය සඳහා පිරිවැය, දැල් ගෘහයක් ඉදිකිරීමට ගිය වියදම ද ඇතුළුව, වත්කමේ ඵලදායී ජීව කාලය යටතේ වර්ග කර ඇති අතර එම කාලය සඳහා අදාළ පිරිවැය අපගමනය වූ පිරිවැය ලෙස ඉදිරියට ගෙන එන ලදී. 31 දෙසැම්බර් 2019 දිනට ශේෂය රුපියල්. මිලියන 12.9 කි.

6. වෙනත් ජංගම වත්කම්

2019 දෙසැම්බර් 31 දිනට වෙනත් ජංගම වත්කම් යටතේ දැක්වුණු පැළ තොග වටිනාකම රුපියල් මිලියන 14.2 කි. පැළ තොග 2019 දෙසැම්බර් 31 වන තෙක් සමුච්චිත නිෂ්පාදන පිරිවැය යටතේ තක්සේරු කෙරුණි.

7. තොග හා භාණ්ඩ තොග

භාණ්ඩ තොග අවම පිරිවැයට හා ශුද්ධ උපලබ්ධි අගයට මිනුම් කරනු ලබන අතර භාණ්ඩ තොග පිරිවැය ප්‍රථම ලැබීම් ප්‍රථම නිකුත්කිරීම් නියමය මත පදනම් වේ. භාණ්ඩ තොගයේ වටිනාකමට අත්පත්කරගැනීම්, පරිවර්තන පිරිවැය සහ එම තොග පවතින ස්ථානයට හා තත්වයට ගෙන ඒමට වැය කළ පිරිවැය ආදී වැය කළ වියදම් ඇතුළත් වේ.
වර්තමානයේ නව තොග පාලන පද්ධතිය හඳුන්වා දී ඇත්තේ තොග පාලනයේ පවතින ප්‍රයෝගික ගැටළු අඩු කරගනිමින් ඵලදායී ව හා කාර්යක්ෂම ව තොග කළමනාකරණය සඳහා ය.
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ 'කුඩා තේ වතු ක්ෂේත්‍රයේ ඵලදායීතාවය ඉහළ නැංවීම' ව්‍යාපෘතිය යටතේ මිල දී ගනු ලැබූ කෘෂිකාර්මික උපකරණ (ජල පොම්ප හා දියර ඉසින), අමාත්‍යාංශයේ ඉඩකඩ ප්‍රමාණවත් නොවීම නිසා අප පරිශ්‍රයේ තාවකාලික ව ස්ථානගත කර තිබුණි. භාණ්ඩවල හිමිකාරිත්වය වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් පවරාගැනීම නිසා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් කිසිදු ගිණුම්කරණ ඇතුළත්කිරීමක් සිදු කර නොතිබුණි.

ලැබුණු භාණ්ඩ පිළිබඳ සාරාංශය

උපකරණ විස්තරය	**ජල පොම්ප ප්‍රමාණය**	**දියර ඉසින ප්‍රමාණය**
31/12/2019 දිනට ලැබීම්	4725	4700
වාර්ථාගත කාලයෙන් පසු ලැබීම්	1575	0
මුළු ලැබීම්	6300	4700
වැවිලි කර්මාන්ත අමාත්‍යාංශයේ සංවර්ධනය සඳහා අධ්‍යක්ෂකවරයාගේ (MOPI)ඉල්ලීම මත කළ බෙදාහැරීම්	712	2
ඉතිරි වූ ශේෂය	**5588**	**4698**

8. වෙළඳ ණයගැතියන් හා ලැබීම්

වෙළඳ හා අනෙකුත් ලැබීම් ඒවායේ පොත් අගය අනුව දක්වා ඇති අතර අඩමාණ ලැබීම් සඳහා ප්‍රතිපාදන සකස් කර ඇත.

ණය ආයු කාලය	**ප්‍රතිපාදනය**
වසරකට අඩු	නැත
වසරකට වැඩි හා වසර දෙකක් දක්වා	10%
වසර දෙකකට වැඩි හා වසර තුනක් දක්වා	30%
වසර තුනකට වැඩි හා වසර පහක් දක්වා	50%
වසර පහකට වැඩි	100%

9. අනෙකුත් ලැබීම්

වෙළඳ ණයකරුවන් හැර අනෙකුත් ලැබීම් ඒවායේ ප්‍රමාණයන්ගෙන් දක්වා ඇත.

10. මුදල් සහ මුදල් හා සමාන දෑ

මුදල් සහ මුදල් හා සමාන දෑ වලට අතැති මුදල්, බැංකු හා ඉල්ලුම් තැන්පතු ඇතුළත් වේ.
31 දෙසැම්බර් 2019 දිනට මුදල් ශේෂය රුපියල් මිලියන 119.8 කි.
මූල්‍ය වර්ෂය අවසානයේ වන විටත් භාණ්ඩාගාරය වෙත රුපියල් මිලියන 372.9 ක ප්‍රග්ධන වියදම් ලැබී තිබුණේ නැත.

11. මුදල් ප්‍රවාහ

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය වක්‍ර ක්‍රමය භාවිතයෙන් සකස් කර ඇත.

12. අරමුදල් ලැබීම් ගිණුම්කරණය

2007 වර්ෂයේ සිට භාණ්ඩාගාරයෙන් අරමුදල් ප්‍රරේෂණය කර ඇත්තේ ඒකාබද්ධ අරමුදල හරහා ය.

13. වගකීම්

ශේෂ පත්‍ර දිනට සියලුම ද්‍රව්‍යාත්මක වගකීම් ගිණුම්වල ඇතුළත් කර ඇති අතර පවතින බවට හඳුනාගත් වගකීම් මත ප්‍රමාණවත් ප්‍රතිපාදන යොදා ඇත. ශේෂ පත්‍රයේ ඡංගම වගකීම් ලෙස වර්ගීකරණය කර ඇති වගකීම් සඳහා ඉල්ලුම මත ගෙවීම සිදු කරයි.

14. පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන

වසරක සේවා කාලයක් සම්පූර්ණ කරන ලද සෑම සේවකයෙක් සඳහා ම පාරිතෝෂික ගෙවීම් සපයනු ලබයි. වර්ෂය සඳහා ප්‍රතිපාදන රුපියල් මිලියන 183.9 කි.

15. බදු ගෙවීම්

ඒකාබද්ධ අරමුදල යටතේ අරමුදල් සැපයෙන ආයතනයක් බැවින් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය ආදායම් බද්දෙන් නිදහස් කර ඇත.

16. අසම්භාව්‍ය වගකීම්

පහත පුද්ගලයින්ට එරෙහි ව කම්කරු උසාවියේ හා අදිකරණයේ ඇති නඩුවලට අදාළ ව ආසන්න වශයෙන් රුපියල්.මිලියන 2.7 ක අසම්භාව්‍ය වගකීම් පවතී.

අධිකරණ නඩුව	**වගකීම් (** රුපියල් **මිලියන)**
ඩබ්.ඊ.බී.එස්. සූරසිංහ මයා	2.00
ඒ.එම්. ධනුෂ්කා බණ්ඩාර මිය	0.7

17. ප්‍රග්ධන ප්‍රදාන

1981 සිට 2014 දක්වා IRDP, SHTDP TDP, අනෙකුත් ව්‍යාපෘති සඳහා ලද අරමුදල් හා භාණ්ඩාගාර ප්‍රදාන ක්‍රමක්ෂය කර ඇත. ඒ අනුව රුපියල් මිලියන 16.36 ක් විලම්භීත ආදායම් ලෙස ගිණුම්ගත කර ඇති අතර ඉදිරියට ගෙනගිය ඉතිරි ශේෂයන් අනාගත වර්ෂ සඳහා ක්‍රමක්ෂය කර ඇත.

18. වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලසුම නැවත වගාකිරීම ආදී ජාතික අවශ්‍යතාවයන්ට අනුකූල ව සකස් කර ඇත.

19. 1998 දී ලංකා බැංකුව හා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය සමග එක් ව විශේෂ ණය යෝජනා ක්‍රමය යටතේ කුඩා තේ වතු හිමියන්ගේ සමිති සඳහා තේ දළු ප්‍රවාහනයට ලොරි රථ 100ක් ලබා දී තිබුණි. ඇතැම් සමිති ණය පැහැර හැරීම හේතුවෙන් කුඩා තේ වතු සංවර්ධන අධිකාරියට ප්‍රතිව්‍යුහකරණයෙන් සිදු වූ අලාභය රුපියල් මිලියන 6.7කි. කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය භාණ්ඩාගාරයෙන් මෙය පොන්වලින් ලියා හැරීමට අනුමැතිය ඉල්ලා සිටිය ද තවමත් ඔවුන් ඊට අනුමැතිය ලබා දී නොමැත. එම නිසා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය මෙම ලොරි රථ අලෙවිකර රුපියල් මිලියන 9.1 ක් උපයාගෙන ඇති අතර එය ආදායම් ප්‍රතිව්‍යුහගත ලේඛනයේ දක්වා ඇත.

20. කැබිනට් මණ්ඩලයේ තීරණයක් මත තේ ශක්ති සුභසාධන අංශය කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත පවරාගෙන තිබුණි. අමාත්‍යාංශයට ලැබුණු රක්ෂණ වාරිකය රුපියල් මිලියන 21.8 ක් වූ අතර තේ ශක්ති අරමුදලේ සාමාජිකයන්ට වසර පුරාවට ගෙවූ රක්ෂණ හිමිකම් දීමනාව රුපියල් මිලියන 20.7 කි.

21. කුඩා තේ වතු හිමියන්ට පොහොර හා ගංවතුර ආධාර ලෙස ලබාදුන් රුපියල් මිලියන 22.6 ක මුදල ,ගිණුම් වසාදැමීම හා අක්‍රියවීම් හේතුවෙන් ගෙවීමට ඉදිරිපත් නොවි තිබුණි. එම ප්‍රමාණය කුඩා තේ වතු හිමියන්ට කෘෂිකාර්මික උපකරණ ලබාදීමේ විශේෂ වැඩසටහන යටතේ මුල්ලු මිල දී ගැනීම සඳහා භාවිතා කර තිබුණි.

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
2019 දෙසැම්බර් 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මුදල් ප්‍රවාහය ප්‍රකාශනය

මෙහෙයුම් කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහයන්	2019	2018
සාමාන්‍ය ක්‍රියාකාරකම්වලින් ලද අතිරික්තය / (ඌණතා)	(78,799)	(62,748)
මුදල් නොවන සංචලන		
විලම්භීත ආදායම්	(16,361)	(13,981)
ක්ෂය වීම්	23,782	15,781
පාරිතෝෂික සඳහා ප්‍රතිපාදන වෙන්කිරීම්	45,685	17,601
අඩමාන ණය සඳහා ප්‍රතිපාදන වැඩිවීම/අඩුවීම	(498)	516
අසම්භාව්‍ය ගෙවීම්	(2,019)	(2,759)
අවිනිශ්චිත අවස්ථා සඳහා ප්‍රතිපාදන	190	5,700
පොලී ආදායම්	(4,808)	(6,649)
ගෙවිය යුතු ගෙවීම්වල වැඩිවීම/අඩුවීම	70,884	10,215
සේවක පිරිවැය හා සම්බන්ධ වැඩිවීම		
දේපල, යන්ත්‍ර සුත්‍ර හා පිරියත විකිණීමෙන් ලද	144	(4,559)
(ලාභ)/අලාභ	2,194	(73,454)
අනෙකුත් වත්කම්වල වැඩිවීම/අඩුවීම	1.730	(3,928)
ලැබිය යුතු අයිතමවල වැඩිවීම/අඩුවීම	(25,791)	16,423
භාණ්ඩ තොග අයිතමයන්ගේ වැඩිවීම/අඩුවීම		
මෙහෙයුම් කටයුතුවල ශුද්ධ මුදල් ප්‍රවාහය	16,333	(101,842)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහය		
යන්ත්‍ර හා පිරියත මිල දී ගැනීම්	(121,895)	(56,064)
අංගන හා පිරියත විකිණීමෙන් ලද අදායම	164	4,861
ආයෝජන ක්‍රියාකාරකම්වල ශුද්ධ මුදල් ප්‍රවාහය	(121,731)	(51,203)
ලැබූ පොලිය	6,984	6,045
ගෙවූ පාරිතෝෂික	(23,031)	(13,396)
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය	(16,047)	(7,351)
සංවර්ධන වියදම් සඳහා රජයේ ප්‍රදාන	-	-
ප්‍රාග්ධන ප්‍රදාන	4,808	2,401
ප්‍රත්‍යාගණන අතිරික්තය	20,542	-
රජයේ දායකත්වය	98,928	40,728
මූල්‍ය කටයුතුවලින් ලද මුදල් ප්‍රවාහය	124,279	43,129
මුදල් හා මුදල් සමාන දෑවල ශුද්ධ වැඩිවීම/(අඩුවීම)	2,834	(117,267)
කාලපරිච්ඡේදය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දෑ	117,051	234,318
කාලපරිච්ඡේදය අවසානයේ මුදල් හා මුදල් සමාන දෑ	119,885	117,051

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
ශුද්ධ වත්කම්/ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

රු.'000

විස්තරය	පාලනය අස්ථිත්වයේ හිමිකරුවන්ට අදාලවන				
	දායක ප්‍රාග්ධනය	අනෙකුත් සංචිත	ප්‍රත්‍යාගණන සංචිත	සමුච්චිත අතිරික්ත (ඌණතා)	මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්
2018 දෙසැම්බර් 31 දිනට ශේෂය	**136,966**	**57,609**	**124,109**	**(232,548)**	**86,136**
වර්ෂය සඳහා අතිරික්තය/(ඌණතාවය)			20,542	(78,799)	(58,257)
					-
දේපල ප්‍රත්‍යාගණනයෙන් ලද ලාභය	98,928				98,928
					-
වර්ෂය සඳහා රජයේ ප්‍රදාන	(11,553)	(4,808)			-
වර්ෂය සඳහා අනෙකුත් ප්‍රදාන					(16,361)
වර්ෂය සඳහා විලම්භීත ආදායම					-
					-
2019 දෙසැම්බර් 31 දිනට ශේෂය	**224,341**	**52,801**	**144,651**	**(311,347)**	**110,446**

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
මුල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය

සටහන 01

දේපල, අංගන හා පිරියත 2019

විස්තරය	2019.01.01 දිනට පිරිවැය	වර්ෂය සඳහා මිලදී ගැනීම	මාරු කිරීම් (ඇතුළතට)	මාරු කිරීම් (පිටතට)	මාරු කිරීම්/ අපහරණ	2019.12.31. දිනට පිරිවැය
ඉඩම්	73,907,078.57	-			-	73,907,078.57
ගොඩනැගිලි	273,357,232.17	106,711,156.94			463,448.77	379,604,940,34
මෝටර් රථ	69,425,776.22	2,283,910.00	24,236,118.22	24,236,119.22	3,000.00	71,706,685.22
ව්‍යාපෘති මෝටර් රථය	17,950,685.00	-			-	17,950,685.00
ගෘහ භාණ්ඩ සවි කිරීම් හා කාර්යාල උපකරණ	46,584,102.66	11,358,019.37			281,315.00	57,660,807.03
පරිගණක	28,727,003.31	1,541,680.00			104,500.00	30,164,183.31
යන්ත්‍ර උපකරණ	4,289,459.00					4,289,459.00
මුළු එකතුව	514,241,336.93	121,894,766.31	24,236,118.22	24,236,119.22	852,263.77	635,283,838.47

ක්ෂයවීම්

විස්තරය	2019.01.01 දිනට ක්ෂයවීම්	වර්ෂය සඳහා ක්ෂයවීම්	මාරු කිරීම් (ඇතුළතට)	මාරු කිරීම් (පිටතට)	මාරු කිරීම්/ අපහරණ	සමුච්චිත ක්ෂයවීම්	ලියාහල වටිනාකම
ඉඩම්	-	-			-		73,907,078.57
ගොඩනැගිලි	48,072,490.57	6,230,292.10			-	54,302,782.85	325,302,157.49
මෝටර් රථ	59,334,259.19	5,960,067.77	22,731,763.50	22,731,763.50	3,000.00	65,291,326.78	6,415,358.44
ව්‍යාපෘති මෝටර් රථය	14,033,955.00	800,950.00				14,834,905.00	3,115,780.00
ගෘහ භාණ්ඩ සවි කිරීම් හා කාර්යාල උපකරණ	5,189,437.63	5,535,654.33			246,639.75	10,478,452.21	47,182,354.82
පරිගණක	8,149,896.32	4,695,076.62			104,500.00	12,740,472.94	17,423,710.37
යන්ත්‍රෝපකරණ	1,784,181.92	560,052.38		273,200.62		2,071,033.68	2,218,425.32
මුළු එකතුව	136,564,220.63	23,782,093.20	22,731,763.50	23,004,964.12	354,139.75	159,718,973.46	475,564,865.01

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය
මූල්‍ය ප්‍රකාශනයන්ට අදාළ සටහන්
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

විස්තරය	රුපියල් ශත
සටහන 02	
ආයෝජන -	
ස්ථාවර තැන්පතු - පාරිතෝෂික	15,326,811.61
	15,326,811.61
සටහන 02 A	
අනෙකුත් මූල්‍ය වත්කම්	
අපගමනය කළ පිරිවැය	12,928,542.28
	12,928,542.28
අනෙකුත් ජංගම වත්කම්	
කෙරෙමින් පවතින සිවිල් වැඩ	10,000,000.00
පැළ තොග	14,260,602.63
	24,260,602.63
සටහන 03	
භාණ්ඩ තොග	
ලිපි ද්‍රව්‍ය	4,040,344.81
විවිධ තොග	21,381,646.73
තේ	292,560.00
බෑසමිඩ්/ මෙතම් සෝඩියම්	1,223,554.00
පොලිතින්	2,381,204.64
දියර ඉසින	2,735,684.55
තවාන් උපකරණ	253,450.40
ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘති තොග	7,760,155.87
තරාදි	31,575.00
දළු කඩන කතුර/කූඩ	172,674.14
ආයුධ කට්ටල	10,299,405.62
ටයර් හා ට්‍යුබ්	51,746.00
පුහුණු උපකරණ	108,560.50
මුල්ලු	17,263,799.97
අනෙකුත් තොග	202,794.44
	68,199,156.67

සටහන 04 05	
ලැබීයයුතු ශේෂ	
ණයකරුවන්	32,766,114.26
ණය හා අත්තිකාරම්	98,357,629.33
තැන්පතු හා අත්තිකාරම්	808,701.84
අනෙකුත් ශේෂ	13,919,171.46
	145,851,616.89
අඩු කළා :බොල් ණය සඳහා වෙන්කිරීම්	-22,572,101.64
	123,279,515.25
සටහන 06	
පෙර ගෙවීම්	1,292,877.60
සටහන 07	
මාර්ගස්ථ මුදල්	335,066.64
අතැති මුදල් හා බැංකුවේ ඇති මුදල්	34,691,465.23
තැන්පතු	84,858,661.10
මුළු එකතුව	119,885,192.97
සටහන 08	
ගෙවීයයුතු ශේෂ	
ණය හිමියන්	89,851,594,75
තැන්පතු ගෙවීයයුතු	14,754,663.16
අනෙකුත් වෙන්කිරීම්	3,993,694.24
අනෙකුත් ශේෂ	109,924,007.94
මුළු එකතුව	218,523,960.09
සටහන 09	
උපචිත වියදම්	
වාර්ෂික චාරිකාව	34,000.00
සේ.අ.අ. හා සේ.නි.හා.අ.	7,065,635.61
විදුලිය	176,439.72
පරිගණක නඩත්තුව	24,806.00
වරිපනම් හා බදු	1,091,249,03
ඉන්ධන	994,670.08
නිවාඩු දින ගෙවීම්	30,548.64
වෛද්‍ය ප්‍රතිකාර	925,605,81
යතුරු පැදි නඩත්තුව	180,750.00
පුවත්පත්	15,400.00
සුභසාධන	20,400.00
කාර්යාල උපකරණ නඩත්තුව	219,690.60

අතිකාල	355,705.65
තැපැල් ගාස්තු	21,769.33
කුලි ගෙවීම්	357,550.48
වැටුප්/ වේතන	2,697,941.50
ආරක්ෂක වියදම්	1,699,415.11
උපයන විට බදු	22,407.01
පුවත්පත් දැන්වීම්	1,920.00
ගොඩනැගිලි පිරිසිදු කිරීම්/නඩත්තුව	85,927.22
නොමිලේ දෙන තේ සදහා ගෙවීම්	17,322,90
දුරකතන	426,560.89
දැන්වීම්	352,083.79
ප්‍රවාහන ගාස්තු	10,600.00
ගමනාගමන හා සංයුක්ත දිමනා	723,519.30
විදේශ වියදම්	317,231.76
නීති කටයුතු	498,925.00
අධ්‍යක්ෂක මණ්ඩල පරිපාලන ගාස්තු	132,600.00
විගණන ගාස්තු	3,460,350.00
නිල ඇදුම් හා බූට් සපත්තු	69,995.00
ලිපි ද්‍රව්‍ය	197,287.84
රක්ෂණය	199,785.00
ජලය	32,320.45
අනෙකුත් වියදම්	4,450.00
වාහන නඩත්තුව	1,332,151.63
මුද්දර ගාස්තු	58,133.00
නැවත වගා සහනාධාරය	118,629,685.26
නව වගා සහනාධාරය	55,162,448.50
භෝග පුනරුත්ථාපනය	126,592,377.00
ව්‍යාප්ති වැඩසටහන	1,229,407.08
මෙහෙයුම් ලිසිං	568,966.25
ඩොලමයිට් සහනාධාරය	130,060.00
විවිධ වියදම්	17,962.50
පැළ තවාන් හා මව් ශාක	343,961.55
වෙනත්	1,276,478.95
	327,806,495.44
සටහන 10	
සේවක වරප්‍රසාද (පාරිතෝෂික)	**183,962,945.51**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. පීඑල්ඒ/බී/ටීඑස්එච්ඩීඒ/ 01/19/08
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2020 ඔක්තෝබර් 15 දින

සභාපති,

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

යථෝක්ත වාර්තාව මේ සමඟ එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

පිටපත :- 01.ලේකම් , වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යාංශය
02. ලේකම්, මුදල් ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. පීඑල්ඒ/බී/ටීඑස්එච්ඩීඒ/ 01/19/08 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2020 ඔක්තෝබර් 15 දින

සභාපති,

කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව.

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

කුඩා තේ වතු සංවර්ධන අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 නත්ත්වාගණනය කළ මානය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 02 අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය පිළියෙල කිරීමේදී ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දැක්විය යුතු රු.58,090,138 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබූ අතර වෙනත් ආදායම් යටතේ දක්වා තිබූ රු.273,201 ක් වූ යන්ත්‍ර සූත්‍ර ක්ෂය අධි වෙන්කිරීම් බදු පෙර ලාභයට ගළපා නොතිබුණි. තවද කාර්යාල උපකරණ අපහරණයෙන් ලද රු.272,461 ක් වැඩියෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ආ) අධිකාරිය විසින් සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද නමුත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පවතින පිරිවැය රු.36,839,950 ක් වූ වාහනවල ඵලදායී ජීව කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 3 ප්‍රකාරව නැවත සමාලෝචනය කර නොතිබුණු අතර මෙම වත්කම් පිළිබඳව රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 07 ප්‍රකාරව මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කරද නොතිබුණි.

(ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07 හි 49 ඡේදය අනුව දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් ප්‍රත්‍යාගණනය කරන විටක එම වත්කම අයත්වන දේපළ, පිරියත හා උපකරණ පන්තියම මුළුමනින්ම ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් ගාල්ල ප්‍රාදේශිය කාර්යාලයේ සියලුම ලිඛිත සවිකිරීම් හා කාර්යාල උපකරණ පමණක් ප්‍රත්‍යාගණනය කර තිබුණද ප්‍රධාන කාර්යාලයේ හා අනෙකුත් ප්‍රාදේශිය කාර්යාලවල එම වත්කම් පන්තිය සම්පූර්ණයෙන්ම ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. එසේම ප්‍රමිතයේ 47 ඡේදය අනුව දේපළ, පිරියත හා උපකරණ අයිතමයක් සෑම වර්ෂ තුනකට හෝ පහකට වරක් ප්‍රත්‍යාගණනය කළයුතු වුවත් රු.38,815,350 ක වටිනාකමකට මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ඉඩම් අධිකාරිය විසින් 2005 දෙසැම්බර් 31 දිනෙන් පසුව ප්‍රත්‍යාගණනය කර නොතිබුණි. එම නිසා මෙම ඉඩම් වල සාධාරණ අගය මූල්‍ය ප්‍රකාශනවලින් නිරූපනය නොවන බව නිරීක්ෂණය විය.

සමාලෝචිත වර්ෂයේ රු.4,807,865 ක් වූ පොලි ආදායම මත ගෙවියයුතු රු.1,346,202 ක ආදායම් බදු වගකීම් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ) කුඩා තේ වතු සංවර්ධන සමිති සඳහා 1998 වර්ෂයේදී ණය පදනම යටතේ ලබා දී තිබූ වාහන ණය වෙනුවෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.6,664,321 ක් එම සමිතිවලින් ලැබිය යුතු ප්‍රතිව්‍යුහගත වාහන ණය ලෙස ගිණුම්ගත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂයේදී එම ණය ශේෂයට අයත් වාහනවලින් වාහන 23 ක් අධිකාරියට පවරාගෙන විකිණීමෙන් ලද රු.9,823,577 ක මුදලින්

NAOSL

රු.9,207,958 ක් ගෙවිය යුතු තැන්පත් ලෙස ගිණුම් ගත කර තිබුණද ඉහත ප්‍රතිව්‍යුහගත ණය ශේෂයට අදාළ නිරවුල් කළ යුතු මුදල හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේ ගාල්ල ප්‍රාදේශිය කාර්යාලයට අයත් වලහන්දුව පැළ තවාන සඳහා ගෙවා තිබුණු ඉදිරියට කළ ගෙවීම් රු.1,056,844 ක් ඉදිරියට කළ ගෙවීම් ලෙස ගිණුම්ගත කරනු වෙනුවට එම වියදම් පැළ තවානෙහි සමාලෝචිත වර්ෂයේ අවසානයට පැවති අවසන් තොග වටිනාකමට එකතුකර තිබුණි. මෙම නිසා එහි අවසන් තොගයේ වටිනාකම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(උ) ගාල්ල ප්‍රාදේශිය කාර්යාලය නවීකරණය කිරීම සඳහා 2019 දෙසැම්බර් 31 දින රු.8,096,120 ක් වූ කොන්ත්‍රාත්තුව ගාල්ල පිටිගල ප්‍රදේශයේ පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙකු වෙත පිරිනමා තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී මෙම කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ කර නොතිබුණි. එසේ වුවත් මෙම කොන්ත්‍රාත්තුවට අදාලව වූ රු.10,000,000 ක මුදලක් සමාලෝචිත වර්ෂයේ කෙරිගෙන යන වැඩ ලෙස වෙනත් මූල්‍ය චක්කම් යටතේ ගිණුම්ගත කර එම වටිනාකමින් ණයගිම් ගිණුම-ඇරකර තිබුණි. මෙම නිසා සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු කෙරිගෙන යන වැඩ සහ ණයගිම්යෝ එම ප්‍රමාණවලින් වැඩියෙන් දැක්වුණි.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට භෞතික තොග සත්‍යාපනය අනුව පිරිවැය රු. 6,454,098 ක් වූ ප්‍රධාන කාර්යාලයට අයත් තොග ශේෂයන් භෞතිකව නොපවතින බව අනාවරණය කරගෙන තිබුණද ඒ සඳහා අවශ්‍ය ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය තුලදී ඇණවුම් කර තිබුණු රු.5,723,641ක භාණ්ඩ තොගයක් එම භාණ්ඩ ලැබීමට පෙර විවිධ තොග ගිණුමට හර කර තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට විවිධ තොග ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්වුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට රු.14,260,603 ක් වූ පැළ තවාන් තොගය මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම වත්කම් යටතේ දැක්විය යුතු වුවද එය වෙනත් මූල්‍ය වත්කමක් ලෙස දක්වා තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේ රු.73,907,078 ක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දක්වා තිබූ ඉඩම් වටිනාකම තුළ, අධිකාරියට අයිතිය පවරා නොගත් රජය, ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව, මහවැලි අධිකාරිය වැනි ආයතනවලට හිමි රු.35,091,728 ක් වූ ඉඩම්ද ඇතුළත් කර තිබුණු නමුත් මෙම ඉඩම් පිළිබඳ මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඕ) ප්‍රාදේශිය කාර්යාලවලට අදාලව මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම් ශේෂයන් 5කට අදාල වටිනාකම හා ප්‍රාදේශිය කාර්යාලවල පවත්වා තිබුණු ඊට අනුරූපී ගිණුම් වාර්තා අනුව වූ වටිනාකම් අතර රු.1,460,283 ක වෙනසක් නිරීක්ෂණය වුවද එම වෙනස්කම හඳුනාගෙන ගිණුම්වල ගැලපීමට කටයුතු කර නොතිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම් වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය අධිකාරිය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම්, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

NAOSL

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මහහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අධිකාරියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙලිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අධිකාරියේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය නිරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කල අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2 වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණුවලින් වන බලපෑම හැර, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා අධිකාරිය පවත්වාගෙන ගොස් තිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මේ වාර්තාවේ 1.2 (ආ), (ඇ) නිරීක්ෂණ හැර ඉකුත් වර්ෂයේදී මා

විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවිය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට මණ්ඩලය සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාළ ලිඛිත නීතියකට හෝ අධිකාරියේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල වන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති /විධානයට යොමුව	විස්තරය
(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මූ.රෙ.681	විධි විධාන ප්‍රකාරව ගුවන් විදුලිය සහ රූපවාහිනිය මගින් ප්‍රචාරණය කිරීම අත්‍යවශ්‍යයයි සැලකෙන අවස්ථාවලදී අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමෙන් පසු ප්‍රචාරණ කටයුතු කළ යුතු වුවද එලෙස පූර්ව අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී රූපවාහිනිය මගින් ප්‍රචාරණ කටයුතු සඳහා රු.2,194,091 ක් වැයකර කර නිබුණි.
(ii) මූ.රෙ.682	දේශපාලනයෙහි නිරත පුද්ගලයන් සහ දේශපාලන පක්ෂ හුවා දැක්වෙන ප්‍රවෘත්ති පත්‍ර අතිරේක හා දැන්වීම් පළකිරීම තහනම් වුවත් රු.3,583,162 ක් වැයකර දේශපාලනඥයින් සහ දේශපාලන පක්ෂ හුවා දැක්වෙන දැන්වීම්

පලකර තිබුණි.

(ආ) අංක 2018/01 හා 2018 මාර්තු 19 දිනැති මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ චක්‍රලේඛය	අධිකාරිය විසින් තේ ශක්ති අරමුදලෙන් අත්පත් කරගෙන තිබූ සම්පති වාහන අපහරණයෙන් 2018 හා 2019 වර්ෂයන්හි ලද රු. 9,872,227 ක් ඒකාබද්ධ අරමුදලට බැර කිරීමට කටයුතු නොකර අධිකාරියේ රඳවාගෙන තිබුණි.
(ඇ) 1987 අංක 03 දරන පොදු කොන්ත්‍රාත් පනතේ 8 හා 12 වගන්ති	පොදු කොන්ත්‍රාත් රෙජිස්ට්‍රාර්වරයා යටතේ වලංගු ලියාපදිංචි කිරීමේ සහතිකයක් නොමැති ටෙන්ඩර්කරුවන් සමඟ ප්‍රසම්පාදන හා ඇගයීම් කමිටුවල නිලධාරීන් කටයුතු නොකලයුතු නමුත් ගිවිසුම්ගත වටිනාකම රු.11,213,888 ක් වූ වික්‍රමනායක ජාතික පුහුණු මධ්‍යස්ථානයේ මාර්ගය දෙපස පැති බැම්ම ඉදිකිරීම හා රු.7,682,375 ක්වූ ප්‍රධාන කාර්යාලයේ ඇළුමිනියම් දොර ජනෙල් යෙදීමේ කොන්ත්‍රාත්තු සම්බන්ධයෙන් ඒ අනුව කටයුතු කර නොතිබුණි.
(ඈ) අංක පීඊඩී/12 හා 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය හා 1971 අංක 38 දරන මුදල් පනතේ 11 වගන්තිය	2019 දෙසැම්බර් 31 දිනට අධිකාරිය විසින් රු.100,185,473 ක් ස්ථාවර හා කෙටිකාලීන තැන්පතුවල ආයෝජනය කර තිබූ නමුත් ඒ සඳහා අදාළ අමාත්‍යවරයාගේ හා මුදල් අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව අධිකාරියේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර අධිකාරියේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නිතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

තේ පර්යේෂණ ආයතනයේ නිර්දේශ අනුව තේ ඉඩම්වල භාවිතය සඳහා වඩාත්ම යෝග්‍ය මුල්ලුව වන්නේ තලය හා මිට එකම ලෝහ අච්චුවක දමා එකට සාදාගත් මුල්ලුවක් වුවද ලංසු කැඳවීමේදී එම පිරිවිතරයෙන් බැහැරව සමාලෝචිත වර්ෂයේ රු. 27,145,150 ක් වැය කර යකඩ මිට සහ තලය ලෝහ පෑස්සීමෙන් නිපදවනු ලැබූ මුල්ලු 9,450 ක් ප්‍රසම්පාදනය කර තිබුණි.ඒ අනුව තේ නොවියාට තේ කර්මාන්තය සඳහා භාවිතා කළ හැකි වඩාත්ම යෝග්‍ය මුල්ලුව මිලදී ගැනීමට අධිකාරියට නොහැකි වී තිබුණි. මෙම නිසා ඵලදායීතාවය සැලකිල්ලට ගෙන කටයුතු කර නොතිබූ බව නිරීක්ෂණය විය. එසේම මෙකී මිලට ගැනීම සඳහා පත්කර තිබුණු තාක්ෂණික ඇගයීම් කමිටුවට රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.4 (ඇ) වගන්තිය ප්‍රකාරව විෂය පිළිබඳ විශේෂඥයෙකු පත් කරද නොතිබුණි. සමාලෝචිත වර්ෂයේදී කෘෂි උපකරණ බෙදා හැරීමේ වැඩසටහන යටතේ ඉහත මිලටගත් මුල්ලුද ඇතුලුව තේ ගොවියන් සඳහා බෙදා හැරීමට මුල්ලු 12,235 ක් පැවතියද සමාලෝචිත වර්ෂය තුළ මුල්ලු 596 ක් පමණක් බෙදා දී තිබුණි. එමනිසා වර්ෂය අවසානයට රු. 32,095,016 ක් වටිනා මුල්ලු අපේක්ෂිත අරමුණු සඳහා යොදා ගැනීමෙන් තොරව ප්‍රාදේශීය කාර්යාලයන්හි නිෂ්කාර්යව ගබඩා කර තිබුණු බව නිරීක්ෂණය විය.

3. අනෙකුත් විගණන නිරීක්ෂණ

(අ) තේ නැවත වගා සහනාධාරය අදියර 05 කින් ගෙවීමට සැලසුම් කර තිබුණි. 2012 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා මෙකී අදියර 05 න් පළමු අදියර තුන සඳහා රු.918,115,761 ක මුදලක් ලබාගෙන තිබුණු ගොවීන් ඉතිරි සහනාධාර මුදල් ලබාගැනීමට හා තේ නැවත වගා කිරීමට කටයුතු කර නොතිබුණි. මේ අනුව පසුගිය වර්ෂ 5 ක කාලය තුළ ලබාදී තිබුණු තේ නැවත වගා කිරීමේ සහනාධාර මුදලින් සියයට 50 ක් පමණ අපේක්ෂිත අරමුණට යොදවා නොමැති බව නිරීක්ෂණය විය. එසේ වුවත් මෙකී සහනාධාරලාභීන් නැවත තේ වගාවට යොමුකරවා ගැනීමට හෝ එම මුදල් නැවත අයකර ගැනීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි.

(ආ) අංක 1701/1 හා 2011 අප්‍රේල් 11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශේෂ) මඟින් වැවිලි කර්මාන්ත අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග අනුව පාළු පැළ සැපයීමේ වැඩසටහන යටතේ එක් තේ පැළයක් සඳහා ලබාදෙන සහනාධාර මුදල එක් පැළයකට රු.25 ක් විය යුතු බවට නියම කර තිබුණි. එසේ වුවද, මෙකී ගෙවිය යුතු මුදල විධිමත් පරිදි සංශෝධනය කිරීමට කටයුතු නොකර සමාලෝචිත වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩල තීරණයකට අනුව එක් පැළයකට රු.100 බැගින් රු.138,992,167 ක් සහනාධාර ලෙස ගෙවීම් කර තිබුණි.

(ඇ) භෝග පුනරුත්ථාපන ආධාර ක්‍රමය යටතේ තේ පැළ 2,460,000 ක ප්‍රමාණයක් ලබා ගැනීම සඳහා අධිකාරිය මිල ගණන් කැඳවා තිබුණු අතර මිල ගණන් ඉදිරිපත් කර තිබුණු තවාන් හිමි ආයතන 3 ම ව්‍යාජ ආයතන බව තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් තහවුරු කර ගැනීම හේතුවෙන් එම මිල ගණන් ප්‍රතික්ෂේප කර පාළු පැළ සැපයීම නවතා දමා තිබුණි. එසේ වුවත් සමාලෝචිත වර්ෂයේ අධිකාරිය සතු තේ තවාන් 10 ක තේ පැල 744,881 ක් නොවිකුණා ඉතිරිව පැවතුණද මෙම තවාන් සංවර්ධනය කර ඉහත භෝග පුනරුත්ථාපන වැඩසටහනේ පැල අවශ්‍යතාවය සපුරා ගැනීමට අවධානය යොමුකර නොතිබුණි.

(ඈ) කුඩා තේ වතු සංවර්ධන සමිති ලියාපදිංචි කිරීම, පාලනය කිරීම හා සමිතිවල සාමාජිකයන්ට ආධාර ලබාදීම අධිකාරියේ කාර්යභාරය වන අතර සමාලෝචිත වර්ෂයේ ඒ සඳහා රු. 7,522,098 ක් වැය කර තිබුණි. එසේ වුවත් අධිකාරියේ අධීක්ෂණය යටතේ කුඩා තේ වතු සංවර්ධන සමිති 1,475ක් පැවතියද සමාලෝචිත වර්ෂය අවසානයට සතුටුදායක මට්ටමේ පැවති සමිති සංඛ්‍යාව 270 ක් පමණක් බව තහවුරු කර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයේදී ඉකුත් වර්ෂය සමඟ සැසඳීමේදී සාමාජික ගොවීන් සංඛ්‍යාව 17,462 කින් අඩු වී තිබූ බව නිරීක්ෂණය විය. තවද, ඒ ඒ කොට්ඨාශවල තේ පරීක්ෂක/ව්‍යාජ්ති නිලධාරීන් නොමැති වීම හේතුවෙන් අධිකාරිය යටතේ ලියාපදිංචි වූ සමිති 61ක කාර්යසාධනය ඇගයීම් කර නොතිබුණි.

(ඉ) තේ නිෂ්පාදනය හා ඵලදායීතාවය වැඩිකිරීම සඳහා කුඩා තේ වතු හිමියන්ට ගුණාත්මක පැළ ලබාගැනීමට අධිකාරියේ ලියාපදිංචි වාණිජ තේ තවාන් 870 ක් පැවතියද,තේ පර්යේෂණ නිලධාරීන් විසින් පරීක්ෂා කරන ලද තේ තවාන් ප්‍රමාණය පිළිවෙලින් 18/19 වර්ෂයේදී සියයට 25 ක් පමණක් විය.එමනිසා වාණිජ තේ තවාන් සඳහා පවතින අධීක්ෂණය පහළ මට්ටමක පැවති බව නිරීක්ෂණය විය.

NAOSL

(ඊ) අධිකාරිය ව්‍යාප්ති හා උපදෙස් ප්‍රහුණු වැඩසටහන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ රු.17,313,714 ක් වැය කර තිබූ අතර ඉන් රු.7,104,573 ක් එන්ම් සියයට 41ක් අධිකාරිය විසින් ප්‍රාදේශිය කාර්යාල බලප්‍රදේශයන්හි පවත්වන ලද ක්‍රීඩා උත්සවවල විදුහුත් හා මුද්‍රිත ප්‍රචාරණ කටයුතු සඳහා වැය කර තිබුණි.

(උ) රජය විසින් ක්‍රියාක්මක තේ පොහොර ව්‍යාපෘතිය යටතේ තේ ගොවීන්ට සහනාධාර ගෙවීම සඳහා 2016 වර්ෂයේ අධිකාරියට ලද මුදලින් රු.32,065,870 ක් අපේක්ෂිත කාර්යය සඳහා නොයොදවා සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා රඳවා තබා ගෙන තිබුණි.

(ඌ) 2017 වර්ෂයේ ඇති වූ ගංවතුර ආපදාව හේතුවෙන් ගාල්ල, මාතර, රත්නපුර හා කළුතර ප්‍රාදේශීය කාර්යාල බල ප්‍රදේශයන්ට අදාළව කුඩා තේ ඉඩම් වලට සිදු වූ හානිය වෙනුවෙන් පූර්ණ හා අර්ධ හානි ලෙස සහනාධාර දීමනාවක් ගෙවීමට ලබා දී තිබූ මුදලින් ඉතිරිවූ රු.46,991,673 ක් සමාලෝචිත වර්ෂය අවසානය වනවිටත් භාණ්ඩාගාරයට ප්‍රේෂණය නොකර ගිණුම්වල රඳවාගෙන තිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය අවසානයට පොහොර හා ගංවතුර සහනාධාර ලෙස තේ ගොවීන් සඳහා සෘජු බැංකු හර කිරීම් රු.10,554,689 ක් සහනාධාරලාභී තේ ගොවීන් ඉදිරිපත්කර තිබූ ගිණුම් අක්‍රීයවීම, නම හා ගිණුම් අංකය වෙනස්වීම ආදී කරුණු නිසා හිමිකම් නොපෑ චෙක්පත් ගිණුමට මාරුකර තිබූ අතර ඒවායේ කාලය මාස හය සිට අවුරුදු 5 දක්වා පරාසයක විය.මෙම මුදල් අදාළ සහනාධාර ලාභියාට ගෙවීමට හෝ භාණ්ඩාගාරයට යැවීමට කටයුතු කර නොතිබුණි.

(ඒ) සමාලෝචිත වර්ෂය අවසානයට පවතින රු.20,390,000 ක සත්දින තැන්පත් දින 189 සිට දින 2,584 ක කාල පරාසයක පැවති බව විගණනයේදී නිරීක්ෂණය විය. 2019 දෙසැම්බර් 31 දිනට සත්දින තැන්පතු සඳහා පොලී අනුපාතය සියයට 5.5 පමණක් වීම හේතුවෙන් ස්ථාවර තැන්පත්වල ආයෝජනය නොකිරීම හේතුවෙන් වැඩි පොලී ආදායමක් ලැබීමට අධිකාරියට තිබූ අවස්ථාව අහිමිවී ඇති බව තවදුරටත් නිරීක්ෂණය කෙරේ.

(ඔ) කුඩා තේ වතු සංවර්ධන වැඩ කටයුතු වෙනුවෙන් දිවි නැගුම වැඩසටහන යටතේ නව තේ වගාව හා නැවත වගාව, ගම්මිරිස් වගාව, තේ ඉඩම්වල පාළු සිටුවීම් යන සංවර්ධන කාර්යයන් සඳහා ලද රු.3,196,085 ක් 2016 වර්ෂයේ සිට අදාළ කාර්යය සඳහා නොයොදවා සමාලෝචිත වර්ෂය අවසානය දක්වා රඳවාගෙන තිබුණි.

(ඔ) සමාලෝචිත වර්ෂයේදී ලිඛිත හා සම්මුඛ පරීක්ෂණ මත තේ පරීක්ෂක /ව්‍යාජ්ති නිලධාරී තනතුර සඳහා අටදෙනෙකු බඳවා ගෙන තිබූ අතර ඉන්පසුව තවත් 13 දෙනෙකු පොරොන්තු ලේඛනගත කර තිබුණි. අනතුරුව රු. 532,553ක් පොරොන්තු ලේඛනගත නිලධාරීන් පුහුණුව සඳහා වියදම් කර තිබුණද 2019 ජුනි 24 දින එම තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා පුහුණු කරන ලද 13දෙනා බඳවා ගැනීමට නිතිමය ප්‍රතිපාදනයන් නොමැති බැවින් නැවත පුවත්පත් දැන්වීම් පලකර තිබුණි. එමනිසා පොරොන්තු ලේඛනගත අයදුම්කරුවන් පුහුණු කිරීම සඳහා දරන ලද මුදල නීත්‍යානුකූල නොවූ හා අනාර්ථික වියදමක් ලෙස නිරීක්ෂණය කෙරේ.

(ක) අධිකාරිය විසින් තේ පරීක්ෂක /ව්‍යාජ්ති නිලධාරීන් 70 දෙනෙකු වෙත ක්ෂේත්‍ර රාජකාරි කටයුතු සඳහා යතුරුපැදි ලබාදී හිමිකම් කාලය වූ වසර 8 ඉකුත් වීමට පෙර අධිකාරිය විසින් 2014/15 අයවැය යෝජනා යටතේ එම නිලධාරීන් 70 දෙනා වෙත නව යතුරුපැදි ලබා ගැනීම සඳහා සහතිකකර තිබීම නිසා රජයට සිදුවී ඇති අලාභය රු.10,112,300 ක් විය.

(ග) 2017 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා තේ ශක්ති සුභසාධන අරමුදලෙහි සාමාජිකයන් සඳහා රක්ෂණාවරණ ඔප්පු ලබා ගැනීමට පෞද්ගලික රක්ෂණ සමාගමකට අධිකාරිය රු.27,358,214 ක් ගෙවීම් කර තිබුණි. එසේවුවද තේ ශක්ති සුභසාධන අරමුදලෙහි නිමිකරුවන් වෙත ගෙවීම සඳහා 2017 වර්ෂයේ සිට ලද රු.690,525 ක් වාර්තාවේ දින දක්වා ප්‍රතිලාභීන්ට ගෙවීම් කර නොතිබුණි. තවද අභ්‍යන්තර විගණකගේ 2019 නොවැම්බර් 15 දිනැති වාර්තාව අනුව තේ ශක්ති සුභසාධන ප්‍රතිලාභීන්ට රු.8,502,397 ක් ගෙවිය යුතුව තිබූ බව වාර්තා කර තිබුණි. එසේ වුවත් 2020 සැප්තැම්බර් 15 දින වනවිටත් මෙම මුදල් අධිකාරියට ලැබී නොතිබුණි.

(ඝ) අංක 25/2014 හා 2014 නොවැම්බර් 12 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 07 වගන්තිය අනුව පූර්ව අනුමැතිය ලබාගැනීමෙන් තොරව සමාලෝචිත වර්ෂයේදී අනියම්, වෙක්රෝල් හා කොන්ත්‍රාත් පදනම මත අධිකාරිය විසින් සේවකයින් 52 දෙනෙකු බඳවාගෙන තිබුණි. ඉහත බඳවා ගැනීම් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.16,004,184 ක් ගෙවීම් කර තිබුණි.

(ඞ) 1998 වර්ෂයේදී පොහොර ණය යෝජනා ක්‍රමය යටතේ පොහොර, දියර ඉසින යන්ත්‍ර හා තරාදි ලබාගැනීම සඳහා කුඩා තේ වතු සමිති වලට ලබා දී තිබූ ණය මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රු.4,300,942 ක ණය ශේෂය වසර විස්සකට වැඩි කාලයක් සිට පියවා ගැනීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට පියවර ගෙන නොතිබුණි.

ජාතික විගණන
தேசிய கணக்காய்வு
NATIONAL AUDIT
NAOSI

(ද) 1998 වර්ෂයේ තේ කම්හල් සඳහා වර්ණ විභේදන යන්ත්‍ර ලබාදීමේ වැඩ සටහන මගින් ලබාදී තිබූ ණය මුදලින් පෞද්ගලික කම්හල් 4 කින් ලැබිය යුතු රු.5,916,589 ක මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන තෙක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

ඩබ්ලිව්.ජී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

13